International Trade Centre | SheTrades

UK International Development
Partnership | Progress | Prosperity



# මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම

## කෘෂි ආහාර ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකේය කාන්තා-මූලික ව්‍යාපාර සඳහා අත්පොත

In partnership with

EDB
SRI LANKA
EXPORT DEVELOPMENT BOARD

ප්‍රකාශක: ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය

මාතෘකාව: මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම : කෘෂිආහාර ක්ෂේත්‍රයේ නියැලෙන, කාන්තා-මූලික ව්‍යාපාර සඳහා අත්පොත

ප්‍රකාශිත දිනය සහ ස්ථානය: ජිනීවා, 2024 නොවැම්බර් මස

පිටු ගණන: 64

වැඩි විස්තර සඳහා, සම්බන්ධ වන්න: kristy@intracen.org වෙතින් මිෂෙල් ක්‍රිස්ටි

පුළුල් අන්දමින් බෙදා හැරීම සිදු කළ හැකි වීම පිණිස සිය ප්‍රකාශන ප්‍රතිමුද්‍රණය සහ පරිවර්තනය, ITC විසින් දිරිගන්වනු ලබයි. මූලාශ්‍රය වෙත නිසි පිළිගැනීමකින් යුතුව, මෙම ලේඛනයේ කෙටි උපුටන ප්‍රතිනිර්මාණය නිදහස පවතියි. වඩාත් විස්තරාත්මක ප්‍රතිනිර්මාණයක් හෝ පරිවර්තනයක් සම්බන්ධයෙන් අවසර ලබාගැනීම කළ යුතු වේ.

කවරයේ ඇති ඩිජිටල් රූපසටහන (සටහන්) කෘත්‍රිම බුද්ධිය මගින් උත්පාදිතයි.

© ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (ITC)

ITC යනු ලෝක වෙළෙඳ සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ හවුල්කාර නියෝජිතායතනයයි.





# පිළිගැනීම

මෙම ප්‍රකාශනය නිර්මාණය කිරීම සඳහා දායකත්වය දුන් සැමට ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (The International Trade Centre - ITC) සිය කෘතඥතාව පළ කරයි.

ගෞරි ත්‍යාගි (ITC) විසින් මෙම වාර්තාව සකස් කරන ලද්දේ මිෂෙල් ක්‍රිස්ටි සහ මාතංගී හරිහරන් (දෙදෙනාම ITC) යන අයගේ මගපෙන්වුම යටතේ ය.

මෙම වාර්තාව සකස් කිරීමට දායකත්වය ලබා දුන් ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධන මණ්ඩලයට තුති පුද කිරීමට ITC මෙය අවස්ථාවක් කරගනියි.

ITC සහ TradeLab International Economic Law Clinic, ජිනීවා හි Centre for Trade and Integration, ජිනීවා හි Graduate Institute of International and Development Studies අතර සහයෝගීතාව ඇතිව මින් ඉහත සිදු කළ වෙනත් කාර්යයකින් මෙම අත්පොතට යම් සහයක් ලබා ගන්නා ලදී.

මෙම වාර්තාව සංස්කරණය කළ මාර්නි මැක්ඩොනල්ඩ්; සහ පිටු සැකසුම සිදු කළ මැග්ඩලීනා ස්ටැඩ්නික් වෙත ද ITC ස්තුතිවන්ත වේ.

මෙම වාර්තාවට අරමුදල් සපයන ලද්දේ එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය විසිනි.

# මෙම අත්පොත පරිශීලනය කළ යුත්තේ කවුරුන් විසින් ද?

මහා බ්‍රිතාන්‍ය වෙත ඇතැම් නිෂ්පාදන අපනයනය කරන විට, ශ්‍රී ලාංකේය කාන්තා-මූලික කුඩා සහ මධ්‍ය-පරිමාණ ව්‍යවසායයන් (SMEs) විසින් සපුරාලිය යුතු මූලික සහ අදාළ නීතිමය සහ නියාමන අවශ්‍යතාවන් මෙම අත්පොත මගින් පැහැදිලි කෙරෙයි. මෙහි පැහැදිලි කර ඇති නීතිමය සහ නියාමන අවශ්‍යතා අදාළ වන්නේ එංගලන්තයේ, වේල්සයේ සහ ස්කොට්ලන්තයේ වෙළෙඳපොළ වෙත යවනු ලබන නිෂ්පාදන සම්බන්ධයෙන් පමණි. උතුරු අයර්ලන්ත වෙළෙඳපොළ වෙත යවනු ලබන නිෂ්පාදන සඳහා මෙම අත්පොත අදාළ නොවේ.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආහාර වර්ග අපනයනය කිරීමෙහි ලා සපුරාලිය යුතු නියාමන අවශ්‍යතා වෙත මෙම අත්පොත මගින් අවධානය යොමු කර ඇත. විශේෂයෙන්ම, සැබෑ සහ විභවීය (actual or potential) අපනයන මත පදනම්ව මෙම අත්පොතෙන් ආවරණය කරනු ලබන්නේ කුළුබඩු, ඖෂධීය තේ, ඖෂධීය නිෂ්පාදන, විජලනය කළ පලතුරු, සැකසුම් කළ පලතුරු සහ එළවළු, පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වේ.

.

මෙම අත්පොතින් පැහැදිලි කර ඇති බොහෝ නියාමන අවශ්‍යතා, බෙහෙවින් තාක්ෂණික සහ සවිස්තරාත්මක ය. එවැනි අවශ්‍යතා සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් නිසි කටයුතු කරනු ලබන්නේ මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කරනු ලබන්නන් සමග ක්‍රියා කරන වෘත්තීමය අපනයනක-රුවන් ය. මෙම යථා තත්ත්වය පෙන්නුම් කිරීම පිණිස, සැබෑ භෞතික අපනයන වලදී මධ්‍යම හෝ මහා-පරිමාණ ශ්‍රී ලාංකේය අපනයන එකතු කරන්නන් (Sri Lankan export aggregators) යොදා ගනු ඇති බවට මෙම අත්පොත උපකල්පනය කර ඇත. එසේ වුවද, වෘත්තිකයකු යොදා ගැනීමෙන් තොරව, අපනයනය කටයුතු සෘජුව සිදු කිරීමට අදහස් කරන කුඩා-පරිමාණ නිෂ්පාදකය-න් හට ද මෙම අත්පොත පරිශීලනය කළ හැකිය. අපනයන නිෂ්පාදන වලට අදාළ වඩාත් තාක්ෂණික අවශ්‍යතා වෙත ප්‍රවේශ විය හැකි සබැඳි මෙම අත්පොතට අඩංගු කර ඇත්තේ එබැවිනි. මෙම අත්පොතහි එක් එක් පරිච්ඡේදයෙන් පැහැදිලි කර ඇති නියාමන අවශ්‍යතා කියැවිය යුත්තේ එහි සඳහන් කර ඇති අදාළ ඇමුණුම් සමග ය. එක් එක් නියාමන අවශ්‍යතාව එකී ඇමුණුම් මගින් වැඩිදුරටත් පැහැදිලි කර ඇත.

අනාගතයේ දී යොදා ගනු ලැබිය හැකි නව නියාමන අවශ්‍යතා පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම අත්පොත මගින් සපයනු ලබන්නේ එහි ඉදිරි-දැක්ම සැලකිල්ලට ගනිමිනි. ඊට අමතරව, අත්පොත මගින් සාකච්ඡා කෙරෙන නිෂ්පාදන වලට සමාන නියාමන අවශ්‍යතා සහිත නිෂ්පාදන කාණ්ඩ සම්බන්ධයෙන් ද සැඟවුණු විකුණුම් අවස්ථා බොහෝ දුරට පැවතිය හැකිය.

අවසානයේ, අපනයන හා ආනයන අවශ්‍යතා පිළිබඳ තාක්ෂණික නියාමන වලට අමතරව, මහා බ්‍රිතාන්‍යයේ වෙළෙඳපොළ හඳුනා ගැනීම, සීඝ්‍රයෙන් වෙනස් වන පාරිභෝගික කැමැත්ත, නිෂ්පාදන පිළිබඳ තරගකාරී මිලගණන් සහ වත්මන් පාරිභෝගික ඉල්ලුම වැනි අපනයන-ආශ්‍රිත වෙළෙඳ කටයුතු වලදී සැලකිල්ලට ගත යුතු වෙනත් බොහෝ කාරණා ද මෙම අත්පොත පරිශීලනය කරන්නන් හට තිබිය හැකිය. නීතිමය-නොවන වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු එවැනි කාරණා මෙම අත්පොත මගින් සාකච්ඡා නොකෙරෙයි.

මෙහි අඩංගු සියලු තොරතුරු 2024 ඔක්තෝබර් මාසය වනවිට පැවති තොරතුරු වේ. තමන්ගේ අපනයන කටයුතු වලට බලපෑ හැකි නව නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් දැනුවත්ව සිටින මෙන් මෙම අත්පොත කියවන පාඨකයන් වෙතින් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනු ලැබේ.






## සංකේත නාම සහ කෙටි යෙදුම්

අන්‍යාකාරයකින් දක්වා නොමැති නම් මිස, ටොන් යනුවෙන් හැඳින්වෙන සියල්ලෙන්ම හඳුන්වනු ලබන්නේ මෙට්රික් ටොන් වේ.

**ASYCUDA** - රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධති

**BoL** - නෞභාර බිල්පත

**BRCGS** - බ්‍රිතාන්‍ය සුළු-පරිමාණ මූල්‍යායතන සමූහයේ ගෝලීය ප්‍රමිතිය

**CDA** - පොල් සංවර්ධන අධිකාරිය

**CITES** - වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා වෘක්ෂලතා විශේෂ වල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය

**COO** - ප්‍රභවස්ථාන රට

**CusDec** - අපනයන ප්‍රකාශනය

**DCTS** - සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම

**DoC** - වාණිජ දෙපාර්තමේන්තුව

**EDB** - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**EORI** - ආර්ථික මෙහෙයුම්කරුවන්ගේ ලියාපදිංචිය සහ අනන්‍යතාව

**FRC** - වනාන්තර-අවදානමට ලක් කෙරෙන භාණ්ඩ

**FSSC** - ආහාර සුරක්ෂිතතා පද්ධති සහතික කිරීම

**HS** - සමෝධානික පද්ධතිය

**IFS** - ප්‍රමිතිකරණයේ විශේෂ ජාත්‍යන්තර නීති

**Incoterms** - ජාත්‍යන්තර වාණිජ නීතිරීති

**ISO** - ප්‍රමිතිකරණය සඳහා වූ අන්තර්ජාතික සංවිධානය

**ITC** - ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය

**MRL** - උපරිම අවශේෂ මට්ටම

**NOCU** - ජාතික කාබනික පාලන ඒකකය

**NPQS** - ජාතික ශාක නිරෝධායන සේවාව

**ROO** - ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති

**SME** - කුඩා සහ මධ්‍ය-පරිමාණ ව්‍යවසායයන්

**TIN** - බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය

**UKCC** - එක්සත් රාජධානියේ භාණ්ඩ කේතය

**VAT** - අගය එකතු කළ බදු

**VSS** - තිරසර භාවය පිළිබඳ ස්වෙච්ඡා ප්‍රමිති (නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම, ප්‍රවාහනය, සහ සැකසුම තිරසර අයුරින් කළ බව සහතික කෙරෙන නීතිරීති)

### ජාත්‍යන්තර වාණිජ නීතිරීති (ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු වලදී ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ වගකීම් අර්ථදැක්වෙන නීතිරීති සමුච්ඡය) පිළිබඳ කෙටි යෙදුම්

**CIF** - පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහනය

**CIP** - රැගෙන යන්නා සහ වෙත ගෙවූ රක්ෂණය

**CFR** - පිරිවැය සහ ප්‍රවාහනය

**CPT** - වෙත ගෙවූ පිරිවැය

**DAP** - ස්ථානය වෙත භාණ්ඩ බෙදා හරින ලදී

**DDP** - බෙදා හරින ලදී බදු ගෙවන ලදී

**DPU** - බෑමකින් තොරව ස්ථානය වෙත බෙදා හරින ලදී

**EXW** - නැව්ගත කිරීමේ ගනුදෙනුවක දී ගැනුම්කරුගේ සහ විකුණුම්කරුගේ වගකීම් අර්ථදැක්වෙන ජාත්‍යන්තර වාණිජ රීතියකි

**FCA** - දක්වන ලද ස්ථානයක් වෙත භාණ්ඩ බෙදා හැරීම සඳහා විකුණුම්කරුගේ වගකීම් අර්ථදැක්වෙන ජාත්‍යන්තර වෙළෙඳ රීතියක

**FOB** - භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් විකුණුම්කරුගේ වගකීම් සහ අවදානම් අවසන් වන හා මිලදී ගන්නාගේ වගකීම් සහ අවදානම් ආරම්භ වන තැන

# පටුන


**පිළිගැනීම** ..... I

**මෙම අත්පොත පරිශීලනය කළ යුත්තේ කවුරුන් විසින් ද?** ..... 2

**සංකේත නාම සහ කෙටි යෙදුම්** ..... 3

**1 වන පරිච්ඡේදය: අපනයනය සඳහා ව්‍යාපාරය සූදානම් කිරීම** ..... 9

**ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලියාපදිංචිය** ..... 9

1 වන පියවර: ව්‍යාපාර ලියාපදිංචිය ..... 9

2 වන පියවර: බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය ලියාපදිංචිය ..... 10

3 වන පියවර: එකතු කළ අගය මත බදු ලියාපදිංචිය ..... 10

4 වන පියවර: ශ්‍රී ලංකා රේගුව සමග ලියාපදිංචි වීම ..... 10

5 වන පියවර: නිෂ්පාදන-නිශ්චිත ලියාපදිංචි කිරීම් ..... 11

6 වන පියවර: වෙනත් ආයතන සමග ලියාපදිංචි වීම ..... 12

7 වන පියවර: විකුණුම් ගිවිසුම ..... 12

**මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම** ..... 15

8 වන පියවර: කේතීකරණ පද්ධති කේත සහ නිෂ්පාදන වර්ගීකරණය ..... 15

9 වන පියවර: ආහාර අයිතම සඳහා සෞඛ්‍ය සහතික ..... 16

10 වන පියවර: ෆයිටොසැනිටරි සහතික ..... 16

11 වන පියවර: අපනයන බලපත්‍ර ..... 17

12 වන පියවර: අපනයනය සඳහා මූල්‍ය පහසුකම් ..... 18

**සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් රාජධානියේ වෙළෙඳ යෝජනාක්‍රමය** ..... 19

අදාළ රේගු ගාස්තු ..... 20

ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති ..... 20

ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා ..... 21

DCTS යටතේ වරණීය වෙළෙඳ නීතිරීති සඳහා හිමිකම් පෑම ..... 21

**2 වන පරිච්ඡේදය: නිෂ්පාදන සහ නිෂ්පාදන අවශ්‍යතා** ..... 23

**මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කළ භාණ්ඩ සඳහා අදාළ වන ප්‍රමිතීන්** ..... 23

ලේබල් කිරීමේ ප්‍රමිතීන් ..... 23

අලෙවිකරණ ප්‍රමිතීන් ..... 25

අපනයන කිරීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා ..... 26

ආනයන පාලන ..... 27

නිෂ්පාදනයේ තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් ..... 28

වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ශාක හා සතුන්ගෙන් නිෂ්පාදන ..... 29

**3 වන පරිච්ඡේදය: ස්වේච්ඡා තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්** ..... 31

සමාගම් සංග්‍රහය ..... 33





**4 වන පරිච්ඡේදය: රේගු සහ ආශ්‍රිත ක්‍රියාපටිපාටි** ..... 35

රේගු ප්‍රකාශනය ..... 35

රේගු නිෂ්කාශනය සඳහා ලේඛන ..... 36

රේගු නිෂ්කාශනය ..... 37

**5 වන පරිච්ඡේදය ප්‍රවාහන සහ සැපයුම්** ..... 38

නෞභාර බිල්පත ..... 38

ගුවන් මාර්ග බිල්පත ..... 39

රක්ෂණය ..... 39

**ඇමුණුම් I: ශ්‍රී ලාංකික අපනයනකරුවකු වීමට සූදානම් කිරීම** ..... 41

නිෂ්පාදන නිශ්චිත අවසරපත්‍ර ..... 41

විකුණුම් ගිවිසුමක සාම්පල උපුටනයක් ..... 43

ජාත්‍යන්තර වාණිජ කොන්දේසි ..... 44

නිෂ්පාදන වර්ගීකරණය: HS කේත ..... 45

HS කේත සහ UKCC පිළිබඳ දළ විශ්ලේෂණය ..... 45

**සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම** ..... 47

DCTS යටතේ රේගු ගාස්තු ..... 47

ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති ..... 48

**ඇමුණුම් II: ලේබල්කරණ ප්‍රමිතීන්** ..... **49**
පරිභෝජකයන් වෙත ආහාර පිළිබඳ තොරතුරු සැපයීම ..... 49
ආහාර සංයුතිය පිළිබඳ ප්‍රමිතීන් ..... 50
ආහාර ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා ..... 51
කාබනික ආහාර ලේබල්කරණ ප්‍රමිතීන් ..... 51

**ඇමුණුම් III: ස්වේච්ඡා තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්** ..... **52**
**සහතික කිරීම් ලබාගැනීමට ගත යුතු පියවර** ..... 52
පියවර 1: නිවැරදි ප්‍රමිතිය හඳුනා ගන්න ..... 52
පියවර 2: පරතරය විශ්ලේෂණයක් සිදු කරන්න ..... 52
පියවර 3: සහතික කිරීම සඳහා අයදුම් කරන්න ..... 53
පියවර 4: පරීක්ෂා කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඉල්ලීම් ..... 53
පියවර 5: සහතික කිරීම, අධීක්ෂණය සහ අලුත් කිරීම ..... 53
**අදාළ සහතික කිරීම්** ..... 54
ISO 22000 ..... 54
ආහාර සුරක්ෂිතතා පද්ධති සහතික කිරීම් (FSSC) 22000 ..... 54
බ්‍රිතාන්‍ය සුළු-පරිමාණ මූල්‍යායතන සමූහයේ ගෝලීය ප්‍රමිතිය (BRCGS) ..... 55
ෆෙයාට්‍රේඩ් ඉන්ටර්නැෂනල් ..... 55
ජාත්‍යන්තර විශේෂාංග ප්‍රමිතින් (IFS) ..... 55

**ඇමුණුම් IV: රේගු කාර්යපටිපාටි සහ ආශ්‍රිත ලේඛන** ..... **56**
වාණිජ ඉන්වොයිසිය ..... 56
ඇසුරුම් ලැයිස්තුව ..... 57
ප්‍රභවස්ථානය ඔප්පු කිරීම ..... 57
ප්‍රභවස්ථාන ප්‍රකාශනය ..... 58
පෝරම A ..... 59
**ආර්ථික මෙහෙයුම්කරුවන්ගේ ලියාපදිංචිය සහ අනන්‍යතා අංකය** ..... 59
නැව්ගත කිරීමේ සටහන ..... 59
නැව්බඩු යැවීමේ සටහන ..... 59

**ඇමුණුම් V: ප්‍රවාහන සහ සැපයුම්** ..... **60**
නෞහාර බිල්පතක උදාහරණයක් ..... 60
ගුවන් මාර්ග බිල්පතක උදාහරණයක් ..... 61

## FIGURES, TABLES, BOXES

රූපය 1: සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් රාජධානියේ වෙළෙඳ යෝජනාක්‍රමය පිළිබඳ දළ විශ්ලේෂණය ..... 19
A1 රූපය: විකුණුම් ගිවිසුමක සාම්පලයක් ..... 43
A2 රූපය: පෙපර්ස්/කුළුබඩු සම්බන්ධයෙන් UKCCs සඳහා වන පරිච්ඡේද සටහන් ..... 46
A3 රූපය: DCTS රටවල් වර්ගීකරණය කිරීම ..... 47
A4 රූපය: DCTS යටතේ අය කරනු ඇති විවිධ රේගු ගාස්තු ..... 48
A5 රූපය: නෞහාර බිල්පතක සාම්පලයක ..... 60
A6 රූපය: ගුවන් මාර්ග බිල්පතක සාම්පලයක් ..... 61

1 වන වගුව: විකුණුම් ගිවිසුමක අඩංගු ප්‍රධාන නීතිරීති වල සාරාංශය ..... 13
2 වන වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි 2020 පිළිබඳ උදාහරණ ..... 14
A1 වගුව: නිෂ්පාදන නිශ්චිත අවසරපත්‍ර/බලපත්‍ර/සහතිකපත් ..... 41
A2 වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි පිළිබඳ සාරාංශය ..... 44
A3 වගුව: HS Code සහ UKCC අනුව, පෙපර්ස් (pepper) සම්බන්ධයෙන් වන නිෂ්පාදන වර්ගීකරණය ..... 45
A4 වගුව: මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිෂ්පාදන වල UKCCs දක්වන ලැයිස්තුව ..... 46

1 වන කොටුව: ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය අතිරේක ලේඛන ..... 9
2 වන කොටුව: අපනයනකරුවකු ලෙස ලියාපදිංචිය සඳහා ලේඛන ..... 10
3 වන කොටුව: ASYCUDA යනු කුමක්ද? ..... 11
4 වන කොටුව: කාබනික තේ/නිෂ්පාදන සඳහා ලියාපදිංචි වීම ..... 15
5 වන කොටුව: නිෂ්පාදන වර්ගීකරණය පිළිබඳ උදාහරණයක් ..... 15
6 වන කොටුව: ප්‍රභවස්ථාන රට පිළිබඳ සහතිකය ..... 25
7 වන කොටුව: ඖෂධීය පැළෑටි සහ කුළුබඩු සඳහා ප්‍රමිතීන් ..... 25
8 වන කොටුව: වනාන්තර අවදානම සහිත පාරිභෝගික භාණ්ඩයක් යනු කුමක්ද? ..... 28
9 වන කොටුව: නිෂ්පාදකයන් විසින් තිරසර අනාගතයක් සඳහා සූදානම් කරන්නේ කෙසේද? ..... 28
10 වන කොටුව: ප්‍රතිපත්තියට අනුව දැනට ක්‍රියාවට නංවනු ලබන CITES පිළිබඳ උදාහරණ ..... 29
11 වන කොටුව: කෝඩෙක්ස් අලිමෙන්ටේරියස් ..... 31
12 වන කොටුව: තිරසර භාවය පිළිබඳ සැපයුම්කාර සම්පත් ..... 32
13 වන කොටුව: සෘජු වෙළෙඳ ආදානය ..... 36
A1 කොටුව: ප්‍රභවස්ථාන රට සහ ගබඩා කිරීමේ තොරතුරු ..... 49
A2 කොටුව: අඩංගු ද්‍රව්‍ය ලැයිස්තුව ..... 50
A3 කොටුව: ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති වලට අනුකූල බව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන ..... 57
A4 කොටුව: ප්‍රභවස්ථාන ප්‍රකාශනය සැකසීමේ කොන්දේසි ..... 58
A5 කොටුව: ප්‍රභවස්ථාන ප්‍රකාශන වචන ..... 58



© Freepik.com

# 01 1 වන පරිච්ඡේදය: අපනයනය සඳහා ව්‍යාපාරය සූදානම් කිරීම

## ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ලියාපදිංචිය

### 1 වන පියවර: ව්‍යාපාර ලියාපදිංචිය

මෙම ක්‍රියාවලියෙහි පළමු පියවර වන්නේ ව්‍යාපාර නාමය සහ එහි ස්වාභාවය තෝරාගැනීමයි. තනි පුද්ගල ව්‍යාපාරය, හවුල් ව්‍යාපාරය හෝ සමාගම යන ඒවා අතරින් එකක් ඔබට තෝරාගත හැකියි. ඒ ඒ ව්‍යාපාර ස්වාභාවයට අදාළ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලි අනුගමනය කළ යුතු වේ. සමාගමක් ලියාපදිංචි කිරීමට, ඊඍඳජ ද්වාරය භාවිතයෙන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත ලේඛන ඉදිරිපත් කර, විශේෂිත අනන්‍යතා අංකයක් සහ සංස්ථාපනය කිරීමේ සහතිකය ලබාගත යුතු ය. ක්‍රියාවලිය සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු ලබාගැනීමට මෙම මගපෙන්වුම වෙත යොමු වන්න.

තනි පුද්ගල ව්‍යාපාර සම්බන්ධයෙන් වනවිට, ව්‍යාපාරය පිහිටුවනු ලබන සහ ලියාපදිංචි කරනු ලබන ස්ථානය අයත් වන ප්‍රදේශයේ පළාත් සභාව/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් අදාළ පෝරම ලබා ගන්න. අයදුම්පත් වල දක්වා ඇති සියලුම අවශ්‍ය ලේඛන, ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ඉදිරිපත් කර, තනි පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාගන්න.

ඔබේ ව්‍යාපාරය සඳහා වන නිවැරදි ව්‍යාපාරික ව්‍යුහය (නීත්‍යානුකූලව ව්‍යාපාරය සංවිධානය කර පාලනය කරන අයුරු) හඳුනා ගැනීමට නීතිඥ සහය පැතීම සුදුසු බවට නිර්දේශ කෙරෙයි. ඔබේ ව්‍යාපාර නාමය සහ එහි ව්‍යුහය තෝරා ගැනීමෙන් පසු, ගැළපෙන ව්‍යාපාර කාර්යාලයක් හෝ කර්මාන්තශාලා භූමියක් (අදාළ නම්) හඳුනාගෙන, කුලී ගිවිසුමක් අත්සන් කරන්න. ව්‍යාපාරයේ නමට ගිණුමක් විවෘත කරන්න. එක් හෝ ඊට වැඩි ගණනක සේවකයින් සිටින සියලුම ශ්‍රී ලාංකික ව්‍යාපාර කම්කරු දෙපාර්තමේන්තුවේ හි ද ලියාපදිංචි විය යුතු වේ.

### 1 වන කොටුව: ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය අතිරේක ලේඛන

සිදු කිරීමට අදහස් කරන ව්‍යාපාරික කටයුතු වලට අනුව, නිෂ්පාදකයන් විසින් සිය ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ දී, අතිරේක ලේඛන ඉදිරිපත් කළ යුතු විය හැකියි. උදාහරණ වශයෙන්, ආහාර-ආශ්‍රිත ව්‍යාපාරයක්, තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙසට ලියාපදිංචි කිරීමට, පළාත් සභාව/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය කරන ලේඛන වලට අමතරව, ප්‍රාදේශීය ලේකම්වරයා වෙත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් නිකුත් කළ නිර්දේශ කිරීමේ ලිපියක් ලබාගැනීම ද නිෂ්පාදකයන් විසින් කළ යුතු වේ. එම ලිපිය නිෂ්පාදකයා විසින් සිය ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අයදුම්පතට එක් කළ යුතු වේ. ළඟම පිහිටි පළාත් සභාව /ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් අවශ්‍ය සියලු ලේඛන පිළිබඳ තොරතුරු ලබාගත හැකිය.

## 2 වන පියවර: බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය ලියාපදිංචිය

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය පිළිබඳ (Tax Identification Number - TIN) සහතිකයක් ලබාගැනීමට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙතින් අයදුම් කරන්න. ඔෂභ ලියාපදිංචියට අදාළ සියලුම තොරතුරු සඳහා මෙතැන බලන්න. දෙපාර්තමේන්තුවේ ද්වාරය හරහා අයදුම්පත බාගත කළ හැකිය. දෙපාර්තමේන්තුවේ e-සේවාවන්. භාවිතයෙන්, ඔන්ලයින් මගින් TIN සහතිකය ලබාගැනීම ද කළ හැකියි. ව්‍යාපාරික ව්‍යුහයට අනුව, ඔෂභ ලියාපදිංචිය ලබාගැනීමේ ක්‍රියාවලිය වෙනස් වේ. පහත දක්වා ඇති ලේඛන ද අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි.

- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය (සංස්ථාගත කිරීමේ සහතිකය)
- ලිපිනය සනාථ කිරීමේ ලේඛනය හෝ බදු ගිවිසුම
- බැංකු ගිණුම් ප්‍රකාශනය හෝ පාස්පොත
- ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත් (හවුල්කරුවන්ගේ ද ඇතුළුව) වල පිටපත්.

## 3 වන පියවර: එකතු කළ අගය මත බදු ලියාපදිංචිය

එකුත කළ අගය මත බද්ද (VAT) සහතිකයක් ලබාගැනීම පිණිස දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි බදු ලියාපදිංචි කිරීමේ අංශයෙන් හෝ දෙපාර්තමේන්තුවේ ළඟම ඇති ප්‍රාදේශීය කාර්යාල වෙතින් හෝ අයදුම් කරන්න. නිෂ්පාදකගේ ඔෂභ භාවිත කර e-සේවාවන් හරහා ඊට ප්‍රවේශ වන්න.

- **අනිවාර්ය ලියාපදිංචිය:** යම් තැනැත්තෙකුගේ තොග සහ සිල්ලර වෙළෙඳාම ද ඇතුළුව, එහෙත් මූල්‍ය සේවා සැපයීම හැර, බදු අයකළ හැකි භාණ්ඩ හා සේවා සැපයුම් වල වටිනාකම, කාර්තුවකට රු. මිලියන 15ක් හෝ වාර්ෂිකව රු. මිලියන 60ක් හෝ ඉක්මවයි නම් පමණක්, නිෂ්පාදකයන් විසින් VAT සහතිකයක් ලබා ගැනීම අවශ්‍ය කෙරෙයි. ඔබේ ව්‍යාපාරය, ලියාපදිංචි කිරීමේ සීමාව සපුරාලන්නේ ද යන වග පිළිබඳ වැඩි විස්තර සඳහා, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ බදු ලියාපදිංචි කිරීමේ අංශය සමග සම්බන්ධ වන්න.
- **ස්වෙච්ඡා ලියාපදිංචිය:** නිෂ්පාදකයන් හට VAT සඳහා ස්වෙච්ඡාවෙන් ලියාපදිංචි විය හැකියි.

VAT ආශ්‍රිත වැඩි විස්තර මෙතැනින් සොයා ගත හැකියි.

## 4 වන පියවර: ශ්‍රී ලංකා රේගුව සමඟ ලියාපදිංචි වීම

අපනයනයකරුවකු ලෙස, ශ්‍රී ලංකා රේගුව සමග ලියාපදිංචි වන්න. රේගු E-ලියාපදිංචි කිරීමේ ද්වාරය. හරහා, ඔන්ලයින් මගින් 'අපනයනකරුවකු ලෙස ලියාපදිංචිය' සිදු කළ හැකියි. ලියාපදිංචි ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා අපනයනකරුවන් උදෙසා වන මෙම පරිශීලක අත්පොත බලන්න. නිෂ්පාදකයන්, රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) වෙත බඳවා ගැනෙනු ඇත.

### 2 වන කොටුව: අපනයනකරුවකු ලෙස ලියාපදිංචිය සඳහා ලේඛන

ලියාපදිංචිය සම්පූර්ණ කිරීමට, පහත ලේඛන උඩුගත කිරීම අවශ්‍ය වේ:

- සියලුම අධ්‍යක්ෂවරුන්ගේ/හවුල්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත් /වලංගු විදේශ ගමන් බලපත් වල පිටපත්.
- VAT සහතිකය
- TIN සහතිකය
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය (සංස්ථාගත කිරීමේ සහතිකය)
- ලිපිනය සනාථ කිරීමේ ලේඛනය හෝ බදු ගිවිසුම

### 3 වන කොටුව: ASYCUDA යනු කුමක්ද?

රේගු දත්ත ලබාගැනීම සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය (Automated Systems for Customs Data - ASYCUDA) යනු විදේශ වෙළෙඳ කාර්යපටිපාටි ආවරණය කෙරෙන රේගු කළමනාකරණ පද්ධතියකි. අපනයනකරුවන් හා ආනයනකරුවන් යන දෙපාර්ශ්වයම එය භාවිත කරයි. ගිණුම්කරණ, මාර්ගස්ථ සහ තාවකාලික දෑ පිළිබඳ ක්‍රියාමාර්ග ද සමග, නැව්බඩු ලේඛන සහ රේගු ප්‍රකාශන එමගින් හසුරුවනු ලබයි. සංඛ්‍යානමය ආර්ථික විශ්ලේෂණ සඳහා යොදා ගත හැකි වෙළෙඳ දත්ත උත්පාදනය කිරීම ද එමගින් සිදු කරයි.



## 5 වන පියවර: නිෂ්පාදන-නිශ්චිත ලියාපදිංචි කිරීම්

තේ (කාබනික/ශාකසාර/ආයුර්වේද) සහ පොල් නිෂ්පාදන යනු ශ්‍රී ලංකාව තුළ නියාමනය කරන ලද ඒවා ය. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙරාතුව, වෙළෙඳ බලපත්‍රයක් හෝ නිශ්චිත ලියාපදිංචියක් ලබා ගන්න. එකී ලියාපදිංචි කිරීම් වාර්ෂිකව අලුත් කළ යුතු වේ. තේ සහ තේ මිශ්‍රණ (<10% ශාකසාර සමග මිශ්‍රිත Camellia sinensis) සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය හි තේ අපනයන අංශය සමග ලියාපදිංචි වන්න. ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට, අවශ්‍ය තොරතුරු ලබා දී, ලියාපදිංචි ගාස්තුව ගෙවන්න. නිෂ්පාදනය ගබඩා කිරීම සම්බන්ධ ගුදම් ලියාපදිංචිය (warehouse registration) යනු අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වීමට පෙර සපුරාලිය යුතු අවශ්‍යතාවක් බව අපනයනකරුවන් විසින් සැලකිල්ලට ගත යුතු වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය පිළිබඳ දැන ගැනීමට මෙම මගපෙන්වුම බලන්න. ඊට අමතරව, ශාකසාර පාන අපනයනකරුවන්, ආයුර්වේද දෙපාර්තමේන්තුව සමග ලියාපදිංචි විය යුතු වේ.

පොල් සහ පොල්-ආශ්‍රිත නිෂ්පාදන සඳහා පොල් සංවර්ධන අධිකාරිය (Coconut Development Authority - CDA) සමග නිෂ්පාදකයකු හෝ අපනයනකරුවකු හෝ වශයෙන් ලියාපදිංචි වන්න. නිෂ්පාදකයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා CDA සමග සෘජුව සම්බන්ධ වී අදාළ ලියාපදිංචි ගාස්තුව ගෙවන්න. අපනයනකරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා CDA හි අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වීමේ ද්වාරය හරහා අයදුම් කරන්න. ඔබ, අපනයනකරුවකු පමණක් නම් සහ, පොල් නිෂ්පාදන සිදු නොකරන්නේ නම්, නිෂ්පාදකයකු වශයෙන් ලියාපදිංචි වීම අවශ්‍ය නැත.

කාබනික තේ හෝ කාබනික පොල් පිටි, කාබනික පලතුරු, කාබනික ඖෂධීය පැළෑටි ආදිය වැනි කාබනික නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අපනයනකරුවන් විසින් අතිරේක ලියාපදිංචි කිරීම් සිදු කළ යුතු වේ. වැඩි විස්තර සඳහා 4 වන කොටුව බලන්න.

### 4 වන කොටුව: කාබනික තේ / නිෂ්පාදන සඳහා ලියාපදිංචි වීම

අපනයන සංවර්ධන මණ්ඩලය (Export Development Board - EDB) හි ජාතික කාබනික පාලන අංශය (National Organic Control Unit - NOCU) සමග ලියාපදිංචි වන්න. ව්‍යාපාරය; සම්බන්ධ වීමේ තොරතුරු; නිෂ්පාදන වල ප්‍රභවය; ආකාරය, ප්‍රභවස්ථානය, වර්ගය සහ සටහන් ආදී නිෂ්පාදන විස්තර සහ සහතිකපත් වල විස්තර ආශ්‍රිත තොරතුරු ඉදිරිපත් කරන්න. අපනයනකරුවකු ලෙසට NOCU සමග ලියාපදිංචි වීම සඳහා, අපනයනකරුවන් විසින්, Control Union Inspection (Pvt) Ltd, Mayacert, IMO Control India, EcoCert-Germany වැනි බලයලත් සහතික කිරීමේ ආයතනයක් වෙතින් හෝ වෙනත් යම් බලයලත් සහතික කිරීමේ ආයතනයක් වෙතින් කාබනික සහතිකයක් ලබාගැනීම අවශ්‍ය කෙරෙයි. කාබනික සහතිකය උඩුගත කර ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන්න. ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය පියවරෙන්-පියවරට අවබෝධ කරගැනීම පිණිස NOCU විසින් දී ඇති මෙම විඩියෝව බලන්න.

**කඩිනම් ඉඟියක්: ආයුර්වේද නිෂ්පාදන සම්බන්ධ වෙළෙඳ කටයුතු සඳහා පූර්ව අලෙවිකරණ බලපත්‍රය**

ඖෂධීය පැළෑටි, ශාකසාර නිෂ්පාදන හෝ ශාකසාර තේ නිෂ්පාදකයන් හට සිය නිෂ්පාදන 'ආයුර්වේද නිෂ්පාදනී යටතට ගැනෙන බව පිරික්සීම පිණිස ආයුර්වේද නිෂ්පාදන නියාමනයේ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය හි 2.2 ඡේදය බැලිය හැකි වේ. ව්‍යාපාරය ආරම්භ කිරීමට අනුමැතිය ලබාගැනීම පිණිස, අයදුම්පත බාගෙන, පිරික්සුම් ලැයිස්තුවෙහි දක්වා ඇති සියලුම ලේඛන සහිත ගොනුව සකස් කරගෙන, අවශ්‍ය නිෂ්පාදන සාම්පල ද සමග ආයුර්වේද දෙපාර්තමේන්තුව හි තාක්ෂණික අංශය වෙත ඉදිරිපත් කරන්න.
අපනයන බලපත්‍රයක් අයදුම් කිරීමට, අයදුම්පත සම්පූර්ණ කර, අවශ්‍ය ලේඛන සමග ආයුර්වේද දෙපාර්තමේන්තුවේ තාක්ෂණික අංශය වෙත ඉදිරිපත් කරන්න. ලියාපදිංචි ක්‍රියාවලිය, පෝරම සහ පිරික්සුම් ලැයිස්තුව පිළිබඳ වැඩි විස්තර සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය බලන්න.

## 6 වන පියවර: වෙනත් ආයතන සමග ලියාපදිංචි වීම (අනිවාර්ය නැත)

අපනයනය සඳහා සූදානම් වන අතරවාරයේ පහත ආයතන සමග ලියාපදිංචි වීමට අපනයනකරුවන් හට වුවමනා විය හැකියි:

- ලංකා වාණිජ මණ්ඩලය : අදාළ අය සමග සම්බන්ධ වීමේ (ජාලකරණ) අවස්ථා, ව්‍යාපාර සහය සේවා, පුහුණු වැඩසටහන් සහ අපනයනකරුවන්ට ප්‍රයෝජනවත් අනෙකුත් සම්පත් ආදිය වෙතින් සාමාජිකයන් හට ප්‍රතිලාභ ලැබිය හැකි වේ. ලංකා වාණිජ මණ්ඩලය හා සම්බන්ධ වීමට, ව්‍යාපාරය ලියාපදිංචි කළ බවට සාක්ෂි සහ සම්පූර්ණ කරන ලද සාමාජික අයදුම්පත ඉදිරිපත් කර, අදාළ සාමාජික ගාස්තුව ගෙවන්න.
- අපනයන සංවර්ධන මණ්ඩලය : නව අපනයන සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමග ස්වෙච්ඡාවෙන් ලියාපදිංචි වීමට අපනයනය-ඉලක්ක කරන කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හට හැකියාව ඇත. එසේම, ධාරිතා ගොඩනැගීම, ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම, වෙළෙඳපොළ වෙත නිරාවරණය, කුසලතා සංවර්ධනය, අපනයනකරුවන් සහ අපනයනකරුවන් වීමේ හැකියාවැති අය වෙත උපදේශකත්ව සහ අපනයන අලෙවිකරණ උපදේශක සේවාවන් ආදිය වෙත ප්‍රවේශ වීමට ද එමගින් හැකියාව ලැබෙයි.
- කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය : අදාළ අය සමග සම්බන්ධ වීමේ (ජාලකරණ) අවස්ථා, වෙළෙඳ ප්‍රදර්ශන සහ පොළවල් සඳහා සහභාගි වීමේ අවස්ථා, පාරිභෝගිකයන් වෙත සහ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කරගැනීම ආදී පුහුණු සැසි වෙත ප්‍රවේශය වෙතින් සාමාජිකයන් හට ප්‍රතිලාභ ලැබිය හැකියි. සාමාජිකයකු වශයෙන්, කාන්තා ව්‍යවසායකයන් හට ෘඝඝඝ බැංකුව සමග ආලෝක ඉතුරුම් ගිණුම් විවෘත කළ හැකියි. ඉහළ-පොලී ඉතුරුම් ගිණුම්, අනුග්‍රහපූර්වක ඩිජිටල් සෞඛ්‍ය විසඳුම්, ණය සම්බන්ධයෙන් වරණීය පොලී අනුපාතික ආදී ප්‍රතිලාභ එකී ගිණුම මගින් පිරිනමනු ලබයි. මණ්ඩලයේ සාමාජිකයකු වීම පිණිස මෙතැනින් අයදුම් කරන්න. සාමාජිකත්ව වර්ග පහක් ඇත. ඔබේ අවශ්‍යතාවන්ට වඩාත්ම ගැළපෙන සාමාජිකත්ව වර්ගය තෝරා ගන්න.
- ලංකා කාන්තා ව්‍යවසායක මණ්ඩලය : ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය කාන්තා ව්‍යවසායකයන් හට පුහුණු වැඩසටහන් කිහිපයක්ම පවත්වනු ලබන මෙම මණ්ඩලය මගින් අදාළ අය සමග සම්බන්ධ වීමේ (ජාලකරණ) අවස්ථාවන් ද ඔවුන්ට සලසා දේ. ඊට අමතරව, මණ්ඩලය සහ වෙනත් රට වල තානාපති කාර්යාල හෝ සංගම් අතර සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන වෙතින් ද සාමාජිකයන් හට ප්‍රතිලාභ ලැබිය හැකිය. යාපනය කාන්තා වාණිජ මණ්ඩලය, කර්මාන්ත සහ කෘෂි ව්‍යාපාර; මධ්‍යම පළාත් කාන්තා සුළු කර්මාන්ත හා වාණිජ මණ්ඩලය; මාතලේ කාන්තා මණ්ඩලය ආදී වශයෙන් වන මණ්ඩලයේ අනෙකුත් සාමාජික සංගම් වෙත ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව ද සාමාජිකයන් වෙත ලැබේ. ලියාපදිංචි වීම සඳහා මෙම සාමාජිකත්ව ලියාපදිංචි කිරීමේ පෝරමය සම්පූර්ණ කර, එහි නිශ්චිතව දක්වා ඇති තොරතුරු ලබාදෙන්න. සාමාජිකයකු බවට පත්වීම පිළිබඳ අතිරේක තොරතුරු මෙතැනින් ලබාගන්න.

**කඩිනම් ඉඟියක්: EDB කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

වාණිජමය වශයෙන් ශක්‍යතා සහිත අවස්ථාවන් හා ලොව පුරා සැපයුම් දාම ඔබේ ව්‍යාපාරය සබැඳි කිරීම පිණිස EDB හි මෙම කාන්තා-මූලික අපනයන වැඩපිළිවෙළෙ හා සම්බන්ධ විය. පුහුණු හරහා ධාරිතා ගොඩනැගීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන්, ව්‍යාපාර සංවර්ධන සේවාවන් වෙත ප්‍රවේශයට සහය දීම් ආදී සේවාවන් රැසක් එමගින් පිරිනමනු ලබයි. EDB කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනට සම්බන්ධ වීමට ඔන්ලයින් මගින් මෙම සබැඳිය හරහා ලියාපදිංචි වන්න.

## 7 වන පියවර: විකුණුම් ගිවිසුම

ගැනුම්කරුවන් ආකර්ශනය කරගැනීමේ දී සහ රඳවා තබාගැනීමේ දී විශ්වාසය මත පදනම් වූ සබඳතාවක් සහ සන්නිවේදනයක් ගොඩනගා ගැනීම අත්‍යවශ්‍ය කාරණාවකි. සවිස්තරාත්මක ගිවිසුමක් මගින් එක් එක් පාර්ශ්වයේ අයිතිවාසිකම් සහ වගකීම්, එවැනි අයිතිවාසිකම් සහ වගකීම් බලසහිත වීම සඳහා වන කොන්දේසි සහ ඒවා කඩකිරීමක දී සිදු වන දෑ ආදිය දක්වා සිටියි. විකුණුම් ගිවිසුම අත්සන් කිරීම දක්වා සිදු කළ සියලු සාකච්ඡාවන් සහ ගිවිසා ගැනීම් ලිඛිතව තබා ගැනීමට සහතික වන්න.

විවිධ සාධක මත පදනම්ව දිගු හෝ කෙටි විකුණුම් ගිවිසුම් වලට අත්සන් තැබීමට පාර්ශ්වයන් විසින් කටයුතු කළ හැකිය. කෙසේ වෙතත්, 1 වන වගුවෙහි සපයා ඇති වගන්ති ඔවුන්ගේ විකුණුම් ගිවිසුම් වල අඩංගු වන බවට නිෂ්පාදකයන් විසින් සහතික විය යුතු වේ.



### 1 වන වගුව: විකුණුම් ගිවිසුමක අඩංගු ප්‍රධාන නීතිරීති වල සාරාංශය

| කොන්දේසිය | පැහැදිලි කිරීම |
|---|---|
| නාමමාත්‍ර ඉන්වොයිසිය | • ඇණවුම පිළිබඳ නීතිරීති තහවුරු කිරීම පිණිස විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත යවනු ලබයි. එකම විකුණුම් ගිවිසුමක් යටතේ බහුවිධ ඉන්වොයිසි නිකුත් කරනු ලැබිය හැකියි.<br>• නිෂ්පාදනයෙහි විස්තරය, ප්‍රමාණය, මිල සහ භාණ්ඩ භාරදීමේ නීතිරීති වැනි තොරතුරු ඇතුළත් වේ.<br>• ගැනුම්කරු වෙතින් ගෙවීම් ඉල්ලා සිටීම සඳහා ද යොදා ගනු ලබයි. |
| ගෙවීම් පිළිබඳ නීතිරීත | • ඉන්වොයිසියක් සඳහා ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් එකඟ වූ කොන්දේසි.<br>• ගෙවීම් නියමිත දිනය, ව්‍යවහාර මුදල් වර්ගය සහ ගෙවීම සිදු කරන ආකාරය සහ හිඟ ගෙවීම් සම්බන්ධයෙන් එකඟ-වූ යම් දඩ මුදල් පිළිබඳව නිශ්චිතව දැක්වේ |
| පූරක කාලය (ක්‍රියාවලියක ආරම්භය සහ අවසානය අතරතුර කාලය) | • ඇණවුම ලබා දුන් වේලාවෙහි සිට නිපදවූ භාණ්ඩ භාරදීම දක්වා ගත වන කාලය මෙයයි. නිෂ්පාදනය, අපනයනකරු සහ නැව්ගත කිරීමේ ක්‍රමවේදය අනුව මෙය වෙනස් වේ.<br>• පූරක කාලය පිළිබඳ එකඟතාව මගින් දෙපාර්ශ්වය අතර විශ්වාසය ගොඩනැගීමේ සහ වෙළෙඳ සබඳතා සුමට වීමේ හැකියාව සැලසේ. |
| ඇණවුම් කළ හැකි අවම ප්‍රමාණය | • අපනයනකරුවකු වෙතින් ගැනුම්කරුවකු ඇණවුම් කළ යුතු අවම ඒකක ප්‍රමාණය.<br>• නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩිදියුණු කරගැනීමට උපකාරී වේ. |
| ලේබල් කිරීම සහ ඇසුරුම් | • ලේබල් කිරීම සහ ඇසුරුම් සම්බන්ධයෙන් නිෂ්පාදකගේ සහ ගැනුම්කරුගේ භූමිකාවන් දැක්වෙයි. උදාහරණ කිහිපයක්:<br>- ලේබල් කිරීම සම්බන්ධයෙන් නියාමන නියෝජිතායතනයෙහි අවශ්‍යතා වලට අනුකූල බව සහතික කිරීම නිෂ්පාදකගේ වගකීම වේ.<br>- ගැනුම්කරු වෙනුවෙන් ලේබල සහ වෙනත් ඇසුරුම් ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි ඇණවුම් කිරීම නිෂ්පාදකගේ වගකීම වේ.<br>- නිෂ්පාදනයෙහි වෙනස්කම් හේතුවෙන් භාවිතයට ගනු නොලබන යම් ලේබල සහ ඇසුරුම් ද්‍රව්‍ය සඳහා ගැනුම්කරු වගකිව යුතු නොවේ. |
| පුද්ගලාරෝපිත සංවර්ධනයන් | • නිශ්චිත නිෂ්පාදන සහ එම නිෂ්පාදන පිළිබඳව ගැනුම්කරුගේ ඉල්ලීම් වලට නිෂ්පාදක සහ දෙපාර්ශ්වයම එකඟ බව පෙන්වීම සඳහා ඒවා විකුණුම් ගිවිසුමට ඇතුළත් කිරීම. |
| භාණ්ඩ භාරදීමේ කොන්දේසි හෝ ජාත්‍යන්තර වාණිජ කොන්දේසි | • 2 වන වගුවෙහි දක්වා ඇති පරිදි, ජාත්‍යන්තර ගනුදෙනු මගින් භාණ්ඩ විකිණීමේ දී, බෙදාහැරීමේ ස්ථානය සහ පිරිවැය සම්බන්ධයෙන් අපනයනකරුවන්ගේ සහ ගැනුම්කරුවන්ගේ වගකීම් නිර්වචනය කෙරෙන, හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වූ නීතිරීති මාලාවකි.<br>• භාර දීමේ ස්ථානය හෝ ගමනාන්තය හැකි තාක් දුරට සවිස්තරාත්මකව නිශ්චිතව දක්වා ඇති බවට පාර්ශ්වයන් විසින් සහතික කළ යුතුය. ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයට අනුව, අනුගමනය කළ යුතු මනා පරිචය වන්නේ, පහත වගන්තිය යොදා ගැනීමයි '[තෝරාගත් ජාත්‍යන්තර වාණිජ කොන්දේසි] [නම් කරන ලද ස්ථානය හෝ ප්‍රදේශය] Incoterms 2020' |

විකුණුම් ගිවිසුමක සාම්පල උපුටනයක් සඳහා ඇමුණුම I බලන්න.

විකුණුම්කරුවකු (Seller - S) සහ ගැනුම්කරුවකු (Buyer - B) අතර විය හැකි අවස්ථාවක් 2 වන වගුව මගින් පෙන්නුම් කෙරෙයි. ඉතිරිය, උදාහරණ සහිතව ඇමුණුම I මගින් සපයා ඇත.

## 2 වන වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි 2020 පිළිබඳ උදාහරණ

| අවිධිමත් | විස්තර | වගකීම් |
|---|---|---|
| **බහුවිධ ප්‍රවාහන ක්‍රම** | | |
| විකුණුම්කරු එකඟ වූ බෙදා හැරීමේ ගබඩාවකින් හෝ එවැනි ස්ථානයකින් ගැනුම්කරුට භාණ්ඩ ලබා ගත හැකි වීම | S ගේ පරිශ්‍රය විය යුතු නොවන, නම් කරන ලද ස්ථානයකට B වෙත භාණ්ඩ භාර දීම S සිදු කරයි. භාණ්ඩ පැටවීම, බෙදා හැරීම සහ ඒ හා ආශ්‍රිත සියලු අවදානම් සහ පිරිවැය සඳහා වගකිව යුතු වන්නේ B ය. | භාර දීම සිදු වන්නේ S ගේ දේශභූමිය තුළ නම්, අපනයන නිෂ්කාශන ලබාගැනීම සහතික කිරීමට S බැඳී නැත. එය B ගේ වගකීමයි. S සහය විය යුත්තේ අදාළ තොරතුරු සහ ලේඛන ලබාගැනීම සඳහා පමණි. |
| නිශ්චිත ස්ථානයකට/ වරායකට භාණ්ඩ භාර දීම. | නම් කරන ලද ගමනාන්තයකට B වෙත භාණ්ඩ භාර දීම S සිදු කරයි. භාණ්ඩ නැතිවීම හෝ ඒවාට හානි සිදුවීම හෝ පිළිබඳව වන B ගේ අවදානම් වලට එරෙහිව රක්ෂණාවරණ මිලදී ගැනීමට S බැඳී නැත. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත. B විසින් පිරිවැය දැරීමට යටත්ව, ලේඛන සහ/හෝ මාර්ගස්ථ සහ/හෝ ආනයන නිෂ්කාශන ලබාගැනීමට S විසින් ඊට සහය විය යුතුය. |
| **මුහුදු සහ අභ්‍යන්තර ගංගා ජලමාර්ග ඔස්සේ ප්‍රවාහනය** | | |
| භාණ්ඩ ප්‍රවාහනයේ දී විකුණුම්කරුගේ වගකීම් සහ අවදානම් අවසන් වන හා මිලදී ගන්නාගේ වගකීම් සහ අවදානම් ආරම්භ වන තැන | B විසින් නම් කරන ලද යාත්‍රාව වෙත, නැව්ගත කිරීමේ වරායේ දී භාණ්ඩ භාර දීම S විසින් සිදු කරයි. නැව තුළට භාණ්ඩ භාර ගත් අවස්ථාවේ සිට භාණ්ඩ සහ සියලු ආශ්‍රිත පිරිවැය සඳහා B වගකිව යුතු වේ. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත. |
| පිරිවැය සහ භාණ්ඩ ප්‍රවාහනය | S විසින් B ගේ භාණ්ඩ, යාත්‍රාව වෙත භාර දීම සිදු කරයි. එම භාණ්ඩ ගමනාන්තය වෙත සැබැවින්ම ළඟා වුවද නොවුවද, S ගේ බැඳීම් එතෙකින් සම්පූර්ණ /අවසන් වූ බවට සැලකේ. භාණ්ඩ නැතිවීම හෝ ඒවාට හානි සිදුවීම හෝ පිළිබඳව වන B ගේ අවදානම් වලට එරෙහිව රක්ෂණාවරණ මිලදී ගැනීමට S බැඳී නැත. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත. B විසින් පිරිවැය දැරීමට යටත්ව, ලේඛන සහ/හෝ මාර්ගස්ථ සහ/හෝ ආනයන නිෂ්කාශන ලබාගැනීමට S විසින් ඊට සහය විය යුතුය. |
| පිරිවැය රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහනය | S විසින් ඊගේ භාණ්ඩ, යාත්‍රාව වෙත භාර දීම සිදු කරයි. එම භාණ්ඩ ගමනාන්තය වෙත සැබැවින්ම ළඟා වුවද නොවුවද, S ගේ බැඳීම් එතෙකින් සම්පූර්ණ /අවසන් වූ බවට සැලකේ. භාණ්ඩ නැතිවීම හෝ ඒවාට හානි සිදුවීම හෝ පිළිබඳව වන B ගේ අවදානම් වලට එරෙහිව රක්ෂණාවරණ මිලදී ගැනීමට S බැඳී ඇත. | අපනයන නිෂ්කාශන ලබාගැනීම සහ ඒ සඳහා ගෙවීම S සිදු කළ යුතු නමුත් ආනයන නිෂ්කාශන හෝ තෙවැනි රටක් හරහා යැවීමට (මාර්ගස්ථ) අදාළ නිෂ්කාශන ලබාගැනීමට S බැඳී නැත. B විසින් පිරිවැය දැරීමට යටත්ව, ලේඛන සහ/හෝ මාර්ගස්ථ සහ/හෝ ආනයන නිෂ්කාශන ලබාගැනීමට S විසින් ඊට සහය විය යුතුය. |



# මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම

## 8 වන පියවර: කේතීකරණ පද්ධති කේත සහ නිෂ්පාදන වර්ගීකරණය

මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීම් වල දී එක් එක් නිෂ්පාදනයට ඉලක්කම් 10ක කේතීකරණ පද්ධති (HS) කේතයක් තිබෙන අතර, එයඑක්සත් රාජධානියේ භණ්ඩ කේත (United Kingdom Commodity Code) (UKCC) මගින් ලබා දී ඇත. අපනයනකරුවන් විසින් නිවැරදි UKCC නිෂ්පාදන කේතය හඳුනාගත යුතු වේ. HS කේත සහ UKCC වර්ගීකරණයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සඳහා වගුව A3, ඇමුණුම I මගින් දී ඇති සවිස්තරාත්මක උදාහරණය බලන්න

කෙසේ වෙතත්, නිෂ්පාදනයෙහි සංකීර්ණ භාවය ඉහළ නැංවෙන විට, අපනයනකරුවන් හට නිෂ්පාදන වර්ගීකරණය කිරීම අසීරු කාර්යයක් වනු ඇත. නැවුම් කුරුඳු (කැබලි හෝ කුඩු නොකළ) විස්තර කරන අයුරු සහ අදාළ විය හැකි නිෂ්පාදන කේතය තෝරා බේරා ගන්නා අයුරු වටහා ගැනීමට, 5 වන කොටුව බලන්න. මෙම අත්පොත මගින් ආවරණය කෙරෙන නිෂ්පාදන සඳහා යොදා ගත හැකි UKCCs පිළිබඳ දළ විශ්ලේෂණයක් සඳහා වගුව A4, ඇමුණුම I බලන්න.

**කඩිනම් ඉඟියක්**

මහරජුගේ ආදායම් සහ රේගු මගින් නිකුත් කළ රේගු ගාස්තු නිවේදන අපනයනකරුවන් හට කියවා බැලිය හැකිය. යම් යම් නිෂ්පාදන වර්ගීකරණය කරන ආකාරය පිළිබඳ නිශ්චිත තොරතුරු මේවායෙහි අඩංගු වේ. උදාහරණ වශයෙන්, වියළි නිෂ්පාදන (එළවළු) සඳහා UKCC රත් පිරියම (heat treatment) පිළිබඳ නිවැරදි පැහැදිලි කිරීමක් Tariff 2022, 26 දරන රේගු ගාස්තු නිවේදනය හි නිශ්චිතව දක්වා ඇත.

### 5 වන කොටුව: නිෂ්පාදන වර්ගීකරණය පිළිබඳ උදාහරණයක්

**නැවුම් කුරුඳු සඳහා නිෂ්පාදන වර්ගීකරණය (කැබලි හෝ කුඩු නොකළ)**
කුරුඳු යනු කුළුබඩුවකි. UKCC තුළ, එය 'කෝපි, තේ, මේට් (maté) සහ කුළුබඩු පරිච්ඡේදය යටතට වැටේ. මෙහිදී සැලකිල්ල ගනු ලබන නිෂ්පාදනය නැවුම් කුරුඳු බැවින්, එය කැබලි හෝ කුඩු නොකළ එකකි. UKCC මගපෙන්වුම විමසා බැලීමෙන් පසු, පහත දැක්වෙන පරිදි එහි කේතය තීරණය කිරීමේ හැකියාව ඇත.

| නිෂ්පාදනය | විස්තරය | විය හැකි කේතය |
|---|---|---|
| නැවුම් කුරුඳු | • කුරුඳු සහ කුරුඳු ගසෙහි මල්<br>• කුඩු හෝ කැබලි නොකළ<br>- කුරුඳු (*Cinnamomum zeylanicum blume*) | 0906.1100.00 |

නිෂ්පාදනයෙහි විස්තරය සැකසීම පිණිස, මෙම අත්පොතෙහි වගුව A3, ඇමුණුම I මගින් ප්‍රශ්න සහිතව ලබා දී ඇති නිෂ්පාදන විස්තර අනුකෘතිය බලන්න. තමන්ගේ නිෂ්පාදනය විස්තර කිරීමට අවශ්‍ය සහය එමගින් නිෂ්පාදකයන් වෙත ලැබෙනු ඇත.

## 9 වන පියවර: ආහාර අයිතම සඳහා සෞඛ්‍ය සහතික

නිෂ්පාදනය, මිනිසුන්ගේ පරිභෝජනයට සුදුසු බවට සහතික වීම අපනයනකරුගේ වගකීම වේ. ඒ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ අධිකාරීන් විසින් අවශ්‍ය කෙරෙන සෞඛ්‍ය හෝ අපනයන සහතික ඉදිරිපත් කිරීමට අපනයනකරු වග බලා ගත යුතු වේ. පොල් සහ පොල්-ආශ්‍රිත නිෂ්පාදන, තේ, සැකසූ කළ හෝ අර්ධ ලෙස සැකසූ කළ ආහාර වැනි, ඉවුම් පිහුම් වලදී රසය එකතු කිරීමට ගන්නා යම් ශාකයක ඇට, කඳ හෝ මුල් වැනි වියළි කොටසක් සහ පිසූ ආහාරයකට එකතු කිරීම පිණිස සෑදූ යමක් (spices and condiments) වැනි ආහාර අයිතම අපනයනය කිරීමට, ආහාර අයිතමය මිනිසුන්ගේ පරිභෝජනයට සුදුසු බවට සහතික කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන පරිපාලන ඒකකය වෙතින් සෞඛ්‍ය/ අපනයන සහතිකයක් ලබාගැනීම පිණිස ඔන්ලයින් මගින් අයදුම් කරන්න. අයදුම්පත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන මෙතැනින් බලන්න. මෙම සහතිකයෙන් තොරව සිදු කරනු ලබන අපනයන වලට, ආනයන ප්‍රතික්ෂේප වීම් වලට මුහුණ පෑමට සිදුවිය හැකියි.

## 10 වන පියවර: ෆයිටොසැනිටරි සහතික

ශ්‍රී ලංකාවේ ෆයිටොසැනිටරි සහතික නිකුත් කරනු ලබන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික ශාක නිරෝධායන සේවය (National Plant Quarantine Service - NPQS) විසිනි. e-phyto පද්ධතිය සමග ලියාපදිංචි වන්න. අපනයනකරුවකු වශයෙන් ලියාපදිංචි වීමෙන් පසු, හුදී වෙතින් ෆයිටොසැනිටරි සහතිකයක් ඉල්ලුම්කර, නැව්බඩු තොගය පිරික්සීම පිණිස දිනයක් සකසා ගන්න. නිෂ්පාදන පරිශ්‍රය, නැව්බඩු තොගය සහ සාම්පල පරීක්ෂා කිරීම සිදු කරනු ලබන්නේ ශාක නිරෝධායන නිලධාරීන් විසිනි. සියලු අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, හුදී විසින් වාර්තාවක් ඉදිරිපත් කර, ෆයිටොසැනිටරි සහතිකයක් නිකුත් කරනු ඇත. වැඩි විස්තර මෙතැනින් ලබාගත හැකියි.


© Shutterstock.com

## 11 වන පියවර: අපනයන බලපත්‍ර

වගකිව යුතු අධිකාරිය වෙතින් නිෂ්පාදන-නිශ්චිත අපනයන අවසරපත්‍ර, බලපත්‍ර හෝ සහතික ලබාගන්න. තේ, පොල් සහ සැකසූ ආහාර නිෂ්පාදන වැනි විවිධ වර්ගයේ නිෂ්පාදන සඳහා ඒවා අපනයනය කිරීමට පෙර ලබාගත යුතු, නිශ්චිත බලපත්‍ර සහ සහතික තිබේ. විවිධ නිෂ්පාදන කාණ්ඩ අපනයනය කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය කෙරෙන නිෂ්පාදන-නිශ්චිත අවසරපත්‍ර සහ සහතික කිරීම් පිළිබඳ ඒකාබද්ධ තොරතුරු ඇමුණුම I වෙතින් සොයා ගත හැකියි.

**කඩිනම් ඉඟියක්**

නිෂ්පාදන-නිශ්චිත අපනයන අවසරපත්‍ර, බලපත්‍ර හෝ සහතික විවිධ දෙපාර්තමේන්තු වලදී විවිධ නාම වලින් හැඳින්වෙන බව සහ, ඒවා මගින් සිදු කෙරෙන්නේ අපනයන අවසරපත්‍රයකින් සිදු කරන එකම කාර්යයන් බව ද අපනයනකරුවන් විසින් සැලකිල්ලට ගත යුතු වේ. අනුකූලතාව සහතික කිරීම පිණිස, අපනයනකරුවන් විසින් සිය නිෂ්පාදන, කුමන නිෂ්පාදන කාණ්ඩය යටතට අයත් වේ ද යන වග පිරික්සීමට සහ, ඔවුන්ගේ අපනයන සඳහා අවශ්‍ය කරන සහතික කිරීම් පිළිබඳව පිරික්සීමට මෙම මගපෙන්වුම යොදාගෙන ගත යුතු වේ.

### 6 වන කොටුව: ප්‍රභවස්ථාන රට පිළිබඳ සහතිකය

කුළුබඩු අපනයනය කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව (Department of Commerce - DoC) විසින් ප්‍රභවස්ථාන රට (Country of Origin COO) පිළිබඳ සහතිකයක් නිකුත් කරනු ලැබේ. ාදක වෙත ඔන්ලයින් මගින් අයදුම් කර, අයදුම්පත සම්පූර්ණ කර පෝරමයෙහි දක්වා ඇති, ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලේඛනය, ඔෂහ, ඪඹ සහතික ආදී වූ ලේඛන සමගින් ඉදිරිපත් කරන්න. මෙම ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසු, අදාළ ලියාපදිංචි ගාස්තුව ගෙවා, ඣධ සහතිකය ලබා ගන්න. අයදුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක මගපෙන්වුම් මෙතැනින් ලබාගත හැකියි. වරණීය ඣධ සහතික නිකුත් කරනු ලබන්නේ DoC විසින් පමණක් බව අපනයනකරුවන් සැලකිල්ලට ගත යුතු වේ. අඩු රේගු ගාස්තු සඳහා හිමිකම් පෑම පිණිස අපනයනකරුවන් හට වරණීය COO සහතික යොදා ගත හැකියි. සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් ජාතීන්ගේ වෙළෙඳ යෝජනාක්‍රමය (United Kingdom's Developing Countries Trading Scheme - DCTS) හි ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස, අපනයනකරුවන් විසින් DoC වෙතින් COO සහතික ලබාගත යුතු වේ. ලංකා වාණිජ මණ්ඩලය වැනි බලයලත් ආයතනයක් වෙතින්, සාමාන්‍ය ඣධ සහතිකයක් ලබාගත හැකි වේ. ඉහත පියවර සමග අනුකූල වීම අනිවාර්ය නොවන බව අපනයනකරුවන් විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකි අතර, ඊට විකල්ප වශයෙන්, අපනයනකරුවන් විසින්ම භාණ්ඩ පිළිබඳ ප්‍රභවස්ථානය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කර, DCTS ප්‍රතිලාභ ලබාගත හැකි වේ. DCTS සඳහා ප්‍රභවස්ථාන ප්‍රකාශනයක් යොදා ගන්නා අයුරු සම්බන්ධයෙන් මෙම මගපෙන්වුම බලන්න. කුරුඳු හැරෙන්නට අනෙකුත් සියලුම කුළුබඩු අපනයනය කිරීමේ කාර්යපටිපාටිය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා මෙම පියවරින්-පියවර මගපෙන්වුම බලන්න.

## 12 වන පියවර: අපනයනය සඳහා මූල්‍ය පහසුකම්

විශේෂයෙන්ම, නිෂ්පාදකයන් / අපනයනකරුවන් හට ගැනුම්කරු වෙතින් වහාම ගෙවීම් නොලැබෙනු ඇති බැවින්, අපනයන ගනුදෙනු වල දී මුදල් ප්‍රවාහය ඉතාමත් වැදගත් වේ. අපනයන ගනුදෙනුවක සම්පූර්ණ කාලවකවානුව තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාව හෝ මුදල් ප්‍රවාහය සහතික කිරීම පිණිස, ශ්‍රී ලාංකේය අපනයනකරුවන් හට අපනයනය සඳහා වන මූල්‍ය පහසුකම් වර්ග දෙකකින් ප්‍රතිලාභ ලැබිය හැකිය:

- පූර්ව-නැව්බඩු තොග සඳහා මූල්‍ය පහසුකම්;
- පශ්චාත්-නැව්බඩු තොග සඳහා මූල්‍ය පහසුකම්

කුඩා සහ මධ්‍ය-පරිමාණ ව්‍යවසායකයන් වෙත අපනයන ණය පහසුකම් සැලසීමට EDB සහය ලබා දේ. ඒ සඳහා සුදුසුකම් ලැබීමට, සනාථ කරන  ලද අපනයන ඇණවුම්, අපනයන ඇණවුම සාර්ථකව සිදු කිරීමට අවශ්‍ය ප්‍රවීණතාව හා යටිතල පහසුකම්, සහ සමාගමෙහි එක් අධ්‍යක්ෂවරයකු වෙතින් පුද්ගලික ඇපයක් අවශ්‍ය වේ.

**කඩිනම් ඉඟියක්: අපනයන මූල්‍යකරණය පිළිබඳ ඔබ සතු විකල්ප දැනගන්න**

වාණිජ බැංකු මගින් අපනයනකරුවන් වෙත මූල්‍ය පහසුකම් පිළිබඳ විකල්ප පිරිනමයි. පූර්ව සහ පශ්චාත් නැව්බඩු තොග සඳහා ලබාගත හැකි විවිධ මූල්‍ය පහසුකම් පිළිබඳ විකල්ප සම්බන්ධයෙන් ඔබේ ගිණුම අයත් බැංකුවෙහි කළමනාකරු සමග සාකච්ඡා කර, ඔබේ සමාගමට වඩාත් ගැළපෙන මූල්‍ය පහසුකම් ක්‍රමවේදය තීරණය කරගන්න. පොලී අනුපාතික, ණය ලබාගැනීමට සුදුසුකම් පිණිස වන ඇපකර අවශ්‍යතාවන්, සහ ණය ආපසු ගෙවීමේ කොන්දේසි විමසා දැන ගැනීමට ද සහතික වන්න.

**කඩිනම් ඉඟියක්: ග්ලෝබල් ට්‍රේඩ් හෙල්ප්ඩෙස්ක් බලන්න**

යම් විශේෂිත නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ඇති ඉල්ලුම අවබෝධ කරගැනීම පිණිස, වෙළෙඳපොළ පර්යේෂණයක් පවත්වන්න. Global Trade Helpdesk යනු, නිෂ්පාදකයින්ට සහ අපනයනකරුවන්ට, නිෂ්පාදනයක් සම්බන්ධයෙන් අපනයනය කිරීමේ හැකියාව, සහ නිවැරදි රේගු ගාස්තු හඳුනා ගැනීම, ඊ-වාණිජ වෙළෙඳපොළ, වෙළෙඳ මූල්‍ය පහසුකම් සලසන්නන් සහ වෙනත් විභවීය හවුල්කරුවන් ආදී මූලික වෙළෙඳපොළ තොරතුරු සොයා ගැනීමට සහ අවබෝධ කර ගැනීමට හැකියාව සලසන මෙවලමකි. ඩිජිටල් ගෙවීම් විකල්ප සහ බුද්ධිමය දේපළ අයිතීන් සඳහා අදාළ බුද්ධිමය දේපළ අයිතීන් පිළිබඳ කාර්යාල වල විස්තර ආදී තොරතුරු ද එමගින් සපයනු ලබයි.



## සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් රාජධානියේ වෙළෙඳ යෝජනාක්‍රමය

DCTS යටතේ, ශ්‍රී ලංකාව යනු, 'වරණීය සත්කාර ලබන' (.Enhanced Preference') රටකි. එයින් අදහස් කෙරෙන්නේ, DCTS යටතේ වන ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව ශ්‍රී ලාංකේය අපනයනකරුවන් හට 0% හෝ 92% සඳහා කිසිදු තීරුබද්දකින් තොර වීමට හෝ සුදුසුකම් ඇති බවයි.අපනයනයකරුවන් හට මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑම පිණිස පියවර සතරක්, DCTS මගපෙන්වුම මගින් පෙන්වා දී ඇත.

### රූපය 1: සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා එක්සත් රාජධානියේ වෙළෙඳ යෝජනාක්‍රමය පිළිබඳ දළ විශ්ලේෂණය



## අදාළ රේගු ගාස්තු

මූලික පියවර වන්නේ, ඔබේ රට මත පදනම්ව, ඔබේ නිෂ්පාදනයට අදාළ රේගු ගාස්තුව තීරණය කිරීමයි. මේ සඳහා, අපනයනකරුවන් විසින්, ඔවුන්ගේ නිෂ්පාදනයෙහි HS කේතය පළමුව හඳුනාගත යුතු වේ. ඔබේ නිෂ්පාදනයෙහි HS කේතය හඳුනාගැනීම පිණිස, ඉහතින් සාකච්ඡා කරන ලද 'පියවර 8: කේතීකරණ පද්ධති කේත සහ නිෂ්පාදන වර්ගීකරණයි' බලන්න. අදාළ රේගු ගාස්තු තීරණය කිරීම පිණිස, අපනයනකරුවන්ට එක්සත් රාජධානියේ ඒකාබද්ධ මාර්ගගත රේගු ගාස්තු මෙවලම වෙතින් කඩිනම් සොයා බැලීමක් සිදු කළ හැකිය. ඉන් පසුව, සිය රටට අදාළ රේගු ගාස්තුව අපනයනකරුවන් විසින් සොයා ගත යුතු වේ. DCTS අවස්ථා දැක ගැනීමේ මෙවලම හරහා එය කළ හැකිය. ඔබේ රට තෝරා ගැනීමට, ඔබේ නිෂ්පාදනය සෙවුමට හා අදාළ රේගු ගාස්තු සහ වෙළෙඳ-ආශ්‍රිත තොරතුරු සොයා ගැනීමට මෙම මෙවලම මගින් ඔබට ඉඩ සලසයි.

## ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති

ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති (සෘධධ) යොදා ගනු ලබන්නේ, වරණීය රේගු ගාස්තු සඳහා සුදුසුකම් ලබන්නේ කුමන රටකින් 'උත්පාදනය කෙරුණ' අපනයන ද යන වග තීරණය කිරීම පිණිසයි. වරණීය රේගු ගාස්තු වෙතින් ප්‍රතිලාභ ලැබීම පිණිස, වෙනත් රටවලින් අමුද්‍රව්‍ය මිල දී ගත්තද, නිෂ්පාදනයෙහි ප්‍රභවස්ථානය 'ශ්‍රී ලාංකික' වන බවට හිමිකම් පෑම සඳහා නිෂ්පාදකයන්/අපනයනකරුවන් හට එසේ වෙනත් රටවලින් අමුද්‍රව්‍ය මිල දී ගත හැකි සීමාව, ඒවා මගින් නිශ්චිතව දක්වයි. උදාහරණ වශයෙන්, ඉන්දියාවේ මිරිස් වලින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද සැර තක්කාලි සෝස් වර්ගයක්, උත්පාදනය කෙරුණු රට ශ්‍රී ලංකාව වනවිට, නිෂ්පාදන නිශ්චිත නීතිරීති සහ අවම සැකසුම් නීතිරීති තෘප්තිමත් කර ඇති ද යන වග. ආනයනය කරනු ලබන ඕනෑම අමුද්‍රව්‍යයක් සම්බන්ධයෙන් එහි වටිනාකම, පිරිවැය සහ නිෂ්පාදන ක්‍රියාවලි ආදියෙහි ලේඛනගත සාක්ෂි, අපනයනකරුවන් විසින් රඳවා තබා ගත යුතු වේ. භාණ්ඩ වල ප්‍රභවස්ථානය තෝරා බේරා ගැනීමේ නිර්ණායකයන් පිළිබඳ වැඩි විස්තර සඳහා ඇමුණුම IV හි අදාළ කොටස බලන්න.



## ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා

එක්සත් රාජධානිය තුළ නිෂ්පාදන විකිණීම පිණිස, අපනයනකරුවන් විසින් නිෂ්පාදන, ඇසුරුම්කරණ සහ සෞඛ්‍ය අනුකූලතා ප්‍රමිතීන් ආදියට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. මෙම අත්පොතෙන් ආවරණය කෙරෙන නිෂ්පාදන අපනයනය කිරීම සම්බන්ධයෙන් වන අදාළ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතා පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් මෙම අත්පොතෙහි පරිච්ඡේද 2 සහ 3 මගින් ලබා දී ඇත. සියලුම අවශ්‍යතාවන් පිළිබඳ ප්‍රයෝජනවත් දළ විශ්ලේෂණයක් අපනයන අවශ්‍යතා සම්බන්ධයෙන් ප්‍රමිතීන් සහ නියාමන පිළිබඳ DCTS මගපෙන්වුම මගින් සපයනු ලබයි.

**කඩිනම් ඉඟියක්: ඔබේ නිෂ්පාදනයට පවතින අපනයන යෝග්‍යතාව පරීක්ෂා කරන්න**

මෙම අත්පොත මගින් ආවරණය කර ඇති භාණ්ඩ ශ්‍රී ලංකාව වෙතින් අපනයනය කළ හැකි බව සහ මහා බ්‍රිතාන්‍ය වෙත ආනයනය කළ හැකි බව පාඨකයන් සැලකිල්ලට ගත යුතු වේ. කෙසේ වෙතත්, සමාන නිෂ්පාදන කේත යටතට වැටෙනු හැකි සමාන සහ නව නිෂ්පාදන සම්බන්ධයෙන් යෝග්‍යතාව පිළිබඳව අපනයනකරුවන් විසින් සිය වාණිජ මණ්ඩලය හෝ සංගමය වෙතින් හෝ දැන ගැනීම සුදුසු බවට ඉතා ඕනෑකමින් නිර්දේශ කරමු. අපනයනකරුවන් විසින් ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රතිපත්තිය ගැන ද දැනුම හා පුරුද්ද ඇති කරගත යුතු ය.

## DCTS යටතේ වරණීය වෙළෙඳ නීතිරීති සඳහා හිමිකම් පෑම

ෘඣී යටත් වරණීය නීතිරීති සඳහා හිමිකම් පෑමට, ශ්‍රී ලාංකේය අපනයනකරුවන් විසින් අදාළ ප්‍රභවස්ථානය පිළිබඳ සාක්ෂි සහ අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළ යුතුයි. ප්‍රභවස්ථානය පිළිබඳ සාක්ෂි සම්බන්ධයෙන්, අපනයනකරුවන් හට ප්‍රභවස්ථානය පිළිබඳ ප්‍රකාශනය හෝ පෝරමය සැපයිය හැකියි. ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති (සෘධධ) සඳහා වැඩිදුර මගපෙන්වුම් මෙතැනින් ලබාගත හැකියි. මීට අමතරව, පහතින් දක්වා ඇති අවශ්‍ය ලේඛනගත සාක්ෂි අපනයනකරුවන් විසින් ඉදිරිපත් කිරීම අවැසි වේ:

- නිෂ්පාදන වාර්තා: වසර තුනක කාලයක්, අපනයනකරුවන් විසින් නිෂ්පාදන වාර්තා ළඟ තබා ගත යුතු වේ
- ඉන්වොයිසි
- ගිණුම් විස්තර
- සැපයුම්කරුගේ ප්‍රකාශන

වැඩි විස්තර සඳහා, මෙම අත්පොතේ ඇමුණුම IV හි අදාළ කොටස බලන්න.




02

# 2 වන පරිච්ඡේදය: නිෂ්පාදන සහ නිෂ්පාදන අවශ්‍යතා

ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් පසු, ඊළඟ අදියර වන්නේ, මහා බ්‍රිතාන්‍ය වෙත සාර්ථකව අපනයනය කිරීම සඳහා වන සියලුම නිෂ්පාදන ප්‍රමිතීන් සහ නිෂ්පාදන පිරිවිතරයන් සපුරාලීම වේ. මෙහි දී නිෂ්පාදකයන් විසින් අවශ්‍යතා දෙකක් පිළිපැදිය යුතු වේ. පළමුවැන්නට අයත් වන්නේ, මෙම පරිච්ඡේදයේ මනාව විස්තර කර ඇති, බ්‍රිතාන්‍ය නීති මගින් දක්වා තිබෙන අනිවාර්ය අවශ්‍යතාවන් ය. දෙවැන්න, මෙම අත්පොතේ 3 වන පරිච්ඡේදය මගින් විස්තර කර ඇති පරිදි, නීතියෙන් අවශ්‍ය නොවන්නා වූ නමුත් මිලදී ගන්නන් සහ පාරිභෝගිකයන් විසින් ඉල්ලා සිටිනු ලබන්නා වූ ස්වෙච්ඡා අවශ්‍යතාවන් (යම් නිෂ්පාදනයක ගුණාත්මක භාවය, භාවිතයට ආරක්ෂා සහිත බව, හෝ කාර්යක්ෂමතාව පිළිබඳ නිශ්චිත ප්‍රමිතීන් සපුරාලන බව දැක්වෙන ලේබනයකි) ය.

## මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කළ භාණ්ඩ සඳහා අදාළ වන ප්‍රමිතීන්

මහා බ්‍රිතාන්‍යයේ කෘෂිආහාර ක්ෂේත්‍රය වෙත සාර්ථකව භාණ්ඩ අපනයනය කිරීම පිණිස, අපනයනකරුවන් විසින් පහත ප්‍රමිතීන් වලට අනුකූල විය යුතු වේ:

### ලේබල් කිරීමේ ප්‍රමිතීන්

මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනකරුවන්ගේ නිෂ්පාදන විකිණීම සම්බන්ධයෙන් ඔවුන් විසින් අනුකූල විය යුතු සවිස්තරාත්මක ප්‍රමිතීන් වන්නේ ලේබල් කිරීම, ඇසුරුම්කරණය, සංයුතිය සහ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ය. පොදුවේ ගත් කල, ආහාර ලේබල වල, පහත කරුණු අඩංගු විය යුතුයි:

- ආහාරයේ නම;
- 'Best before' හෝ 'use by' දිනය;
- ශුද්ධ පරිමාව;
- අඩංගු ද්‍රව්‍ය ලැයිස්තුව (ආසාත්මිකතා ඇති කළ හැකි ද්‍රව්‍ය ඇතුළුව);
- ප්‍රභවස්ථාන රට (COO);
- අවවාදයන්;
- ගබඩා කිරීමේ කොන්දේසි;
- තොග අංකය;
- භාවිතයට උපදෙස්;
- ආනයනකරුගේ නම සහ ලිපිනය.

අපනයනකරුවන් විසින් තම නිෂ්පාදන වලින් අවංකවම නියෝජනය කරනු ලබන ආහාරයෙහි නම සිය නිෂ්පාදන වල ලේබල් කිරීම මහා බ්‍රිතාන්‍යයේ ආහාර සංයුතිය පිළිබඳ ප්‍රමිතීන් මගින් අවශ්‍ය කෙරෙයි. ආහාරය සම්බන්ධයෙන් පරිභෝජකයා අපේක්ෂිත කිසියම් ගුණාත්මක භාවයක් එමගින් සපුරා ඇති බවත්, අඩු ගුණාත්මක භාවයක් සහිත විකල්ප මගින් එකී ආහාර නිෂ්පාදන ආදේශ කිරීමේ අවදානම මග හැරෙන බවත් මෙකී ප්‍රමිතීන් මගින් සහතික කෙරෙයි. බ්‍රිතාන්‍ය දේශසීමාවේ දී ආනයන ප්‍රතික්ෂේප වීම් මගහැරීම සඳහා, පළිබෝධනාශක සහ රසායනික දූෂක සම්බන්ධයෙන් වන අවසරලත් මට්ටම, නිවැරදි තොරතුරු පෙන්නුම් කිරීම, 'වෙන් කළ විස්තර' ('reserved descriptions') සඳහා වන ලේබල්කරණ අවශ්‍යතා පිළිපැදීම ආදී වූ ආහාර සංයුතිය පිළිබඳ ප්‍රමිතීන් පිරික්සා බලා, ඒවා සපුරාලීම අපනයනකරුවන් විසින් කළ යුතු වේ.

**කඩිනම් ඉඟියක්: පළිබෝධනාශක සහ දූෂක සම්බන්ධයෙන් වන අවසරලත් මට්ටම් පිරික්සන්න**

මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීමට පෙර, ආහාර නිෂ්පාදන සඳහා අවසර දී ඇති, පළිබෝධනාශක සහ දූෂක පිළිබඳ අවසරලත් මට්ටම් නිෂ්පාදකයන් විසින් පිරික්සිය යුතු වේ. පළිබෝධනාශක යනු, බෝග වගා කරන සමයේ දී හෝ ගබඩා කළ කාලයේ දී හෝ පළිබෝධකයන් විනාශ කිරීමට හෝ පාලනයට හෝ භාවිත කරන ලද රසායනික හෝ ජීවවිද්‍යාත්මක ද්‍රව්‍ය වේ. ඒවා, 'ශාක ආරක්ෂණ නිෂ්පාදන' වශයෙන් ද මහා බ්‍රිතාන්‍යයේ හඳුන්වනු ලබයි. මහා බ්‍රිතාන්‍යයෙහි පළිබෝධනාශක තදින්ම නියාමනය කර ඇත්තේ, ඒවායෙහි භාවිතය මගින් පරිභෝජකයන්, පරිසරය සහ කුරුල්ලන්, ක්ෂීරපායී සතුන්, මත්ස්‍යයන් හෝ පරාගනය කරන කෘමීන් වැනි ඉලක්ක නොකළ ජීවීන්ට හානියක් නොවීම සඳහා ය.

ආහාර වල පළිබෝධනාශක අවශේෂයෙහි උපරිම මට්ටම (MRL), තම ආහාර නිෂ්පාදන මගින් ඉක්මවා නොයන බවට සහතික වීම අපනයනකරුවන්ගේ වගකීම වේ. අපනයන නිෂ්පාදනයෙහි පවතින MRL ගණනය කිරීමට, ආර්ථික සහයෝගීතාව සඳහා වන සංවිධානය සහ සංවර්ධනය කළ ගණක යන්ත්‍රය (Economic Co-operation and Development MRL Calculator) යොදා ගන්න.

ඔබේ නිෂ්පාදනයෙහි MRL ප්‍රමාණය අවසරලත් සීමාවන් තුළ පවතින්නේ දැයි මහා බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාපිත රෙජිස්ටරය (Great Britain MRL Statutory Register) හරහා පිරික්සන්න. දත්ත ගබඩා වෙත සබැඳි අඩංගු අතිරේක තොරතුරු සහ සම්බන්ධ වීමේ තොරතුරු, මෙතැනින් සොයා ගත හැකියි. වාණිජ බලය ලබාදීම සඳහා වන සෞඛ්‍ය හා ආරක්ෂණ විධායකවරයා වෙත අපනයනකරුවන් විසින් පළිබෝධනාශක අයදුම්පතක් ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරෙයි. පළිබෝධනාශක අයදුම්පත සම්පූර්ණ කිරීමෙහි ලා අවශ්‍ය ලේඛන සහ තොරතුරු පිළිබඳව දැන ගැනීමට මෙම සවිස්තරාත්මක මගපෙන්වුම බලන්න. අපනයන නිෂ්පාදනය මගින් අවසරලත් ඵෘඛ ඉක්මවා යන්නේ නම්, මෙම මගපෙන්වුම යොදාගෙන නව ඵෘඛ සඳහා අයදුම් කිරීමට අපනයනකරුවන් හට හැකියාව පවතියි.

මහා බ්‍රිතාන්‍යයේ වරාය සෞඛ්‍ය අධිකාරීන් විසින් දේශසීමාවේ දී පළිබෝධනාශක පරීක්ෂණ පවත්වනු ලබන බව අපනයනකරුවන් විසින් සැලකිල්ලට ගත යුතු වේ. මෙම පියවරට අනුකූල-නොවීම, ආනයන ප්‍රතික්ෂේප වීම් වලට හේතු විය හැකියි. මෙම කාර්යපටිපාටිය ගැන සහ මහා බ්‍රිතාන්‍ය තුළට තම නිෂ්පාදනයට ඇතුළු වීමට අවසර ලැබ ගැනීම පිණිස අවශ්‍ය වන කොන්දේසි ගැන වැඩි විස්තර දැන ගැනීමට මෙතැන ක්ලික් කරන්න. තම නිෂ්පාදන සාර්ථකව මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීමට අවශ්‍ය සියලුම අනුමැතීන් ඔවුන් විසින් ලබාගන්නා බවට සහතික කරගැනීම පිණිස, සෞඛ්‍ය හා ආරක්ෂණ විධායකවරයා සමග සම්බන්ධ වන ලෙසට අපනයනකරුවන්ට උපදෙස් දෙමු. සෞඛ්‍ය හා ෆයිටොසැනිටරි සහතික නිකුත් කරන සහ රසායනාගාර පරීක්ෂණ හා සාම්පල බැලීමේ කටයුතු සිදු කරන ශ්‍රී ලංකාවේ අධිකාරීන් සොයා ගැනීමට 1 වන පරිච්ඡේදය සහ ඇමුණුම I බලන්න. මේ සම්බන්ධයෙන් වැඩිදුර මගපෙන්වුම් උදෙසා EDB හා සම්බන්ධ වන්න.

රසායනික දූෂක වලට, මයිකොටොක්සින්ස්, බැර ලෝහ (ඊයම් සහ රසදිය), නොනැසී පවත්නා කාබනික දූෂක (ඩයොක්සින්ස්) සහ ඇක්‍රිලමයිඩ් (ආහාර සැකසුම් කිරීම නිසා ඇති විය හැකි) අයත් වේ. ආහාර වල පවතින රසායනික දූෂක මට්ටම් සහ පරිභෝජකයන්ගේ ආහාර චක්‍රයට ඒවායෙහි නිරාවරණය සම්බන්ධයෙන් මහා බ්‍රිතාන්‍ය නියාමනය කර ඇත්තේ ස්වීකරණය කරන ලද නියාමන (EEC) 315/93 {assimilated Regulation (EEC) 315/93} හරහා ය. ආහාර තුළ රසායනික දූෂක වලින් ඇති වන අවදානම කළමනාකරණය පිණිස අපනයනකරුවන් විසින් සුදුසු ආහාර සුරක්ෂිතතා කළමනාකරණ ක්‍රියාවලි සහ උවදුරු විශ්ලේෂණ සහ දැඩි පාලනයෙන් යුතු පියවර නිසියාකාරව ස්ථානගත කර තිබිය යුතු වේ.

සවිස්තරාත්මක තොරතුරු සඳහා, මහා බ්‍රිතාන්‍යයේ ආහාර ප්‍රමිතීන් නියෝජිතායතනයෙහි මෙම මගපෙන්වුම බලන්න.





ඇතැම් ආහාර සම්බන්ධයෙන් 'වෙන් කළ විස්තර' (zreserved descriptions) යන නාමය පවතියි. එය යොදා ගත හැකි වන්නේ, ආහාරය සම්බන්ධයෙන් කිසියම් නියත සංයුතියක් තිබේ නම් පමණි. උදාහරණයක් වශයෙන්, ග්‍රෑම් 450ක ඕනෑම පලතුරු වර්ගයකින් සාදන ලද ජෑම් වර්ගයක් 'ජෑම්' යනුවෙන් ලේබල් කළ නොහැක; ඒ වෙනුවට, එය ලේබල් කළ යුත්තේ 'extra jam' වශයෙනි. 'වෙන් කළ විස්තර' ('reserved descriptions') සහ අනෙකුත් ලේබල්කරණ ප්‍රමිතීන් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, ඇමුණුම II බලන්න.

## අලෙවිකරණ ප්‍රමිතීන්

විවිධ ශාක වර්ග, කුකුළු මස්, රකිනු ලබන බිත්තර සහ කුකුළු පැටවුන්, හරක්මස් සහ වහුමස් වැනි නිශ්චිත නිෂ්පාදන සඳහා මෙම ප්‍රමිතීන් අදාළ වේ. එසේ අදාළ වේ නම්, වැඩි විස්තර සඳහා වෙළෙන්දන් විසින් අලෙවිකරණ ප්‍රමිතීන් (Marketing Standards) හි සවිස්තරාත්මක මගපෙන්වුම පිරික්සිය යුතු වේ.

### කොටුව 7: ඖෂධීය පැළෑටි සහ කුළුබඩු සඳහා ප්‍රමිතීන්

බ්‍රිතාන්‍ය වෙළෙඳපොළ තුළ ඖෂධීය පැළෑටි සහ කුළුබඩු විකිණීම සඳහා, ඉහතින් සඳහන් කර ඇති සාමාන්‍ය ස්වස්ථතාව සහ ආරක්ෂණ අවශ්‍යතාවන්ට අනුකූලව අපනයනකරුවන් කටයුතු කළ යුතු වේ. ඖෂධීය පැළෑටි සහ කුළුබඩු වල අව්‍යාජ බව සහ වියළි ඖෂධීය පැළෑටි සහ කුළුබඩු සඳහා වන ආසාත්මිකතා අවදානම් තක්සේරුව පිළිබඳ ප්‍රමිතීන් ගැන දැන ගැනීමට මෙතැන ක්ලික් කරන්න. ඇතැම් ඖෂධීය පැළෑටි සහ කුළුබඩු වල වර්ණක, රසකාරක හෝ පැණි-රසගැන්වීම් අඩංගු විය හැකියි. මේවා ශ්‍රී ලංකාවේ ආහාර අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය හැකි නමුත්, ඒවායින් ඇතැම් දෑ මහා බ්‍රිතාන්‍යයේ දී අනුමත නොවිය හැකිය. මෙකී නියාමනයන් (රෙගුලාසි) ගැන දැනගැනීමට, මෙම විමසීමේ පෝරමය (ැබුමසරහ දෙරප) යොදාගෙන, ආහාර ප්‍රමිතීන් පිළිබඳ නියෝජිතායතනයේ ආහාර ආකලන කණ්ඩායම සමග සම්බන්ධ වන්න. ඖෂධීය පැළෑටි සහ කුළුබඩු වලට අදාළ පළිබෝධනාශක, ලේබල්කරණය, ඇසුරුම්කරණ අවශ්‍යතා ආදිය ගැන සවිස්තරාත්මක තොරතුරු සඳහා මෙතැන ක්ලික් කරන්න.

**කඩිනම් ඉඟියක්: ඖෂධීය පැළෑටි සහ ශාකසාර නිෂ්පාදන සඳහා වන අලෙවිකරණ ප්‍රමිතීන**

ඖෂධීය පැළෑටි, ශාකසාර නිෂ්පාදන, ශාකසාර තේ සහ කුළුබඩු අපනයනය කරන නිෂ්පාදකයන් හට ඒ පිළිබඳ අලෙවිකරණ ප්‍රමිතීන් සඳහා විවිධ පැළෑටි වර්ග (plant varieties) විමසා බැලිය හැකියි.
මහා බ්‍රිතාන්‍යයෙහි, ශාක ප්‍රභේද පිළිබඳ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් හඳුන්වනු ලබන්නේ, ශාක උපජනනය කරන්නන්ගේ අයිතිවාසිකම් ලෙස ය. එක්සත් රාජධානිය සඳහා අයිතිවාසිකම් ප්‍රදානය කරනු ලබන්නේ සත්ව හා ශාක සෞඛ්‍යය පිළිබඳ නියෝජිතායතනය විසිනි.

මහා බ්‍රිතාන්‍යයේ ජාතික ලැයිස්තු වෙත ශාක ප්‍රභේදයක් එකතු කළ විට, එය අලෙවිකරණය සඳහා ඔබට ඉඩ ලැබේ. එහි අයදුම් කිරීමේ ක්‍රියාවලිය ද වෙනස් ය. එය, ශාක උපජනනය කරන්නන්ගේ අයිතිවාසිකම් වලින් වෙනස් වූවකි. පළමුව, ශාක ප්‍රභේදය ලියාපදිංචි කළ යුතු ද යන්න විමසා බැලීමට මෙතැන ක්ලික් කරන්න. අනුමත කළ ශාක ප්‍රභේද ලැයිස්තුව විශේෂ සංස්කරණය (special edition) හි ප්‍රකාශයට පත් කර ඇත. ඉන් පසුව, මහා බ්‍රිතාන්‍යයේ ජාතික ලැයිස්තුව වෙත නව ශාක ප්‍රභේදයක් එක් කිරීම සඳහා මෙම මගපෙන්වුම බලන්න. කෘෂිකාර්මික සහ එළවළු ප්‍රභේද සඳහා නිෂ්පාදකයන් හට ශාක උපජනනය කරන්නන්ගේ අයිතිවාසිකම් සහ ජාතික ලැයිස්තුවට එක් කිරීම් සම්බන්ධයෙන් එකම අවස්ථාවේ දී අයදුම් කළ හැකියි. වැඩි විස්තර සඳහා pvs.helpdesk@apha.gov.uk හරහා සහය කවුන්ටරය සමග සම්බන්ධ විය යුතු බවට නිෂ්පාදකයන් හට නිර්දේශ කෙරෙයි.

# අපනයන කිරීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා

ඇතැම් නිෂ්පාදන විශේෂ නීතිරීති වලට විෂය වේ. මහා බ්‍රිතාන්‍ය වෙත එවැනි නිෂ්පාදනයක් ආනයනය කිරීමට පෙරාතුව ව්‍යාපාර විසින් එම විශේෂ නීතිරීති වලට අනුව බලපත්‍ර සහ සහතිකපත් ලබාගැනීම කළ යුතු වේ. ඕනෑම රටක් ඉහළ අවදානම් සහිත සනීපාරක්ෂණ සහ ෆයිටොසැනිටරි නිෂ්පාදන (high-risk sanitary and phytosanitary products) අපනයනය සඳහා වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීම සඳහා අනුමැතිය ලබාගත යුතු බවට නීති මගින් නියම කර තිබේ. එකී රට විසින් අනුමැතිය ලබාගෙන ඇති නම් මිස, මෙකී නිෂ්පාදන මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීමට ව්‍යාපාරයකට හැකියාව නොලැබෙනු ඇත. මේ සම්බන්ධයෙන් වන ගැටලු/විමසීම් සඳහා imported.food@food.gov.uk සමග සම්බන්ධ වන්න.

**කඩිනම් ඉඟියක්**

වෙළෙඳ රේගු ගාස්තු (Trade Tariff) පිටුව වෙත යන්න. ඔබේ නිෂ්පාදනයට අදාළ භාණ්ඩ කේතය යොදාගෙන, නිෂ්පාදනය සඳහා අවශ්‍ය කෙරෙන බලපත්‍ර සහ සහතිකපත් වර්ග පිළිබඳ තොරතුරු ලබාගන්න. මෙය, දේශසීමාවේ දී යම් ආනයන ප්‍රතික්ෂේප වීමක් මගහරවා ගැනීමට අදාළ වන වැදගත් පියවරකි. නව අපනයනකරුවන් විසින් සිය නිෂ්පාදන අලෙවිකරණය සහ විකිණීම සම්බන්ධයෙන් යම් ආනයනකරුවන්ගේ හෝ බෙදාහරින්නන්ගේ ජාලයක් යොදා ගැනීම මෙහිදී නිර්දේශ කෙරෙයි.





# ආනයන පාලන

ඉහළ-අවදානම් ඇති නිෂ්පාදන සම්බන්ධයෙන් මනුෂ්‍ය සහ සත්ව සෞඛ්‍යයට ඇති විය හැකි යම් අවදානමකින් ආරක්ෂා වීම පිණිස පනවා ඇති සීමා කිරීම්, ආනයන පාලන යනුවෙන් හැඳින්වේ. මෙකී පියවර නිර්මාණය කර ඇත්තේ, තිරසර නිෂ්පාදන පිළිවෙත් සහතික කිරීම පිණිස සහ පරිභෝජකයන් හා බ්‍රිතාන්‍ය සමාගම් යන ද්විපාර්ශ්වය වෙතම, ඔවුන් මිලදී ගන්නා භාණ්ඩ අව්‍යාජ බවට සහ විස්තර කර ඇති පරිදි බවට සහතික කිරීම පිණිස වේ. එවැනි සීමා කිරීම් මගින් අවදානම් අවම කිරීම සහ, වෙළෙඳපොළ තුළ එකී භාණ්ඩයෙහි විශ්වසනීයත්වය පවත්වා ගැනීම සිදු කෙරෙයි. මහා බ්‍රිතාන්‍ය වෙත අපනයනය කිරීමට පෙරාතුව, සියලුම සහතිකපත් සම්බන්ධයෙන් වන අනුකූලතා සපුරා ඇති බවට සහතික වීම පිණිස පහත නිෂ්පාදන සම්බන්ධයෙන් වන ආනයන පාලන පිරික්සන්න.

- කාබනික නිෂ්පාදන (Organic products)෴ මහා බ්‍රිතාන්‍ය වෙත කාබනික නිෂ්පාදන විකිණීමේ දී, අනුමත බ්‍රිතාන්‍ය පාලන ආයතනයක් (approved British control body) මගින් නිෂ්පාදනය සහ අපනයනකරුගේ ව්‍යාපාරය, කාබනික බවට සහතික කර තිබිය යුතු වේ. ඉන් පසුව, පරීක්ෂා කිරීමේ සහතිකයක්, අපනයනකරු විසින් ලබාගත යුතු වේ. අනුමත බ්‍රිතාන්‍ය පාලන ආයතන අතරින් එකක් සමග සම්බන්ධ වීම මගින් මෙම සහතිකය ලබා ගන්නේ කෙසේ ද සහ කිනම් අවස්ථාවේ ද යන්න පිළිබඳ තොරතුරු ලබාගත හැකියි. මහා බ්‍රිතාන්‍ය වෙත කාබනික නිෂ්පාදන අපනයනය කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා ඇමුණුම II බලන්න.

- ශාක සහ බීජ (Plants and seeds)෴ පළිබෝධ සහ විෂබීජ/රෝග මගින් මහා බ්‍රිතාන්‍යයේ ශාක සෞඛ්‍යයට සහ බෝග වලට හානි විය හැකිය. මෙම හේතුව නිසා, ශාඛ පළිබෝධ දරනු ලබන හෝ රැගෙන එනු ලබන ශාක හෝ ශාක නිෂ්පාදන වලට එරටට ඇතුළු වීම තහනම් කර ඇති අතර, අනෙකුත් නිෂ්පාදන විසින් යම් යම් නියමිත අවශ්‍යතාවන් සපුරාලිය යුත්තේ, ඒ සමග ඉදිරිපත් කරනු ලබන ෆයිටොසැනිටරි සහතික ද ඇතිව ය. නිෂ්පාදනයට ඇතුළත් වන අවදානම් කාණ්ඩය මත පදනම් ව, ආනයන අවශ්‍යතාවන් තීරණය කෙරෙයි. අවදානම් කාණ්ඩය සහ අදාළ ආනයන අවශ්‍යතාවන් සොයා ගැනීමට මෙම මගපෙන්වුම බලන්න.

**කඩිනම් ඉඟියක්෴ තහනම් කළ භාණ්ඩ (ශාක)**

ඖෂධීය පැළෑටි සහ ශාකසාර තේ වර්ගය අපනයනය කරන නිෂ්පාදකයන් ඔවුන්ගේ නිෂ්පාදන අපනයනය කිරීමට භාර ගැනීමට පෙරාතුව පරිසර, ආහාර හා ග්‍රාමීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් තහනම් භාණ්ඩ (prohibited commodities) වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ද යන වග පරීක්ෂා කළ යුතුය.

අපනයනකරුවන් සිය නිෂ්පාදන අපනයනය කිරීමට පෙර, මෙකී අවශ්‍යතා පිරික්සා බැලිය යුතු වන්නේ, එවිට, මහා බ්‍රිතාන්‍ය වෙත ආනයනයේ දී අවශ්‍ය වන අනිවාර්ය සහතිකපත් ඔවුන්ට ලබාගත හැකි වන බැවිනි. ආනයන දැන්වීම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, planthealth.info@apha.gov.uk හරහා ඊමේල් මගින් හෝ අංක 0300 1000 313 ඔස්සේ සත්ව සහ ශාක සෞඛ්‍ය නියෝජිතායතනය (එංගලන්තය සහ වේල්සය) සමග සම්බන්ධ වන්න.

- සනීපාරක්ෂණ සහ ෆයිටොසැනිටරි නිෂ්පාදන (Sanitary and phytosanitary products)෴ නම් කරන ලද දේශසීමා පාලන ස්ථාන හරහා පමණක් අපනයනය කළ හැකි ඇතැම් නිශ්චිත නිෂ්පාදන මත ආනයන පාලන /සීමා කිරීම් පනවා තිබේ. මෙකී පාලන පනවා ඇත්තේ මහජන සෞඛ්‍ය ආරක්ෂණය පිණිස වේ. මේ වනවිට, ශ්‍රී ලංකාවෙන් ආනයනය කරනු ලබන කැප්සිකම් විශේෂයන්ට (පැණි-රස හෝ පැණි-රස හැර වෙනත්) අයත් පෙපර්ස් වර්ග (peppers) මත ආනයන පාලන පනවා තිබේ. මහා බ්‍රිතාන්‍ය වෙත ආනයනය සඳහා නැව්බඩු තොග නිෂ්කාශනයට අදාළ සහතිකපත් සහ ලේඛන ගැන අපනයනය කිරීමට පෙර දැනගැනීම පිණිස, රෙගුලාසි (regulations) පිරික්සා බලන්න.

# නිෂ්පාදනයේ තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්

පරිසර පනත, 2021 මගින් දක්වන්නේ, 'වනාන්තර අවදානම සහිත පාරිභෝගික භාණ්ඩ' ('forest-risk commodities' - FRCs) හෝ එවැනි FRCs භාවිතයෙන් සිදු කළ නිෂ්පාදනය, වන විනාශයට දායක වන බැවින්, ඒවා වාණිජ කටයුතු සඳහා යොදා ගත නොහැකි බවයි. 10 වන කොටුව වෙතින් FRCs පිළිබඳ වැඩි විස්තර බලන්න.

මහා බ්‍රිතාන්‍ය වෙත සැපයීම් සිදු කරන, පවුම් මිලියන 50ට වැඩි වාර්ෂික පිරිවැටුමක් සහිත නිෂ්පාදකයන් විසින් මෙම යෝජනාක්‍රමයට අනුකූල විය යුතු වේ. 8 වන කොටුවේ නිශ්චිතව දක්වා ඇති ඍෂි භාවිතය මගින් වාර්ෂික පරිමාවෙහි සීමාව ටොන් 500ක් නොඉක්මවනු ලබන නිෂ්පාදකයන් විසින් බඳු නිදහස් කිරීමකට අයදුම් කළ හැකිය.

### 8 වන කොටුව: වනාන්තර-අවදානම සහිත පාරිභෝගික භාණ්ඩයක් යනු කුමක්ද?

FRC යනු:

- ශාබයකින්, සත්වයකුගෙන් හෝ ජීවියෙකුගෙන් නිපදවන ලද පාරිභෝගික භාණ්ඩයක්; සහ
- එකී පාරිභෝගික භාණ්ඩය නිපදවීම උදෙසා කෘෂිකාර්මික ඉඩමක් බවට පත්කිරීමට වනාන්තරය කපා-හෙලා, වෙනස්කම් ඇති කිරීම.

පහත දැක්වෙන නිෂ්පාදන, FRCs වශයෙන් වර්ගීකරණය කෙරෙන FRCs යෝජනාක්‍රමයක් මහා බ්‍රිතාන්‍ය විසින් හඳුන්වා දෙනු ඇත.

- ගවයින් ආශ්‍රිත කිරි-නොවන නිෂ්පාදන (ගවමස් සහ සම් භාණ්ඩ);
- කොකෝවා;
- සෝයි;
- පාම් තෙල්.

මෙය දර්ශකයක් වශයෙන් යොදා ගත් ලැයිස්තුවක් බව කරුණාවෙන් සලකන්න. FRC පාරිභෝගික භාණ්ඩ වල අවසන් ලැයිස්තුව අනාවරණය කරනු ලබන්නේ FRC රෙගුලාසි ක්‍රියාවට නැංවීමෙන් පසුව පමණි.

### 9 වන කොටුව: නිෂ්පාදකයන් විසින් තිරසර අනාගතයක් සඳහා සූදානම් කරන්නේ කෙසේද?

- අමු-ද්‍රව්‍ය වල ප්‍රභවයන් සහ ඒවා වඩාත් වනාන්තර-හිතකාමී කරන්නේ කෙසේද යන වග පිළිබඳව ඔබේ සැපයුම්කරුවන් සමග කථා කරන්න.
- එක් එක් සැපයුම්කරුගෙන් සිදු කළ මිලදී ගැනීම් වැනි වැදගත් තොරතුරු සහ ව්‍යාපාර නාමය, හිමිකරුගේ නම, තැපැල් ලිපිනය, වෙළෙඳ ලකුණ, ඊමේල් ලිපිනය සහ වෙබ් ලිපිනය වැනි තොරතුරු සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගන්න.
- 2024 අග භාගයේ දී හෝ 2025 දී හඳුන්වා දීමට නියමිතව තිබෙන FRC යෝජනාක්‍රමයට සම්බන්ධ සියලු පුවත් සම්බන්ධයෙන් ඔබ කලින් කලට යාවත්කාලීන වන්න.
- ඉවත ලන ද්‍රව්‍ය හෝ සම්පූර්ණයෙන්ම පරිසර-හිතකාමී ද්‍රව්‍ය ආදිය භාවිතයෙන් කරන නව්‍ය නිෂ්පාදන වල යෙදෙන්න. මෙය, ඔබේ නිෂ්පාදනය විකිණීමට සහය වන අතිවිශිෂ්ට කරුණක් වනු ඇත. ඒ හරහා ඔබට සුවිශේෂී වෙළෙඳපොළක් ග්‍රහණය කරගැනීමට හැකි වනු ඇත.



# වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති ශාබ සහ සතුන්ගෙන් කළ නිෂ්පාදන

වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා වෘක්ෂලතා විශේෂයන් වෙළෙඳාම, ඒවායෙහි ගහනය ක්ෂය වීමට ඉඩ සලසනු ඇති අතර, ඇතැම් අවස්ථාවන් හි දී වඳ වී යාමට ආසන්න තත්ත්වයට පවා ඒවා ලක් විය හැකිය. වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති වන සත්ව හා වෘක්ෂලතා විශේෂ වල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) යනු ජාත්‍යන්තර ගිවිසුමකි. එමගින් ඉලක්ක කරනුයේ, වන සත්ව සහ ශාක නිදර්ශක පිළිබඳ ජාත්‍යන්තර වෙළෙඳාම මගින් එකී විශේෂයන්ගේ පැවැත්මට තර්ජනයක් නොවන බව සහතික කිරීමයි.

CITES මගින් ආවරණය කෙරෙන ශාක සහ සත්ව විශේෂ, උපග්‍රන්ථ තුනක ලැයිස්තු ගත කර ඇත්තේ, ඔවුන් විසින් සහතික කර ඇති ආරක්ෂණ මට්ටම මත පදනම්ව ය. I වන උපග්‍රන්ථයෙහි අඩංගු වන්නේ, වඳ වී යාමේ තර්ජනයට ලක් ව සිටින විශේෂයන් ය. මෙවැනි විශේෂයන් සම්බන්ධ වෙළෙඳාම් වලට අවසර ලබා දී ඇත්තේ සුවිශේෂී අවස්ථාවල දී පමණි. II වන උපග්‍රන්ථයෙහි අඩංගු වන්නේ, වඳ වී යාමේ තර්ජනයකට ලක්ව නොමැති විශේෂයන් ය; කෙසේ වෙතත්, ඒවායෙහි පැවැත්මට නොගැළපෙන අයුරින් ඒවා භාවිතය මගහැරීම පිණිස ඒවායෙහි භාවිතය පාලනය කළ යුතු වේ. ෂෂෂ වන උපග්‍රන්ථයෙහි අඩංගු වන්නේ, ඇතැම් රටවල් විසින් ආරක්ෂා කරනු ලබන විශේෂයන් වන අතර, ඒවා සම්බන්ධ වෙළෙඳාම් පාලනය කළ යුතු වේ. ව්‍යාපාරයක් සම්බන්ධයෙන් මෙයින් අදහස් වන්නේ කුමක්දැයි අවබෝධ කරගැනීමට 10 වන කොටුව බලන්න.

ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය යන දෙරට ම CITES සම්මුතියට අත්සන් තැබූ රටවල් ය. එයින් අදහස් වන්නේ, රටවල් දෙක ම සහ ඔවුන් අතර වන ව්‍යාපාරයන් ද ඊට අනුකූලව කටයුතු කළ යුතු බවයි. ශ්‍රී ලංකාව තුළ, CITES බලාත්මක කිරීමෙහි වගකීම ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ය. CITES විශේෂයන් වශයෙන් ලැයිස්තුගත කර ඇති ශාක හෝ සත්වයන් අපනයනය කිරීමට අවශ්‍ය අපනයනයකරුවකු විසින් මෙම දෙපාර්තමේන්තුව වෙතින් CITES සහතිකය ලබාගත යුතු වේ. එක් එක් නැව්බඩු තොගය අපනයනය කිරීමේ දී CITES අවසරපත්‍රයක් අවශ්‍ය වේ. මෙම අවසරපත්‍රය පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වන්න.

### 10 වන කොටුව: ප්‍රතිපත්තියට අනුව දැනට ක්‍රියාවට නංවනු ලබන CITES පිළිබඳ උදාහරණ

ශ්‍රී ලංකාවේ බනානා ඕකිඩ් නැමති ශාකය ලැයිස්තුගත කර ඇත්තේ CITES හි II වන උපග්‍රන්ථයෙහි ය. මෙයින් අදහස් වන්නේ, බනානා ඕකිඩ් අඩංගු නිෂ්පාදන අපනයනකරුවන් විසින් අපනයන සිදු කිරීමේ කටයුතු භාර ගැනීමට පෙරාතුව, ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් CITES අවසරපත්‍රයක් ලබාගත යුතු බවයි.

**කඩිනම් ඉඟියක්: අපනයන නිෂ්පාදන වල CITES විශේෂයන් අඩංගු දැයි පිරික්සන්න**

සත්වයකු හෝ ශාබයක් යම් CITES උපග්‍රන්ථයක ලැයිස්තුගත කර ඇති දැයි පරීක්ෂා කිරීමට, අපනයනකරුවන් විසින් මෙම CITES විශේෂයන් සඳහා වන පිරික්සුම් ලැයිස්තුව (Checklist of CITES Species) හි සෙවුම් තීරුවට සත්වයාගේ හෝ ශාබයේ නම ඇතුළත් කර බලන්න. ස්ථානය ලෙසට ශ්‍රී ලංකාව තෝරාගෙන සෙවුම වැඩිදුරටත් පැහැදිලිව කරගන්න. ඊට විකල්ප වශයෙන් විශේෂයන් හෝ ලේඛන සෙවීම පිණිස අපනයනකරුවන් හට Species+ වෙත පිවිසීමේ හැකියාව ද ඇත.



# 03

# 3 වන පරිච්ඡේදය: ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්

ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් (VSSs) යනු, නිෂ්පාදනයක් තැනීමේ දී එම නිෂ්පාදනය විසින් පරිසරයට හෝ නිෂ්පාදනය තැනූ මිනිසුන්ට හෝ හානියක් සිදු නොකළ බව පෙන්නුම් කෙරෙන විශේෂ ප්‍රමිතීන් වේ. ස්වෙච්ඡා ප්‍රමිතීන් වන මේවා මනා පාරිසරික, කෘෂිකාර්මික සහ සමාජයීය පිළිවෙත් පිළිබඳ සාක්ෂි වේ. VSS සහතිකපත් මගින්, නිෂ්පාදනයෙහි ගුණාත්මක භාවය සහතික කෙරෙන අතර, එමගින් ඔවුන්ගේ අපේක්ෂාවන් හා ඇතැම් නිර්ණායකයන් සපුරාලන බවත් පරිභෝජකයාට සහතික කරනු ලබයි. VSS සහතිකපත් මගින් ව්‍යාපාර වලට ප්‍රතිලාභ ලැබිය හැකි වන්නේ, එමගින් පරිභෝජකයන් තුළ එම ව්‍යාපාරයෙහි විශ්වසනීයත්වය ඉහළ නැංවෙන බැවිනි. එසේම, නව වෙළෙඳපොළ වෙත සහ අවස්ථාවන් වෙත ප්‍රවේශය ලැබීම, මෙහෙයුම් පිරිවැය අවම කරගැනීමට හැකිවීම, දේශගුණික විපර්යාසයන්ට අනුගත වීමේ හැකියාව ව්‍යාපාරයට ලැබීම ආදී ප්‍රතිලාභ ද හිමි වේ.

**කඩිනම් ඉඟියක්**

වෙනත් දෑ අතර, පාරිසරික ආරක්ෂණය, ආහාර සුරක්ෂිතතාව, තිරසර ඇසුරුම්කරණය, කම්කරු අයිතිවාසිකම්, ව්‍යාපාරික ආචාරධර්ම, නිසි උද්යෝගය සහ සොයා ගැනීමේ හැකියාව (traceability) ආදිය සම්බන්ධයෙන් තොරතුරු සහ නැඹුරුතා සොයා ගැනීමට ෂඕෂ ප්‍රමිතීන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු යොදා ගන්න. පරිශීලකයන් විසින් අපනයනය කිරීමට කැමති සහ ප්‍රවේශ වීමකට කැමති වෙළෙඳපොළට අදාළ ඕී පිළිබඳ තොරතුරු ලබා ගැනීමට, හඳුනා ගැනීමට,  හා සැසඳීමට මෙම මෙවලම ඉඩ සලසා දෙයි.

## 11 වන කොටුව: කෝඩෙක්ස් අලිමෙන්ටේරියස්

Codex Alimentarius ප්‍රමිතීන් යනු, සුරක්ෂිතතාව, ගුණාත්මක භාවය සහ ජාත්‍යන්තර ආහාර වෙළෙඳාම වෙත ඇති සාධාරණත්වය සහතික කිරීම ඉලක්ක කෙරෙන ජාත්‍යන්තර ආහාර ප්‍රමිතීන්, මගපෙන්වුම් සහ භාවිත සංග්‍රහයන් ය. පරිභෝජකයන් විසින් මිලදී ගනු ලබන ආහාර නිෂ්පාදන වල සුරක්ෂිතතාව සහ ගුණාත්මක  භාවය ගැන ඔවුන්ට විශ්වාසය තැබිය හැකි අතර, ආනයනකරුවන් හට ඔවුන් විසින් ඇණවුම් කරන ලද ආහාර ඒවායෙහි පිරිවිතරයන්ට අනුව වන බවට විශ්වාසය තැබිය හැකි වේ.  මහා බ්‍රිතාන්‍යයේ ආහාර ප්‍රමිතීන්, සාමාන්‍යයෙන් Codex Alimentarius ප්‍රමිතීන්ට ඉහළින් පවතින අතර, ඇතැම් විට ඒවා ඉක්මවා යාම ද සිදු වේ.

ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ සහතික කිරීමේ ක්‍රියාවලිය (VSS) පිළිබඳ නිශ්චිත තොරතුරු සහ මෙම අත්පොත මගින් ආවරණය කර ඇති ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් ජාත්‍යන්තර පිළිගැනීම සහිත VSS සහතික කිරීම් පිළිබඳ උදාහරණ, ඇමුණුම III හි සපයා ඇත.

### 12 වන කොටුව: තිරසර භාවය පිළිබඳ සැපයුම්කාර සම්පත්

ශ්‍රී ලංකාවේ සැපයුම්කරුවන් හට තිරසර සහතික කිරීම් තිබේදැයි පරීක්ෂා කිරීමට, ITC තිරසර භාවය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු යොදා ගන්න. තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන් සහ සහතික කිරීම් ගැන වැඩි විස්තර දැනගැනීමට, ITC SME වෙළෙඳ ඇකඩමිය වෙතින් ලබාගත හැකි විවිධාකාර පාඨමාලාවන් පරීක්ෂා කර බලන්න.




## සමාගම් සංග්‍රහය

නිෂ්පාදක-අපනයනකරුවන් විසින් පිළිපැදිය යුතු 'සමාගම් කේත' ලෙසට හඳුන්වනු ලබන ගැනුම්කරුවන්ගේම අභ්‍යන්තර මගපෙන්වුම් හෝ චර්යාධර්ම සංග්‍රහ ඔවුන් විසින් ස්ථාපිත කළ හැකි වේ. නිෂ්පාදනයෙහි මෙන්ම නිෂ්පාදන ක්‍රියාවලියෙහි පවතින අඩු දෘශ්‍ය ගුණාංග ඉස්මතු කර දැක්වීම මෙකී කේත මගින් ඉලක්ක කෙරෙයි. සාමාන්‍යයෙන්, විකිණුම් ගිවිසුම ගැන සාකච්ඡා කරන අවස්ථාවේ දී ගැනුම්කරුවන් තම සමාගමෙහි චර්යාධර්ම සංග්‍රහ හෝ මගපෙන්වුම් වලට, නිෂ්පාදක අපනයනකරුවන් ඒවාට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කර දක්වයි.

**කඩිනම් ඉඟියක්: විකල්ප විමසා බලන්න**

- මූල්‍ය පහසුකම් ලබාගෙන, තිරසර භාවය පිළිබඳ ප්‍රමිති අවශ්‍යතා සපුරාලීම පිණිස ඒවා යොදා ගන්න. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ තිරසර කාබනික කෘෂිකාර්මික ක්‍රමවේද, නව අපනයන සංවර්ධන වැඩසටහන සහ අපනයන මූල්‍ය පහසුකම් ලබාගැනීම ආදී වශයෙන් යෝජනාක්‍රම රැසක් EDB සතුව පවතියි.
- ඇතැම් සහතික කිරීමේ ආයතන විසින් සමූහ සහතික කිරීම් සඳහා අවසර ලබාදෙන අතර, එය සැලකිල්ලට ගත හැකි පිරිවැය-ඵලදායී විකල්පයකි.
- ඔබ වෙළෙන්දකු හෝ සුළු පරිමාණ ව්‍යාපාරිකයකු නම්, නිෂ්පාදන සහතිකය ඔබේ සන්නාමය යටතේ පමණක් ලැබෙන බව සිහි තබා ගන්න.

**කඩිනම් ඉඟියක්: ගැනුම්කරුගේ අපේක්ෂාවන් වටහා ගැනීම**

විකිණුම් ගිවිසුම සාකච්ඡා කරන අවස්ථාවේ දී, ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ (VSS) සහතික කිරීම් ලබාගැනීම සහ සමාගම් චර්යාධර්ම සංග්‍රහයට අනුකූල වීම ආදිය සම්බන්ධයෙන් ගැනුම්කරුගේ අපේක්ෂාවන් පිළිබඳව සාකච්ඡා කිරීමට මතක තබාගන්න. සාකච්ඡා කළ කරුණු සහ එකඟ වූ කරුණු පැහැදිලිව දැක්වෙන විධිවිධානයක් විකිණුම් ගිවිසුමට ඇතුළත් කරන්න.




# 04

# 4 වන පරිච්ඡේදය: රේගු සහ ආශ්‍රිත ක්‍රියාපටිපාටි

රේගු ක්‍රියාපටිපාටි සහ අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන සම්බන්ධයෙන් අපනයනකරුවන් දැනුවත් විය යුතුය. එවිට, මහා බ්‍රිතාන්‍ය වෙත නිෂ්පාදන සාර්ථකව යැවීමේ හැකියාව සහතික කළ හැකිය. පළපුරුද්ද හා සාමාන්‍ය දැනීමට අනුව, සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම (DCTS) සිත් හි තබාගෙන නිවැරදි නිෂ්පාදන කේතය හඳුනාගත් බවට සහ සිය නිෂ්පාදන වලට නිවැරදි වටිනාකම ලබාදුන් බවට සියලු අපනයනකරුවන් සහතික විය යුතු වේ. නිෂ්පාදන කේත, DCTS සහ රේගු ගාස්තු අනුපාතිකයන් පිළිබඳ තොරතුරු සඳහා 1 වන පරිච්ඡේදය බලන්න.

**කඩිනම් ඉඟියක්:**

රේගු කාර්යපටිපාටි සංකීර්ණ හා සවිස්තරාත්මක වේ. ශ්‍රී ලංකා රේගුව සමග අපනයන නැව්බඩු නිෂ්කාශනය පහසුකරණ නිෂ්කාශන නියෝජිතයන්ගේ සහය ලබාගැනීමට අපනයනකරුවන් කටයුතු කළ යුතු වේ. රේගු ප්‍රකාශන, ලේඛන පිළිබඳ කාර්යයන් සහ නිෂ්කාශන කටයුතු සම්බන්ධයෙන් ඔවුන් විසින් ඔබට සහය ලබා දේ. ක්‍රියාවලිය ගැන දැනුවත් නිෂ්කාශන නියෝජිතයන් සමග සම්බන්ධ වන්න. මේ සඳහා, ශ්‍රී ලංකා රේගුව සමග බලයලත් නිෂ්කාශන නියෝජිතයන් හා සම්බන්ධ වන්න. ශ්‍රී ලංකා රේගුවෙහි බලයලත් නිෂ්කාශන නියෝජිතයන්ගේ ලැයිස්තුවක් TIN/VAT ලියාපදිංචි කිරීමේ ඒකකය වෙතින් සොයා ගත හැකියි

## රේගු ප්‍රකාශනය

භාණ්ඩ අපනයනය කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයන් විසින් රේගුව වෙත අපනයන ප්‍රකාශනයක් (CusDec) ඉදිරිපත් කළ යුතු වේ. ඉලෙක්ට්‍රොනිකව ASYCUDA හරහා හෝ කඩදාසි ආකෘතියෙන් හෝ CusDec ක්‍රියාව සිදු කළ හැකිය. CusDec සඳහා රේගු ඇතුළත් වීමේ අංකයක් (Customs entry number) ලබා දෙන අතර, සම්පූර්ණ නිෂ්කාශන ක්‍රියාවලිය තුළ දී යොමුවක් වශයෙන් එය භාවිත කෙරෙයි. එම නිසා, CusDec සඳහා ඉදිරිපත් කරන විට, අපනයනකරුවන් ඉතා සුපරීක්ෂාකාරී ලෙස විස්තර ඇතුළත් කිරීම සිදු කළ යුතු වේ.

# රේගු නිෂ්කාශනය සඳහා ලේඛන

රේගුව වෙතින් සාර්ථකව නිෂ්කාශනය කරගැනීම පිණිස, පහත ලේඛන සම්පූර්ණ බවට සහතික වන්න:

- වාණිජ ඉන්වොයිසිය
- COO සහතිකය
- අපනයන අවසරපත්‍ර/බලපත්‍ර/සහතිකපත් (අදාළ නම්)
- නැව්ගත කිරීමේ සටහන
- VAT සහතිකය
- TIN සහතිකය
- ඇසුරුම් ලැයිස්තුව
- විකුණුම් ගිවිසුම
- නෞභාර බිල්පත (bill of Lading - BoL)
- ෆයිටොසැනිටරි සහතිකය
- සෞඛ්‍ය සහතික

ඉහතින් දක්වා ඇති බොහෝ ලේඛන ලබාගැනීමේ ක්‍රියාවලිය මෙම අත්පොතෙහි 1 වන පරිච්ඡේදය හි සපයා ඇත. සමහරක් අවශ්‍ය ලේඛන පිළිබඳ වැඩි විස්තර දැන ගැනීම පිණිස මෙම අත්පොතෙහි ඇමුණුම IV බලන්න.

### 13 වන කොටුව: සෘජු වෙළෙඳ ආදානය

රේගුවේ පරිපාලනමය පරිගණක පද්ධතිය වෙත රේගු ප්‍රකාශන සෘජුව ඉදිරිපත්කිරීමේ ක්‍රියාවලිය (Direct Trader Input) හරහා අපනයනකරුවන් හට සම්පූර්ණ රේගු ක්‍රියාවලිය හෝ අවශ්‍ය කටයුතු දුරස්ථව සිටිමින්, තමන් විසින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන් හරහා හෝ සිදු කරගත හැකිය. ASYCUDA හරහා Direct Trader Input වෙත ප්‍රවේශ විය හැකියි. ශ්‍රී ලංකා රේගුව විසින් නිකුත් කරනු ඇති අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම මගින් Direct Trader Input ලියාපදිංචිය සිදු කිරීමේ හැකියාව ද අපනයනකරුවන් හට ඇත. මේ සඳහා ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සමග සම්බන්ධ වන්න. සම්බන්ධ වීමේ තොරතුරු මෙතැනින් ලබාගත හැකියි.





# රේගු නිෂ්කාශනය

CusDec සම්බන්ධයෙන් සැකසුම් කටයුතු කිරීමෙන් සහ භාණ්ඩ පරීක්ෂාවෙන් පසුව, අපනයන නැව්බඩු තොගය රේගුව විසින් මුදා හරිනු ලැබේ. පරීක්ෂා කිරීම අනිවාර්ය නොවන අතර, එය තීරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන අපනයන නිලධාරියා විසිනි. නිලධාරි විසින් 'මඬුල්ල විසින් පරීක්ෂා කිරීමට (Panel Examination)', 'පරීක්ෂා කිරීමට නියමිත නැව්බඩු (Cargo to be Examined)', හෝ 'පරීක්ෂා කිරීමට නියමිත මුද්‍රා (Seals to be checked)', ආදී වශයෙන් වන, අවශ්‍ය මුද්‍රාව CusDec මත තබනු ලබයි. කිසිදු පරීක්ෂාවක් අවශ්‍ය නොමැති බව ප්‍රධාන අපනයන නිලධාරියා සිතන්නේ නම්, එකී නැව්බඩු තොගය පරීක්ෂා කිරීමෙන් නිදහස් කර, 'නිදහස් කරන ලදී (Exempted)' නැමැති මුද්‍රාව ඒ මත තබනු ලබයි. ඉන් අනතුරුව, නැව්බඩු තොගය නැව්ගත කිරීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත මුදා හරිනු ලබයි.

**කඩිනම් ඉඟියක්: රේගු බන්ධිත ගබඩා**

සැපයුම් කාර්යයන් උදෙසා, සෘජුව හෝ යුරෝපීය සංගමය හරහා වැනි නොයෙක් නැව්ගත මාර්ග ඔස්සේ භාණ්ඩ වලට බ්‍රිතාන්‍ය දේශසීමාව වෙත ළඟා විය හැකිය. භාණ්ඩ, බ්‍රිතාන්‍ය දේශසීමාව වෙත ළඟා වීමෙන් අනතුරුව, එම භාණ්ඩ සාමාන්‍යයෙන් ගබඩා කර තබනුයේ රේගු බන්ධිත ගබඩා වල ය. භාරගත යුතු භාණ්ඩ (consigned goods) වල ප්‍රවාහය, ඒවා ප්‍රති පිළියෙළ කිරීම සහ අදාළ රේගු බදු සහ වෙනත් බදු ගෙවීම් ප්‍රමාද කිරීම ආදිය පාලනය කිරීමේ හැකියාව ආනයනකරුවන්ට ඇත.

මහා බ්‍රිතාන්‍ය වෙත භාණ්ඩ නැව්ගත කරනු ලැබුවේ යුරෝපා සංගමය හරහා නම්, ඒවා රේගු බන්ධිත ගබඩා වල ගබඩා කෙරෙනු ඇත. එබැවින්, එම භාණ්ඩ සම්බන්ධයෙන් ආර්ථික මෙහෙයුම්කරුවන් විසින් ආනයන බදු කිසිවක් ගෙවිය යුතු නොවේ. සුරාබදු බදු වලට යටත් වන (එකී තීරුබදු ගෙවා ඇත්නම් මිස) භාණ්ඩ සහ සීමාවන්ට හෝ සනීපාරක්ෂක අවශ්‍යතාවන්ට විෂය වන භාණ්ඩ සම්බන්ධයෙන් අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන ඉදිරිපත් කර ඇති නම් මිස, එසේ ගබඩා කළ නොහැකි බව සලකන්න. මහා බ්‍රිතාන්‍යයේ දී රේගු බන්ධිත ගබඩාවක් භාවිත කරන අයුරු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා මෙම මගපෙන්වුම බලන්න.



© Shutterstock.com

05

# 5 වන පරිච්ඡේදය: ප්‍රවාහන සහ සැපයුම්

ගැළපෙන ප්‍රවාහනය සහ සැපයුම් (සංවිධානය කිරීමේ හා සැලසුම් කිරීමේ කාර්යයන්) ක්‍රමවේද තෝරා ගැනීම සාර්ථක අපනයනයක දී වැදගත් අංගයකි. නිවැරදි ප්‍රවාහන ක්‍රමය තෝරා ගැනීම, නැව්බඩු තොග ගෙන යාමට පිළියෙළ කිරීම, අපනයන භාණ්ඩ ගෙන යාම පිළිබඳ රක්ෂණය, නැව්ගත කිරීමට පෙර සිදු කරන පරීක්ෂාව සහ ගමනාන්තය වෙත භාර දීම ආදී ක්‍රියාවලියට සම්බන්ධ විවිධ කාරණා වලට වගකිව යුතු පාර්ශ්වය කවුරුන් ද යන වග විකුණුම් ගිවිසුමක දී ඇති ජාත්‍යන්තර වාණිජ කොන්දේසි (ෂබජදඑැරපි) මගින් සපයනු ලබයි. යැවීමට නියමිත භාණ්ඩ තොගය (ජදබීසටබපැබඑ) ආශ්‍රිත මතභේදයක දී, නිසියාකාර සහ විනිවිද භාවයෙන් යුතුව ප්‍රවාහනය පිළිබඳ ලේඛන පවත්වාගෙන තිබීම විශේෂයෙන්ම වැදගත් වේ.

## නෞභාර බිල්පත

නෞභාර බිල්පතක් යනු භාණ්ඩ ගෙන යනු ලබන්නා (ප්‍රවාහන සමාගම) සහ නැව්ගත කරන්නා/ අපනයනකරු/ භාණ්ඩ තොගය යවනු ලබන්නා අතර ඇති කරගන්නා ගිවිසුමකි. භාණ්ඩ වල වර්ගය, ප්‍රමාණය සහ ගමනාන්තය පිළිබඳ විස්තර එහි අඩංගු වේ. එමගින් වැදගත් කාර්යයන් තුනක් ඉටු කෙරෙයි:

- එය, නෞභාර බිල්පතෙහි විස්තර කර ඇති භාණ්ඩ පිළිබඳ හිමිකම් ලේඛනයකි;
- එය, නැව්ගත කළ භාණ්ඩ පිළිබඳ ලදුපතකි;
- එය, නැව්ගත කිරීම පිළිබඳ නීතිරීති අඩංගු වූවකි

නෞභාර බිල්පතක (BoL) උදාහරණයක් සඳහා ඇමුණුම V බලන්න.

## ගුවන් මාර්ග බිල්පත

භාණ්ඩ තොග සටහනක්, බෙදා හැරීමේ සටහනක් හෝ මාර්ග බිල්පතක් ද වශයෙන් හඳුන්වනු ලබන ගුවන් මාර්ග බිල්පතක් යනු, භාණ්ඩ ගෙන යනු ලබන්නා (ගුවනින් ගෙන යන්නා) සහ භාණ්ඩ තොගය යවනු ලබන්නා / නැව්ගත කරන්නා/ අපනයනකරු අතර ඇති කරගන්නා ගිවිසුමකි. නැව්බඩු තොගය පිළිබඳ තොරතුරු, ගුවන් මාර්ග බිල්පතක අඩංගු වන අතර, එමගින් යම් නිශ්චිත අවස්ථාවක දී එකී භාණ්ඩ තිබෙන්නේ කොහිදැයි සොයා ගැනීමේ හැකියාව ද යොමු අංකයක් හරහා ලබා දේ. නෞභාර බිල්පතක් මෙන් නොව, ගුවන් මාර්ග බිල්පතක් යනු කේවල් කළ නොහැකි එකකි. ගුවන් මාර්ග බිල්පතක උදාහරණයක් සඳහා ඇමුණුම V බලන්න.

## රක්ෂණය

1 වන පරිච්ඡේදයෙහි පැහැදිලි කර ඇති පරිදි, භාණ්ඩ ප්‍රවාහනයේ දී සහ රක්ෂණය වැනි ඒ ආශ්‍රිත පිරිවැය සම්බන්ධයෙන් පැන නැගෙන අවදානම් කළමනාකරණය කිරීම පිළිබඳ වගකිව යුතු පාර්ශ්වය, ජාත්‍යන්තර වාණිජ කොන්දේසි මගින් තීරණය කෙරෙයි. නැව්බඩු තොග රක්ෂණය මගින් මාර්ගස්ථ (තැනකින් තැනකට ගෙන යාම) අවස්ථාවේ දී භාණ්ඩ වලට සිදු විය හැකි අලාභ හානි සම්බන්ධයෙන් මූල්‍ය ආරක්ෂණයක් ලබා දෙයි. උදාහරණයක් වශයෙන්, CIF ගිවිසුමක, නැව්බඩු තොග රක්ෂණයක් ලබාගැනීම සහ එහි පිරිවැය දැරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ විකුණුම්කරු ය. අපනයන භාණ්ඩ ගෙන යාම පිළිබඳ රක්ෂණය පිළිබඳ විස්තර, වාණිජ ඉන්වොයිසියෙහි ඇතුළත් කළ යුතු ය.

**කඩිනම් ඉඟියක්:**
**ආනයන/අපනයන භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් යොදා ගැනීම**

කුඩා පරිමාවන් අපනයනය කරනු ලබන කුඩා අපනයනකරුවන් හට ආනයන / අපනයන භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් සහ දේශීය ප්‍රවාහන සමාගම් වෙතින් සේවාවන් ලබාගැනීම මගින් ප්‍රතිලාභ ලැබිය හැකිය.

**කඩිනම් ඉඟියක්:**
**ඉඩ වෙන්කරවා ගැනීම**

නැව්ගත කිරීමට නියමිත දිනයෙන් සෑහෙන දින ගණනකට පෙරාතුව නැව්ගත කරන්නන් / අපනයනකරුවන් විසින් නැව්බඩු සඳහා ඉඩ වෙන්කරවා ගැනීම කළ යුතු වේ. මුහුදු මගින් යවන භාණ්ඩ පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සම්බන්ධ වන්න, ගුවන් මගින් යවන භාණ්ඩ පිළිබඳව ගුවන් සමාගම් නියෝජිතයකු හා සම්බන්ධ වන්න.

# ඇමුණුම්



01

## ඇමුණුම් I: ශ්‍රී ලාංකික අපනයනකරුවකු වීමට සූදානම් කිරීම

### නිෂ්පාදන-නිශ්චිත අවසරපත

A1 වගුව: නිෂ්පාදන-නිශ්චිත අවසරපත්‍ර/බලපත්‍ර/සහතිකපත්

| නිෂ්පාදනය | අපනයන සඳහා අවශ්‍ය බලපත්‍ර / අවසරපත්‍ර / සහතිකපත් | වගකිව යුතු අධිකාරිය |
| --- | --- | --- |
| තේ (ශාකසාර තේ) | • තේ මණ්ඩලයේ ලියාපදිංචිය<br>• තොග තේ සම්බන්ධයෙන් සාමාන්‍ය වෙන්දේසි මිල සහතික කිරීම<br>• එක් එක් නැව්බඩු තොගය සඳහා තත්ත්ව සහතිකය | • ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>• ශ්‍රී ලංකා තේ මණ්ඩලය |
| සියලු කුළුබඩු (කුරුඳු හැරෙන්නට) | • COO සහතිකය<br>• ෆයිටොසැනිටරි සහතිකය<br>• අතිරේක තොරතුරු සමග ෆයිටොසැනිටරි සහතිකය (අවශ්‍ය නම්) | • DoC<br>• NPQS<br>• NPQS |
| කුරුඳු | • COO සහතිකය<br>• ෆයිටොසැනිටරි සහතිකය<br>• අතිරේක තොරතුරු සමග ෆයිටොසැනිටරි සහතිකය (අවශ්‍ය නම්)<br>• ශ්‍රී ලංකා ප්‍රමිති සලකුණ / තත්ත්ව සහතිකය (අනිවාර්ය නැත)<br>• පිරිසිදු ලංකා කුරුඳු (Pure Ceylon Cinnamon) ලාංඡනය භාවිත කිරීමට බලපත්‍රය (අනිවාර්ය නැත)<br>• GI සහතිකය (අනිවාර්ය නැත) | • DoC<br>• NPQS<br>• NPQS<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>• EDB<br>• EDB |
| පොල් සහ පොල් පදනම් නිෂ්පාදන | • CDA ලියාපදිංචිය<br>• COO සහතිකය<br>• ෆයිටොසැනිටරි සහතිකය<br>• නිෂ්පාදනයේ ප්‍රමිතිය පිළිබඳ සහතිකය<br>• ඩෙසිකේටඩ් කොකොනට් සඳහා තත්ත්ව සහතික කිරීමේ සහතිකපත<br>• පොල්-ආශ්‍රිත නිෂ්පාදන සඳහා පරීක්ෂණ වාර්තාව | • CDA<br>• DoC<br>• NPQS<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>• CDA<br>• CDA |
| විජලනය කළ පලතුරු | • COO සහතිකය<br>• ෆයිටොසැනිටරි සහතිකය<br>• අතිරේක තොරතුරු සමග ෆයිටොසැනිටරි සහතිකය (අවශ්‍ය නම්)<br>• ක්ෂේත්‍ර සහතිකය (අවශ්‍ය නම්) | • DoC<br>• NPQS<br>• NPQS<br>• කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවය සහ NPQS |
| කාබනික කෘෂි නිෂ්පාදන | • NOCU ලියාපදිංචිය<br>• COO සහතිකය<br>• ෆයිටොසැනිටරි සහතිකය<br>• අතිරේක තොරතුරු සමග ෆයිටොසැනිටරි සහතිකය (අවශ්‍ය නම්)<br>• අපනයන අවසරපත්‍රය (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අවශ්‍ය නම්) | • ජාතික කාබනික පාලන ඒකකය<br>• DoC<br>• NPQS<br>• NPQS<br>• ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| ආයුර්වේද සහ ශාකසාර වලින් නිම කළ නිෂ්පාදන | සෞඛ්‍ය සත්කාරක නිෂ්පාදන වශයෙන් දේශීය වෙළෙඳපොළට සහ අපනයනය සඳහා අනුමැතිය | ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පත් කරන ලද ඖෂධ සූත්‍රකරණ කමිටුව |

සැලකිය යුතුයි: මෙම වගුව, ශ්‍රී ලංකාවේ සිට මහා බ්‍රිතාන්‍ය වෙත නිෂ්පාදනයක් අපනයනය කිරීමට අවශ්‍ය අපනයන අවසරපත්‍ර ලැයිස්තුවට සීමා වූවකි. කාබනික තේ/නිෂ්පාදන ආදිය සඳහා NOCU සමග ලියාපදිංචිය ආදී වූ නිෂ්පාදන-නිශ්චිත ලියාපදිංචි කිරීම් පිළිබඳ ලැයිස්තුව ඊට අඩංගු නොවේ. නිෂ්පාදන-නිශ්චිත සහ වෙනත් ලියාපදිංචි කිරීම් සඳහා මෙම අත්පොතෙහි 1 වන පරිච්ඡේදය බලන්න.

**කඩිනම් ඉඟියක්: පියවරින්-පියවර වෙළෙඳාම**

ITC සහ ශ්‍රී ලංකා රජය අතර සහයෝගීතාව ඇතිව සංවර්ධනය කරන ලද මෙම පියවරින්-පියවර වූ කාර්යය, විවිධ නිෂ්පාදන සම්බන්ධයෙන් වන අපනයන ක්‍රියාවලිය පැහැදිලි සහ පරිශීලක-හිතකාමී ක්‍රියාපටිපාටි මගපෙන්වුමක් වශයෙන් කටයුතු කරනු ලබයි. පියවරින්-පියවරට දැක්වෙන දළ විශ්ලේෂණයක් එමගින් අපනයනකරුවන් වෙත ලබාදෙන බැවින්, සිය භාණ්ඩ අපනයනය කිරීම සම්බන්ධයෙන් සපුරාලිය යුතු අවශ්‍යතා ඒ හරහා ඔවුන්ට පහසුවෙන් බලාගත හැකි වේ. ඔබේ නිෂ්පාදනය අපනයනය කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර සොයා ගැනීමට මෙම මගපෙන්වුම බලන්න.

## ඔබ දැන සිටියාද?

සාමාන්‍ය වෙන්දේසි මිල: සාමාන්‍ය වෙන්දේසි මිල සහතික කිරීමක් මගින්, අපනයන වෙළෙඳපොළ තුළ විනිවිද භාවය සහ සාධාරණත්වය සහතික කරමින්, තොග තේ වල සාමාන්‍ය වෙන්දේසි මිල සත්‍යාපනය කරනු ලබයි. ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකේය තේ වල විශ්වසනීය භාවය සහ තත්ත්ව ප්‍රමිතීන් පවත්වා ගැනීමෙහි ලා මෙම සහතික කිරීම වැදගත් වේ. එය, සාර්ථකව තේ අපනයනය කිරීමෙහි ලා පවතින පූර්ව අවශ්‍යතාවකි. මෙම සහතිකය ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා සම්බන්ධ වන්න.

ශ්‍රී ලංකා ප්‍රමිති සලකුණ: නිෂ්පාදනය මගින් අවශ්‍ය ප්‍රමිතීන් සපුරා ඇති බව සහ අදාළ රෙගුලාසි සහ ප්‍රඥප්ති වලට අනුකූල බව මෙම සහතිකය මගින් සලකුණු කෙරෙයි. එය නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසිනි. එය, ප්‍රමිතිකරණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ (ISO) 9001 සම්මතයන් මත පදනම් ව ඇත. මෙම ප්‍රමිතිය පිළිබඳ වැඩිදුර විස්තර වෙත මෙතැනින් ප්‍රවේශ විය හැකියි.

පිරිසිදු ලංකා කුරුඳු ( Pure Ceylon Cinnamon) ලාංඡනය: මෙම ලාංඡනය මගින් නිෂ්පාදනයේ ගුණාත්මක භාවය ගැන පරිභෝජකයන් හට සහතිකයක් ලබා දෙමින්, නිෂ්පාදනය මගින් පිරිසිදු ලංකා කුරුඳු සහතික කිරීමේ ප්‍රමිතීන් සපුරා ඇති බව දක්වයි. අපනයනකරුවන් විසින් මෙම ලාංඡනය ලබා ගැනීම අනිවාර්ය නැත. එය ප්‍රදානය කරනු ලබන්නේ EDB විසිනි. මෙම ලාංඡනය භාවිත කිරීම පිණිස බලපත්‍රය ලබාගැනීමට, මෙතැනින් අයදුම් කරන්න.






# විකුණුම් ගිවිසුමක සාම්පල උපුටනයක්

## A1 රූපය: විකුණුම් ගිවිසුමක සාම්පලයක්

| | |
|---|---|
| Seller<br>ABC Exports<br>4300 Longbeach Blvd<br>Longbeach, California, 90807<br>United States<br>+12138447711<br>Randy Clarke<br>Company Tax ID: 93377112<br>info@abcexports.com<br>ABC EXPORTS | Pages<br>1 of 1<br>Invoice Number: INV-34567S<br>Date: 04 Jul 2022 |
| Buyer<br>XYZ Imports<br>410 QueenStreet<br>Brisbane, Queensland, 4814<br>Australia<br>+61404822536<br>Bob Jones | Delivery Date<br>04 Jul 2022 |
| Method of Dispatch: Sea<br>Type of Shipment: FCL<br>Port of Loading: Long Beach<br>Port of Discharge: Sydney | Terms / Method of Payment<br>30% DEPOSIT, BALANCE UPON BILL OF LADING |

| Product Code | Description of Goods | Unit Quantity | Unit Type | Price | Amount |
|---|---|---|---|---|---|
| B-STOOL | BAR STOOL ALUMINUM 500 X 100 X 100MM STAINLESS STEEL | 150 | EACH | 77.20 | 11,580.00 |
| B-TABLE | BAR TABLE ALUMINUM 1000 X 600 X 400MM STAINLESS STEEL | 75 | EACH | 110.40 | 8,280.00 |
| Total This Page | | 225 | | | 19,860.00 |
| Consignment Total | | 225 | | | 19,860.00 |

| | |
|---|---|
| Conditions<br>SUBJECT TO OUR STANDARD TRADING CONDITIONS | TOTAL: $19,860.00<br>Incoterms® 2020: FOB LONGBEACH<br>Currency<br>Signatory Company: ABC Exports<br>Name of Authorized Signatory: Randy Clarke |
| Bank Details<br>Account Name: ABC EXPORTS<br>Bank Account Number: 845590XXXX<br>Bank Name: Community Federal Savinsg Bank<br>ACH Routing Number: 02607XXXX<br>Fedwire Routing Number: 02607XXX<br>SWIFT Code: CMFGUS33<br>Bank Address: 89-16 Jamaica Ave, Woodhaven, New York, NY 11421 | Signature<br>Randy Clarke |

මූලාශ්‍රය: https://incodocs.com/template/sales_contract

# ජාත්‍යන්තර වාණිජ කොන්දේසි

විකුණුම් ගිවිසුම් වල ජාත්‍යන්තර වාණිජ කොන්දේසි ඇතුළත් වන අතර, ඒවා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් සකස් කරන ලද පොදු නීතිරීති 11 කින් යුතු වූවකි. ජාත්‍යන්තර විකුණුම් ගනුදෙනුවක දී විකුණුම්කරු / අපනයනකරු සහ ගැනුම්කරුට අදාළ වගකීම් මෙකී කොන්දේසි මගින් නිර්වචනය කෙරෙයි.  මෙකී ජාත්‍යන්තර වශයෙන් සම්මත කරන ලද කොන්දේසි මගින් ප්‍රවාහන පිරිවැය, රක්ෂණ ගාස්තු, රේගු නිෂ්කාශන ආදිය පිළිබඳව පාර්ශ්වයන් දැනුවත් කරයි. ඒවා මගින්, එක් එක් පාර්ශ්වයෙහි වගකීම් නිශ්චිතව පෙන්නුම් කෙරෙනු පමණක් නොව, විකුණුම්කරු වෙතින් ගැනුම්කරු වෙත අවදානම් පැවරීම සිදු වන ස්ථානය සහ දෙපාර්ශ්වයන් අතර පිරිවැය බෙදෙන අවස්ථාව ද පෙන්නුම් කෙරෙයි.

## A2 වගුව: ජාත්‍යන්තර වාණිජ කොන්දේසි පිළිබඳ සාරාංශය

| ජාත්‍යන්තර වාණිජ නීතිරීති | ගැනුම්කරුගේ කාර්යභාරය | විකුණුම්කරුගේ කාර්යභාරය |
|---|---|---|
| නැව්ගත කිරීමේ ගනුදෙනුවක දී ගැනුම්කරුගේ සහ විකුණුම්කරුගේ වගකීම් | අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ඔවුන් කළ යුත්තේ ඔවුන්ගේ පරිශ්‍රය වෙතින් ලබාගත හැකි අයුරින් භාණ්ඩ සූදානම් කර තැබීම පමණි. |
| දක්වන ලද ස්ථානයක් වෙත භාණ්ඩ බෙදා හැරීම සඳහා විකුණුම්කරුගේ වගකීම් | අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ප්‍රවාහන මාධ්‍යය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ගැනුම්කරු විසින් නම් කරන ලද  ප්‍රවාහන මාධ්‍යයට භාණ්ඩ භාර දිය යුතුයි. |
| නිශ්චිත වරායක දී ගැනුම්කරුගේ නෞකාවක් අසලට විකුණුම්කරු විසින් භාණ්ඩ භාර දීම අවශ්‍ය කිරීම | භාණ්ඩ පැටවීම සිදු කරන වරායේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | භාණ්ඩ පැටවීම සිදු කරන වරායෙහි නෞකාව අසලට භාණ්ඩ භාර දිය යුතුයි. |
| භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් විකුණුම්කරුගේ වගකීම් සහ අවදානම් අවසන් වන හා මිලදී ගන්නාගේ වගකීම් සහ අවදානම් ආරම්භ වන තැන | භාණ්ඩ පැටවීම සිදු කරන වරායේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | භාණ්ඩ පැටවීම සිදු කරන වරායෙහි නෞකාවට භාණ්ඩ පැටවීම සිදු කළ යුතුයි. |
| පිරිවැය සහ භාණ්ඩ ප්‍රවාහනය | නැව්ගත කිරීමේ වරායේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් ගමනාන්ත වරාය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කළ යුතුයි. |
| පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන | නැව්ගත කිරීමේ වරායේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් ගමනාන්ත වරාය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කර, රක්ෂණය සඳහා කටයුතු පිළියෙළ කළ යුතුයි. |
| පිරිවැය ගෙවන ලද්දේ | ප්‍රවාහන මාධ්‍යයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් නම් කළ ගමනාන්තය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කළ යුතුයි. |
| ප්‍රවාහනකරුට සහ රක්ෂණය ගෙවන ලද්දේ | ප්‍රවාහන මාධ්‍යයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ප්‍රවාහන මාධ්‍යය මගින් නම් කළ ගමනාන්තය වෙත භාණ්ඩ යැවීමට කටයුතු සැලසීම සහ ප්‍රවාහන වියදම් ගෙවීම කර, රක්ෂණය සඳහා කටයුතු පිළියෙළ කළ යුතුයි. |
| නිශ්චිත ස්ථානයකට/ගමනාන්ත වරායකට භාණ්ඩ භාර දෙන ලදී | භාණ්ඩ බෑම හැරෙන්නට අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ගැනුම්කරුගේ පරිශ්‍රය වෙත හෝ නම් කළ වෙනත් ස්ථානයකට භාණ්ඩ භාර දිය යුතුයි. |
| බෑමකින් තොරව ස්ථානය වෙත භාර දෙන ලදී | භාණ්ඩ බෑම ඇතුළුව, විකුණුම්කරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. | ගැනුම්කරුගේ පරිශ්‍රය වෙත හෝ නම් කළ වෙනත් ස්ථානයකට භාණ්ඩ භාර දීඅ, ඒවා බෑම කළ යුතුයි. |
| භාර දීමේ බදු ගෙවන ලදී | අවශ්‍ය වන්නේ භාණ්ඩ භාර ගැනීම පමණි. | භාණ්ඩ බෑම සහ රේගු නිෂ්කාශනය ඇතුළුව අපනයනකරුගේ පරිශ්‍රයේ සිට ගමනාන්තය දක්වා සියලු කටයුතු පිළිබඳ වගකිව යුතුයි. |



# නිෂ්පාදන වර්ගීකරණය: HS කේත

## HS කේත සහ UKCCs පිළිබඳ දළ විශ්ලේෂණය

HS කේත යනු, දේශසීමාවක් හරහා යනු ලබන නිෂ්පාදන වර්ගීකරණය පිණිස ලෝක රේගු සංවිධානය විසින් සංවර්ධනය කරන ලද නීතිමය ලියවිල්ලකි. නිෂ්පාදනයක HS හෝ රේගු කේතය, අදාළ රේගු ගාස්තු, ආනයන / අපනයන බලපත්‍ර අයදුම් කිරීම, අභ්‍යන්තර බදු, සහ වෙනත් අවශ්‍යතා සහ පාලන සම්බන්ධ කරුණු තීරණය කිරීමට උපකාරී වේ. එම නිසා, නාම මාත්‍ර ඉන්වොයිසියේ සහ විකුණුම් ගිවිසුමෙහි නිෂ්පාදනය විස්තර කරන විට, විකුණුම්කරු විසින් නිවැරදි නිෂ්පාදන වර්ගීකරණය හෝ HS කේතය ඇතුළත් කළ යුතු වේ.

මහා බ්‍රිතාන්‍යයේ, භාණ්ඩ වර්ගීකරණ වගුව, නිෂ්පාදන වර්ගීකරණය කරනුයේ ඉලක්කම්-10ක මට්ටමිනි.  A3 වගුවෙහි පෙන්වා දී ඇති ආකාරයට යී කේතය සහ UKCC අනුව පෙපර්ස් (pepper) සම්බන්ධයෙන් වන නිෂ්පාදන වර්ගීකරණයෙහි උදාහරණය යොදා ගෙන නිෂ්පාදන වර්ගීකරණය කරනු ලබන විවිධ මට්ටම් දැක-බලා ගත හැකියි.

### ඔබ දැන සිටියාද?

ප්‍රමිතිගත වෙළෙඳ භාණ්ඩ විස්තරය සහ කේතීකරණ පද්ධතිය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියෙහි යී කේත අන්තර්ගත වේ. HS කේතයෙහි අදාළ පරිච්ඡේදය, ශීර්ෂය සහ උප ශීර්ෂය හි දක්වා ඇති නිෂ්පාදන විස්තරය මත පදනම්ව, එක් එක් නිෂ්පාදනය සඳහා නිෂ්පාදන කේතයක් හෝ HS කේතයක් ඇත. එය, ඉලක්කම් හයකින් සමන්විත වේ. කෙසේ වෙතත්, HS කේත වලින් ඔබ්බට පියවරක් තබා, නිෂ්පාදන වර්ගීකරණ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර හැඳින්වීමක් සිදු කිරීමේ හැකියාව රටවල් වලට පවතියි. HS නාමකරණ මෙතැනින් දැක-බලා ගත හැකියි.

## A4 වගුව: HS Code සහ UKCC අනුව, පෙපර්ස් (pepper) සම්බන්ධයෙන් වන නිෂ්පාදන වර්ගීකරණය

| HS කේතය | | | |
|---|---|---|---|
| HS කේතය | ඉලක්කම් 2 | 09 | කෝපි, තේ, මේට් (maté) සහ කුළුබඩු |
| HS මාතෘකාව | ඉලක්කම් 4 | 09 04 | *Piper* ගණයේ පෙපර්ස්, *Capsicum* හෝ *Pimenta* කුලයට අයත් වියළි හෝ කැබලි කළ හෝ කුඩු කළ ගෙඩි |
| HS උප මාතෘකාව | ඉලක්කම් 6 | 0904.11 | කැබලි හෝ කුඩු නොකළ |
| UKCC | | | |
| UKCC උප මාතෘකාව | ඉලක්කම් 10 | 0904.1100.10 | කලු ගම්මිරිස් *piper* |
| UKCC උප මාතෘකාව | ඉලක්කම් 10 | 0904.1100.90 | වෙනත් |

### A4 වගුව: මෙම අත්පොත මගින් ආවරණය කර ඇති නිෂ්පාදන වල UKCCs දක්වන ලැයිස්තුව

| | UKCC විස්තරය |
|---|---|
| **කෝපි, තේ, මේට් සහ කුළුබඩු** | |
| 0904.1100.10 | *Piper* ගණයේ පෙපර්ස්, *Capsicum* හෝ *Pimenta* කුලයට අයත් වියළි හෝ කැබලි කළ හෝ කුඩු කළ ගෙඩි - පෙපර්ස් - කැබලි හෝ කුඩු නොකළ - කලු ගම්මිරිස් (piper) |
| 0904.1200.00 | *Piper* ගණයේ පෙපර්ස්, *Capsicum* හෝ *Pimenta* කුලයට අයත් වියළි හෝ කැබලි කළ හෝ කුඩු කළ ගෙඩි - පෙපර්ස් - කැබලි හෝ කුඩු කළ |
| 0906.1100.00 | කුරුඳු සහ කුරුඳු ගසෙහි මල් - කුඩු හෝ කැබලි නොකළ - කුරුඳු (Cinnamomum zeylanicum blume) |
| 0908.1100.00 | සාදික්කා, වසාවාසි සහ කරදමුංගු - සාදික්කා - කැබලි හෝ කුඩු නොකළ |
| 0908.1200.00 | සාදික්කා, වසාවාසි සහ කරදමුංගු - සාදික්කා - කැබලි හෝ කුඩු කළ |
| 0908.2100.00 | සාදික්කා, වසාවාසි සහ කරදමුංගු - සාදික්කා - කැබලි හෝ කුඩු නොකළ |
| 0908.2200.00 | සාදික්කා, වසාවාසි සහ කරදමුංගු - සාදික්කා - කැබලි හෝ කුඩු කළ |
| **පලතුරු** | |
| 0804.3000.10 | රටඉඳි, ෆිග්ස්, අන්නාසි, අලිපේර, පේර, අඹ සහ මැංගුස්ටීන්, නැවුම් හෝ වියළි - අන්නාසි - වියළි |
| 0801.1100.00 | පොල්, බ්‍රසීල් නට්ස් සහ කජු ඇට, නැවුම් හෝ වියළි, කටුව හෝ පොත්ත ඉවත් කළ හෝ නොකළ - පොල් - ඩෙසිකේටඩ් |
| 0801.1200.00 | පොල්, බ්‍රසීල් නට්ස් සහ කජු ඇට, නැවුම් හෝ වියළි, කටුව හෝ පොත්ත ඉවත් කළ හෝ නොකළ - පොල් - ඇතුළත කටුව තුළ (ගෙඩියේ ඇතුල් කටුව) |
| 0801.1900.00 | පොල්, බ්‍රසීල් නට්ස් සහ කජු ඇට, නැවුම් හෝ වියළි, කටුව හෝ පොත්ත ඉවත් කළ හෝ නොකළ - පොල් - වෙනත් |

### A2 රූපය: පෙපර්ස්/කුළුබඩු සම්බන්ධයෙන් UKCCs සඳහා වන පරිච්ඡේද සටහන්

**Notes for commodity 0904110010**

**Chapter notes**

1. Mixtures of the products of heading 0904 to 0910 are to be classified as follows:
   - (a) mixtures of two or more of the products of the same heading are to be classified in that heading;
   - (b) mixtures of two or more of the products of different headings are to be classified in heading 0910.

   The addition of other substances to the products of heading 0904 to 0910 (or to the mixtures referred to in paragraph (a) or (b) above) shall not affect their classification provided that the resulting mixtures retain the essential character of the goods of those headings. Otherwise such mixtures are not classified in this chapter; those constituting mixed condiments or mixed seasonings are classified in heading 2103.
2. This chapter does not cover cubeb pepper (Piper cubeba) or other products of heading 1211.

**Section notes**

1. In this section the term 'pellets' means products which have been agglomerated either directly by compression or by the addition of a binder in a proportion not exceeding 3% by weight.

► General Rules for the interpretation of goods



# සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳ යෝජනාක්‍රම

සංවර්ධනය වෙමින් පවතින රට වලට, එක්සත් රාජධානියේ DCTS මගින් සිය වෙළෙඳපොළ වෙත අඩු කළ හෝ ශූන්‍ය රේගු ගාස්තු අවසරය මත ආනයනය කිරීම සඳහා වරණීය ප්‍රවේශය සලසා දේ. මෙම යෝජනාක්‍රමය මගින් පැරණි පොදු වරණීය යෝජනාක්‍රමය (Generalized Scheme of Preferences) ප්‍රතිස්ථාපනය කර ඇත.

A3 රූපයෙහි දක්වා ඇති පරිදි, වරණීය කාණ්ඩ තුන අතරින් එකකට රටවල් වර්ගීකරණය කර ඇත. එමගින් එවැනි රටවල අපනයනකරුවන් සඳහා වන ශූන්‍ය හෝ අඩු කරන ලද රේගු ගාස්තු සහිත නිෂ්පාදන ප්‍රමාණය තීරණය කෙරෙයි. ශ්‍රී ලංකාව යනු, DCTS යෝජනාක්‍රමය යටතේ වැඩි වරණීය සත්කාර (Enhanced Preference) ලබන රටකි. අපනයනකරුවන් හට නිෂ්පාදන සම්බන්ධයෙන් 92%ක් සඳහා ශූන්‍ය රේගු ගාස්තු භුක්ති විඳීමේ හැකියාව ඇත. DCTS භාණ්ඩ කේත වලින් පිටස්තර සියලු නිෂ්පාදන වලට බ්‍රිතාන්‍ය පොදු රේගු ගාස්තු ක්‍රමය යටතේ රේගු ගාස්තුවක් අය කෙරෙනු ඇත.

## DCTS යටතේ රේගු ගාස්තු

නිෂ්පාදනයට අනුව, අපනයනකරුවන් විසින් වෙනස් වර්ගයක රේගු ගාස්තු ගෙවීම කළ යුතු විය හැකිය. උදාහරණ වශයෙන්, නැවුම් පලතුරු සහ එළවළු අපනයනකරුවන් හට, වටිනාකමට ගෙවනු ලබන රේගු ගාස්තු (ad-valorem) වලට අමතරව ආර්තව රේගු ගාස්තු (seasonal tariffs) ගෙවීමට ද සිදු විය හැකිය. DCTS යටතේ අදාළ වන එවැනි සියලුම රේගු ගාස්තු අපනයනකරුවකු විසින් හඳුනා ගන්නේ කෙසේද? විවිධ වූ, නමුත් අදාළ වන රේගු ගාස්තු වර්ග පිළිබඳ ප්‍රයෝජනවත් දළ විශ්ලේෂණයක් රේගු ගාස්තු හඳුනාගැනීම පිළිබඳ DCTS මගපෙන්වුම් ලේඛනය මගින් ලබා දේ. වැඩි විස්තර සඳහා A4 රූපයෙහි දැක්වෙන ප්‍රස්තාරික විස්තරය බලන්න.

### A4 රූපය: DCTS රටවල් වර්ගීකරණය කිරීම

| Product tariff | Comprehensive Preferences | Enhanced Preferences | Standard Preferences |
|---|---|---|---|
| Tariff free products (0%) | [illegible] | 92% | 65% |
| Products with 0% to 5% tariffs | 0.2% | 0.4% | 10% |
| Products with 5% to 10% tariffs | 0% | 0.4% | [illegible] |
| Products with more than 10% tariffs (including Specific Tariffs* | 0% | 7.2% | [illegible] |

*[illegible] product. The product unit could be weight, volume, number of items or other criteria.

### A6 රූපය: DCTS යටතේ අය කරනු ඇති විවිධ රේගු ගාස්තු

**Ad-valorem tariffs**

Most tariffs under the DCTS are ad-valorem tariffs. An ad-valorem tariff is a percentage of the value of the product. The value refers to the total customs value of the product.

For example, the tariff for white chocolate for Comprehensive and Enhanced Preference Tiers is 0%, while Standard Preferences is 4.5% of the value of the product.

**Specific tariffs**

Specific tariffs are tariffs calculated as a fixed charge on a unit of the product. The product unit could be weight, volume, number of items or other criteria.

For example, the tariff for carcasses andhalf carcases of domestic swine is £44 per 100kg.

**Compound tariffs**

Compound tariffs are a combination of ad-valorem tariffs and specific tariffs.

**Example of compound tariffs:**

| Commodity Code | Product Description | Tariff |
|---|---|---|
| 04032051 | Yoghurt, whether concentrated, flavoured or with added fruit, nuts or cocoa, sweetened, in solid forms, of a milkfat content by weight of less than or equals to 1.5% | 4.5% plus £79 per 100 kg |

In this example, the ad-valorem tariff is the 4.5% charged on the value of the product while the specific tariff is £79 per 100 kg.

**Seasonal tariffs**

Seasonal tariffs are tariffs that change depending on the time of the year.

## ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති

රටවල් විසින් ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති (ROO) භාවිත කරනු ලබන්නේ භාණ්ඩ වල ආර්ථික ජාතිකත්වය තීරණය කිරීම උදෙසා ය. නිෂ්පාදකයන් හට සිය භාණ්ඩ නිපදවනු ලන්නේ ශ්‍රී ලංකාවෙන් බව පෙන්වීමට 'සම්පූර්ණයෙන්ම ලබාගත්' රීතිය (Wholly Obtained Rule) හෝ 'ප්‍රාමාණිකව කටයුතු කළ හෝ සැකසුම් කළ' රීතිය (Sufficiently Working or Processing Rule) යන රීති දෙකෙන් එකක් යොදා ගත හැකිය. වෙනත් කිසිදු රටකින් ලබාගත් අමුද්‍රව්‍ය එකතු කිරීමකින් තොරව ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරන ලද භාණ්ඩ, 'සම්පූර්ණයෙන්ම ලබාගත්' රීතිය යටතේ 'ශ්‍රී ලංකාවේ උත්පාදනය කරන ලදී' යනුවෙන් වර්ගීකරණය කළ හැකිය.

නිෂ්පාදනය (වියළීම, මිශ්‍ර කිරීම, ඇසුරුම්කරණය, ලේබල්කරණය ආදිය) සඳහා ශ්‍රී ලංකාවට සෘජුව හෝ වක්‍රව හෝ අමු තේ දළු ආනයනය කළ ද, නිෂ්පාදන-නිශ්චිත නීතිරීති ඒවා මගින් සපුරාලයි නම්, එම නිෂ්පාදන තවදුරටත් 'ශ්‍රී ලංකාවේ උත්පාදනය කරන ලදී' යනුවෙන් වර්ගීකරණය කළ හැකිය. ROO පිළිබඳ වැඩි විස්තර දැනගැනීම සඳහා, ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති (ROO) වැඩිදුර අවබෝධ කරගැනීම පිණිස DCTS මගපෙන්වුම් ලේඛනය බලන්න.



02

# ඇමුණුම් II: ලේබල්කරණ ප්‍රමිතීන්

මහා බ්‍රිතාන්‍යයේ දී නිෂ්පාදන විකිණීම සම්බන්ධයෙන් නිෂ්පාදකයන් විසින් අනුකූල විය යුතු ප්‍රධාන ලේබල්කරණ ප්‍රමිතීන් සතරක් ඇත.

**කඩිනම් ඉඟියක්: තොරතුරු ප්‍රදර්ශනය කරන්නේ කෙසේද?**

තොරතුරු පැහැදිලි, කියැවිය හැකි සහ ඉවත් කිරීමට අපහසු (නොමැකෙන) පරිදි විය යුතු වේ. නිෂ්පාදනයේ ලේබලය මගින් නිෂ්පාදනයේ නම සහ ශුද්ධ බර (ප්‍රමාණය) පරිභෝජකයා හට එකවරම දැක ගැනීමේ හැකියාව සැලසිය යුතුය. මේ පිළිබඳ වැඩි විස්තර වෙත මෙතැනින් ප්‍රවේශ විය හැකියි.

## පරිභෝජකයන් වෙත ආහාර පිළිබඳ තොරතුරු සැපයීම

පූර්ව-ඇසුරුම් කරන ලද ආහාර නිෂ්පාදන බ්‍රිතාන්‍ය වෙළෙඳපොළෙහි විකිණීමේ දී අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු පියවරකි මෙය. පූර්ව ඇසුරුම් කරන ලද ආහාර යනු, විකිණීමට පෙර, පූර්ව ඇසුරුම් කරන ලද ඕනෑම ආහාරයක් වන අතර, ඇසුරුම විවෘත කිරීමකින් හෝ වෙනස් කිරීමකින් තොරව, ඊට කිසිදු වෙනසක් සිදු කළ නොහැකිය. නිෂ්පාදන ඇසුරුම මත හෝ ඇසුරුමට අමුණා ඇති ලේබලය මත, පහතින් දක්වා ඇති අනිවාර්ය තොරතුරු ප්‍රදර්ශනය කරන්න.

- ආහාරයේ නම;
- අඩංගු අමුද්‍රව්‍ය වල ප්‍රමාණාත්මක භාවය පිළිබඳ ප්‍රකාශනය:
- අඩංගු අමුද්‍රව්‍ය ලැයිස්තුව (ආසාත්මිකතා ඇති කළ හැකි ද්‍රව්‍ය ඇතුළුව
- ආහාරයේ බර හෝ පරිමාව (ශුද්ධ බර);
- 'Best before' හෝ 'use by' දිනය;
- ආහාර තොරතුරු සඳහා වගකිව යුතු ආහාර ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු කරන්නාගේ නම සහ ලිපිනය.

### A1 කොටුව: ප්‍රභවස්ථාන රට සහ ගබඩා කිරීමේ තොරතුරු

නිෂ්පාදනය පැමිණෙන්නේ වෙනත් ස්ථානයකින් බව වචන හෝ පින්තූර මගින් පෙන්නුම් කෙරෙයි නම්, නිෂ්පාදනයේ ප්‍රභවස්ථාන රට (COO) හෝ එහි ප්‍රභවස්ථානය ඇසුරුමෙහි දක්වන්න. ආහාරය නිෂ්පාදනය කර ඇත්තේ කුමන රටේ ද යන වග කඩධ මගින් දැක්වෙන අතර, ආහාරය නිෂ්පාදනය කරන ලද රටක් තුළ ඇති රටවල් හෝ කලාප සමූහයක් 'ප්‍රභවස්ථානය' මගින් පරිභෝජකයා වෙත දැනුම් දේ. වැඩි විස්තර සඳහා කඩධ ලේබල්කරණය පිළිබඳ මගපෙන්වුම බලන්න.

සුදුසු පරිදි ගබඩා කරන හෝ පරිභෝජනය කරන අයුරු පිළිබඳ තොරතුරු පරිභෝජකයා වෙත දැනුම් දීම පිණිස ගබඩා කිරීමේ කොන්දේසි ඇසුරුම්කරණය මගින් ලබාදෙන්න. උදාහරණ, 'ශීතකරණයේ තබා, ඇසුරුම විවෘත කිරීමෙන් දින 5ක් ඇතුළත භාවිත කරන්න' හෝ 'සිසිල් සහ වියළි තැනක ගබඩා කරන්න' යනාදි වචන නිෂ්පාදනයක දැක්වීම අවශ්‍ය විය හැකිය.

ඇසුරුම මත සඳහන් කර පරිභෝජකයන් සමග බෙදා ගැනීම අවශ්‍ය කෙරෙන තොරතුරු පිළිබඳ සවිස්තරාත්මක මගපෙන්වුම මෙතැනින් සොයා ගත හැකියි. ඒ හැරෙන්නට, ආහාර ප්‍රමිතීන් පිළිබඳ නියෝජිතායතනය විසින් දී ඇති මගපෙන්වුම මෙතැනින් සොයා ගත හැකියි.

### A2 කොටුව: අඩංගු  ද්‍රව්‍ය ලැයිස්තුව

අඩංගු සියලුම ද්‍රව්‍ය ඇසුරුම්කරණය මත දැක්වීම නිෂ්පාදකයන් විසින් කළ යුතු වේ. 'අඩංගු ද්‍රව්‍ය' යන මාතෘකාව යටතේ ලැයිස්තුව ඇතුළත් කළ යුතුයි. අඩංගු ද්‍රව්‍ය ලැයිස්තුවක් අවශ්‍ය වීමෙන් නිදහස් කළ ආහාර නිෂ්පාදන කිහිපයක් ඇත. ඔබේ නිෂ්පාදනය එසේ නිදහස් කළ එකක් දැයි මෙතැන  ක්ලික් කර බලන්න.  ඔබට තවදුරටත් ඒ ගැන අදහසක් නොමැති නම්, දේශීය වෙළෙඳ ප්‍රමිතීන් පිළිබඳ කාර්යාලය (local trading standards office) සමග සම්බන්ධ වන්න.  පහත සඳහන් දෑ පිළිබඳ නිශ්චිත තොරතුරු සැපයීම නිෂ්පාදකයන් විසින් කළ යුතු බව කරුණාවෙන් සලකන්න:
(1) පැණි-රසගැන්වීම් හෝ සීනිවර්ග; (2) ඇස්පාටේම් හෝ වර්ණගැන්වීම්; (3) ලිකුයුරයිස්; (4) කැෆෙන්; සහ
(5) පොලියොල්ස්, අදාළ නම්.

## ආහාර සංයුතිය පිළිබඳ ප්‍රමිතීන්

කිසියම් ගුණාත්මක භාවයකින් යුතු බවට හෝ අඩු-ගුණාත්මක භාවයෙන් යුතු විකල්ප ලෙසට ආදේශ කිරීමේ අවදානමක් ඇති බවට පරිභෝජකයන් විසින් අපේක්ෂා කරන ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් මෙකී ප්‍රමිතීන් අදාළ වේ.  ඇතැම් ආහාර සම්බන්ධයෙන් 'වෙන් කළ විස්තර' ('reserved descriptions') යන නාමය පවතියි.  එය යොදා ගත හැකි වන්නේ, ආහාරය සම්බන්ධයෙන් කිසියම් නියත සංයුතියක් තිබේ නම් පමණි. මේවා නම්:

- පාන් සහ පාන්පිටි;
- මේද සහ තෙල්;
- පලතුරු යුෂ, මීපැණි සහ නෙක්ටාස්;
- ජෑම් වර්ග සහ ඒ හා සමාන නිෂ්පාදන;
- මස් අඩංගු නිෂ්පාදන;
- කිරි සහ කිරි නිෂ්පාදන;
- දිය කළ හැකි කෝපි සහ චිකරි නැමැති පැළෑටි සාරය;
- සුක්‍රෝස් හෝ ග්ලූකෝස් පැණිය වැනි නිශ්චිත සීනි නිෂ්පාදන.



ඔබේ ආහාර නිෂ්පාදනයට අදාළ සංයුති අවශ්‍යතා සොයා ගැනීමට ලේබල්කරණ සහ සංයුතිය පිළිබඳ මගපෙන්වුම (Guidance on Labelling and Composition) බලන්න.



## ආහාර ලේබල්කරණය පිළිබඳ අවශ්‍යතා

බ්‍රිතාන්‍ය වෙළෙඳපොළ තුළ ආහාර නිෂ්පාදන සාර්ථකව විකිණීම සඳහා පැහැදිලි, පහසුවෙන් කියැවිය හැකි, ස්ථිර ලෙස ලියූ, පහසුවෙන් වටහා ගත හැකි, පහසුවෙන් දැකිය හැකි හා නොමග නොයවන සුලු ලෙසට ලේබල්කරණය කළ යුතු වේ. තොරතුරු සහ අඩංගු ද්‍රව්‍ය ලැයිස්තුව සැපයීමට අමතරව, නිෂ්පාදකයන් විසින් යම් යම් අවවාදයන් ද අඩංගු කළ යුතු වේ.

උදාහරණ වශයෙන්, නිෂ්පාදනයෙහි 'පැණි-රසකාරක' අඩංගු වේ නම්, 'පැණි-රසකාරකය (කාරක) සමග' යනුවෙන් අවවාදයෙහි සටහන් විය යුතු වේ. 'ඇස්පාටේම්' අඩංගු වේ නම්, 'ෆීනයිලලනීන් වර්ගයක් අඩංගුවේ' යනුවෙන් අවවාදයෙහි සටහන් විය යුතු වේ. ආහාර සහ පාන පිළිබඳ අවවාදයන් දැක ගැනීමට මෙම සබැඳිය බලන්න.

## කාබනික ආහාර ලේබල්කරණ ප්‍රමිතීන්

බ්‍රිතාන්‍ය වෙළෙඳපොළ තුළ කාබනික ආහාර නිෂ්පාදන විකිණීම සඳහා නිෂ්පාදකයන් විසින් අනුමත බ්‍රිතාන්‍ය කාබනික පාලන ආයතනයක් (approved British organic control body) මගින් සිය නිෂ්පාදන සම්බන්ධයෙන් සහතික කිරීමක් ලබා ගත යුතු වේ. ඔබේ නිෂ්පාදනය, මහා බ්‍රිතාන්‍යයේ 'කාබනික' යන නිර්වචනය යටතට ගැනෙන බව සොයා ගැනීමට ඔවුන් සමග සම්බන්ධ වන්න. ආහාර නිෂ්පාදන, කාබනික ලෙසට ලේබල් කළ හැකි වන්නේ පහත පරිදි වුවහොත් පමණි:

- ඒවා මගින් කාබනික නිෂ්පාදන නීතිරීති සපුරාලයි;
- අඩංගු කෘෂිකාර්මික ද්‍රව්‍ය වලින් අවම වශයෙන් 95%ක් කාබනික වේ;
- අනෙකුත් සියලුම අඩංගු ද්‍රව්‍ය, ආකලන සහ සැකසීම සඳහා යොදාගත් ආධාරක ලැයිස්තුගත කර ඇත්තේ කාබනික රෙගුලාසි ඇතුළත අවසර දී ඇති පරිදි වේ;
- නිෂ්පාදනය, එහි ලේබලය සහ යම් සැපයුම්කරුවන්, බ්‍රිතාන්‍ය කාබනික පාලන ආයතනයක් විසින් සහතික කර තිබේ.

බ්‍රිතාන්‍ය වෙළෙඳපොළ තුළ කාබනික නිෂ්පාදන විකිණීම සඳහා, පාලන ආයතන කේත අංකය සහ කෘෂිකාර්මික ප්‍රභවස්ථානය පිළිබඳ ප්‍රකාශනය ඇතුළත් කරන්න. කාබනික නිෂ්පාදන අපනයනය කිරීම පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට මෙම මගපෙන්වුම බලන්න.

**කඩිනම් ඉඟියක්: කාබනික ලාංඡනය යොදා ගැනීම**

මහා බ්‍රිතාන්‍ය වෙත කාබනික නිෂ්පාදන අපනයනය කරන නිෂ්පාදකයන් අනුමත බ්‍රිතාන්‍ය කාබනික පාලන ආයතනයක් සමග ලියාපදිංචි විය යුතු වේ. තමන් ලියාපදිංචි වන ආයතනය මගින් අවශ්‍ය කෙරෙන කාබනික නිෂ්පාදන ප්‍රමිතීන් අපනයනකරුවන් විසින් සපුරා ගෙන, අවශ්‍ය සහතික ලබාගත යුතු වේ.  සහතික කිරීම සමග ලබාදෙන ලාංඡනය මගින්, කාබනික බවට නිෂ්පාදකයා සිදු කරන හිමිකම් පෑම සුපැහැදිලි කරයි. පරිභෝජකයන් හට කාබනික නිෂ්පාදන හඳුනා ගැනීමේ පහසුව එකී ලාංඡනය මගින් ලබා දේ.  BDA certification, Organic Farmers and Growers CIC සහ Soil Association යනු මෙම ක්ෂේත්‍රයට සම්බන්ධව සිටින සුප්‍රසිද්ධ සහතික කරන ආයතන අතරින් කිහිපයකි. ඔවුන්ගේ ලාංඡන, බ්‍රිතාන්‍ය පරිභෝජන වෙළෙඳපොළට බොහෝ විට හුරුපුරුදු ය.

# 03 ඇමුණුම් III: ස්වෙච්ඡා තිරසර භාවය පිළිබඳ ප්‍රමිතීන්

3 වන පරිච්ඡේදයේ සඳහන් කර ඇති පරිදි, VSSs මගින් නිෂ්පාදනයේ ගුණාත්මක භාවය සහතික කෙරෙමින්, පරිභෝජකයන්ගේ අපේක්ෂා සපුරාලීමට සහය දේ. ඒ සඳහා අයදුම් කිරීමට,

නිෂ්පාදකයන් විසින් කරුණු දෙකක් පිළිබඳව දැනුවත් විය යුතු යː (1) සහතික කිරීමක් ලබා ගැනීමේ සාමාන්‍ය ක්‍රියාවලිය; සහ (2) අදාළ විය හැකි සහතික කිරීම් වර්ග කිහිපයක්.

## සහතික කිරීම් ලබාගැනීමට ගත යුතු පියවර

### 1 වන පියවර: නිවැරදි ප්‍රමිතිය හඳුනාගැනීම

විවිධ VSS සහතික කිරීම් මගින් තිරසර භාවය පිළිබඳ විවිධ පැතිකඩ ආවරණය කෙරෙයි - ආහාර සුරක්ෂිතතාව; ආර්ථික, පාරිසරික සහ සමාජයීය පැතිකඩ, ආදිය - එසේම, ඒවා භාවිත කරනු ලබන්නේ යම් යම් රටවල් විසින් පමණක් විය හැකිය. ඇතැම් අවස්ථාවන් හි දී, නිෂ්පාදක විසින් යම් යම් සහතික කිරීම් ලබාගත යුතු බව ආනයනකරු විසින් නිශ්චිතව දැක්විය හැකිය. තවත් අවස්ථාවන් හි දී, ගැනුම්කරු සමග විකුණුම් ගිවිසුම පිළිබඳ සාකච්ඡා කිරීමට පෙරාතුව, විවිධ වර්ගයේ VSS සහතික කිරීම් ගැන අපනයනකරුවන් දැනුවත්ව සිටීම සුදුසු වේ. එසේ දැනුවත් වීම පිණිස, ITC ප්‍රමිතීන් පිළිබඳ අන්තර්ජාලයෙන් ලබාගත හැකි සවිස්තරාත්මක තොරතුරු අඩංගු 'ප්‍රමිතීන් හඳුනාගන්න' සහ 'සසඳන්න' වැනි මෙවලම් යොදා ගන්න.

### 2 වන පියවර: පරතර විශ්ලේෂණයක් සිදු කිරීම

හඳුනා ගත් VSS වල දක්වා ඇති අවශ්‍යතා සහ පවතින ව්‍යාපාර පරිචයන් අතර ඇති යම් පරතරයන් හැඳින ගැනීම පිණිස 'පරතර විශ්ලේෂණය' (gap analysis) සිදු කිරීමට නිෂ්පාදකයන් කටයුතු කළ යුතු වේ. විශ්ලේෂණය මගින් පරතරයන් හඳුනා ගනු ලැබුවහොත්, ඊළඟට ගත යුතු පියවර, පිරිවැය සහ එවැනි ඊළඟට ගත යුතු පියවර ක්‍රියාවට නැංවීමේ කාලය වැනි සුදුසු ක්‍රියාමාර්ග මාලාවක් නිෂ්පාදකයන් විසින් තීරණය කළ යුතු වේ. එම ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව, 3 වන පියවර වෙත යොමු වන්න. 'පරතර විශ්ලේෂණය' මගින් කිසිදු පරතරයක් හඳුනා නොගැනුණේ නම්, නිෂ්පාදකයන් හට සෘජුව ම 3 වන පියවර වෙත යොමු විය හැකිය.





### 3 වන පියවර: සහතික කිරීම් සඳහා අයදුම් කරන්න

සහතික කිරීම් සඳහා අයදුම් කිරීමට පෙරාතුව, සහතික කිරීම් සඳහා දරන්නට වන පිරිවැය වෙන වෙන ම විමසා බැලීමට නිෂ්පාදකයා සහතික විය යුතු වේ. සාමාජික ගාස්තු, විගණන ගාස්තු (අවශ්‍ය කෙරෙන යාම්-ඊම් ගණන අනුව මෙය වෙනස් විය හැකිය), සහ සාම්පල පිරික්සීම සඳහා වන රසායනාගාර ගාස්තු, නිෂ්පාදන ප්‍රමිතිය සහ VSS සහතික කිරීම් මගින් දක්වා ඇති ප්‍රමිතීන් අතර පරතරයක් නොමැති බව සහතික කිරීමේ පිරිවැය ආදිය මෙකී පිරිවැයට ඇතුළත් වේ.

නිෂ්පාදක විසින් අදාළ පිරිවැය තෝරා බේරා ගැනීමෙන් පසු සහ, ඒ වෙනුවෙන් මුදල් වෙන් කළ පසු, සහතික කිරීම් සඳහා ඕී ආයතනයට අයදුම් කිරීමේ හැකියාව නිෂ්පාදකයන්ට ඇත. අයදුම් කිරීමෙන් අනතුරුව, නිෂ්පාදක-අයදුම්කරු විසින් වැඩ-බිම තුළ තක්සේරු කිරීමක් සඳහා විගණකවරයකු/පරීක්ෂකවරයකු හට ආරාධනය කරනු ඇත. විවිධ VSS සහතික කිරීම් සම්බන්ධයෙන්, මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන එක් එක් රටෙහි බලයලත් හෝ අනුමැතිය ලත් විවිධාකාර විගණකවරු සිටියි

උදාහරණ වශයෙන්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, බියුරෝ වෙරිටාස් ශ්‍රී ලංකා සහ SGS ශ්‍රී ලංකා යනු ISO 22000 අනුමැතිය ලත් ශ්‍රී ලංකාවේ විගණකවරුන්ගෙන් සමහරෙකි. ISO සහතික කිරීම් ලබා ගැනීමට අදහස් කරන නිෂ්පාදකයන් විසින් එවැනි අනුමත විගණකවරුන්ගෙන් කෙනෙකු හා සම්බන්ධ විය යුතු වේ.

### 4 වන පියවර: පරීක්ෂාව සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම්

අනතුරුව, නිෂ්පාදකයන් විසින් විගණනයක් සඳහා කටයුතු සූදානම් කළ යුතු අතර, එහිදී ආහාර කළමනාකරණ පද්ධතිය පරීක්ෂා කරනු ඇති විගණකවරයකු විසින් වැඩබිම-තුළම නිෂ්පාදන ඒකකය තක්සේරු කිරීමක් සිදු කරනු ඇති අතර, ඉන් පසුව, ඒ අනුව විගණන වාර්තාවක් නිකුත් කරනු ඇත.

නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම් ද විගණක-වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි අතර, වත්මන් ව්‍යාපාර පරිචයන් සහ VSS සහතික කිරීමේ යටතේ අවශ්‍ය කෙරෙන ප්‍රමිතීන් අතර පවතින පරතරයන් නිවැරදි කිරීම පිණිස නිෂ්පාදකයා විසින් ගත යුතු පියවර එමගින් විස්තර කෙරෙනු ඇත. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම් ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව, පරතරයන් සම්බන්ධයෙන් නිවැරදි අන්දමින් නිසි කටයුතු සිදු කර ඇති බව සහතික කිරීම පිණිස නව විගණනයක් පවත්වනු ඇත.

විගණන වාර්තාවෙහි අපැහැදිලි ඡේද අඩංගු වේ නම්, විගණකවරයා වෙතින් පැහැදිලි කිරීම් ඉල්ලා සිටින බවට සහතික වන්න. අපැහැදිලි තීරණයක් නිකුත් කරනු ලැබුවහොත්, පැහැදිලි කිරීම් ඉල්ලා සිට, අවශ්‍ය නම් තීරණය සම්බන්ධයෙන් නැවත අයැද සිටින්න.

### 5 වන පියවර: සහතික කිරීම්, අධීක්ෂණය කිරීම සහ අලුත් කිරීම

විගණනය සම්පූර්ණ කළ පසු සහ ක්‍රියාවට නැංවීමට නියමිතව පවතින නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ඉල්ලීම් තවදුරටත් නොමැති වූ විට, සහතික කිරීම නිකුත් කරනු ලබයි. සහතික ලත් නිෂ්පාදකයා අඛණ්ඩව, අදාළ අවශ්‍යතාවන්ට අනුකූල වන බව සහතික කිරීම පිණිස, ඕී සහතික කිරීම් යටතේ දක්වා ඇති අවශ්‍යතාවන් අනුව, වැඩබිම-තුළ හෝ පවත්නා දත්ත මත පදනම්ව (On-site or desk-based) හෝ සත්‍යාපනය කිරීමේ විගණන වුවද සිදු කළ හැකිය.

එක් එක් සහතික කිරීම සම්බන්ධයෙන් වන වලංගු කාලසීමාවන් විවිධ වන අතර, ඒ එක් එක් සහතික කිරීම ඒ අනුව අලුත් කළ යුතු වේ. ලබාගත් සහතික කිරීමට අදාළ වෙබ් අඩවිය නිෂ්පාදකයන් විසින් පිරික්සා බැලිය යුත්තේ, අලුත් කිරීමේ ඊළඟ දිනය දැන ගැනීම සහ ඒ අනුව සැලසුම් කිරීම පිණිස ය.



# අදාළ සහතික කිරීම්

## ISO 22000

ISO 22000 යනු, ISO හි ආහාර සුරක්ෂිතතා කළමනාකරණ ප්‍රමිතීන් ය. ආහාර සුරක්ෂිතතා උවදුරු හඳුනාගෙන පාලනය කිරීමට ඒවා උපකාරී වේ. ගෝලීය ආහාර සැපයුම්දාමය තුළ ආහාර පරිභෝජනයට සුරක්ෂිතව බව මෙම සහතිකය මගින් වැඩිදුර සහතිකයක් සපයයි. මනා නිෂ්පාදන පිළිවෙත්, උවදුරු විශ්ලේෂණ සහ දැඩි පාලනයෙන් යුතු අවස්ථා සහ වෙනත් වළක්වාලිය හැකි පියවර එමගින් එකට එක් කරයි.

සහතික කිරීමක් ලබාගන්නේ කෙසේද? ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හරහා සහතික කිරීමක් ලබාගන්න. අයදුම්පත බාගත කරගෙන, ISO 22000 ප්‍රමිතීන් සපුරාලීම සඳහා වන සියලුම අවශ්‍යතා වලට ඔබ අනුකූල වන බවට සහතික වන්න.

## ආහාර සුරක්ෂිතතා පද්ධති සහතික කිරීම් (FSSC) 22000

FSSC 22000 යනු, ගෝලීය ආහාර සුරක්ෂිතතා වැඩපිළිවෙල මගින් පිළිගැනීමට ලක් කර ඇති ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් වේ. එසේම, ඒවා පදනම් ව ඇත්තේ පවත්නා ISO ප්‍රමිතීන් මත ය. ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් සහ ක්‍රියාවලි සහතික කිරීම පිණිස, ආහාර නිෂ්පාදනකර්මාන්තයේ සහ ආශ්‍රිත සැපයුම් දාම වල භාවිතකළ හැකි කාර්යරාමුවක් FSSC මගින් සපයනු ලබයි. වැඩි විස්තර සඳහා මෙම මගපෙන්වුම් ලේඛනය: ආහාර සුරක්ෂිතතාව සහ තත්ත්ව සංස්කෘතිය බලන්න.

සහතික කිරීමක් ලබාගන්නේ කෙසේද? FSSC 22000 සහතික කිරීමක් ලබාගැනීමට මෙම පියවරින්-පියවර මගපෙන්වුම අනුගමනය කරන්න. සහතික කිරීමක් ලබාගැනීමට, Bureau Veritas Sri Lanka, SGS Sri Lanka වැනි FSSC බලයලත් ආයතනයක් සොයා ගන්න.



## ආහාර සුරක්ෂිතතා පද්ධති සහතික කිරීම් (FSSC) 22000

BRCGS යනු, ආහාර සුරක්ෂිතතාව, ඇසුරුම්කරණ ද්‍රව්‍ය, ගබඩා කිරීම සහ බෙදා හැරීම ආදිය සම්බන්ධයෙන් වන ප්‍රමිතීන් මාලාවකි. ඒවා, මනා නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ සාක්ෂි වන අතර, ආහාර නිෂ්පාදන සුරක්ෂිත බව, නීත්‍යානුකූල බව සහ ගුණාත්මක භාවයෙන් ඉහළ බව පරිභෝජකයන් හට සහතික කරයි. බ්‍රිතාන්‍ය වෙළෙඳපොළ වෙත නිෂ්පාදන විකිණීමේ දී ඒවා විශේෂයෙන්ම අදාළ වේ. BRCGS යනු, ගෝලීය ආහාර සුරක්ෂිතතා වැඩපිළිවෙළ යෝජනාක්‍රමයක් වන අතර, එය ජාත්‍යන්තර වශයෙන් පුළුල් පිළිගැනීමකට ලක් වූවකි. BRCGS ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් පිළිබඳ වැඩි විස්තර මෙතැනින් කියවන්න.

සහතික කිරීමක් ලබාගන්නේ කෙසේද? සහතික කිරීමේ ක්‍රියාවලිය වටහා ගැනීමේ පියවරින්-පියවර මගපෙන්වුම මෙතැනින් ලබාගත හැකියි. BRCGS සහතිකයක් ලබාගත හැක්කේ, BRCGS අනුමැතිය ලත් සහතික කිරීමේ ආයතනයක් වෙතින් පමණි. ශ්‍රී ලංකාව තුළ සිටින, අනුමැතිය ලත් සමාගම් සියල්ල පිළිබඳ ලැයිස්තුවක් ඊසෘඩී නාමාවලිය හි ඇත. 'Certification Body' මත ක්ලික් කර, ඊළඟට, රට වශයෙන් 'Sri Lanka'තෝරන්න. එවිට, ශ්‍රී ලංකාවේ සිටින අනුමැතිය ලත් සහතික කිරීමේ ආයතන සියල්ලෙහිම නම් සහ ඒවා සමග සම්බන්ධ වීමේ විස්තර නාමාවලිය මගින් පෙන්නුම් කරනු ඇත. BRCGS ප්‍රමිතීන් සපුරාලීම උදෙසා නිෂ්පාදකයන් හට පුහුණුව ලැබීමේ හැකියාව ද පවතියි.

## ෆෙයාට්‍රේඩ් ඉන්ටර්නැෂනල්

Fairtrade International සහතිකය ගෝලීය පිළිගැනීමට ලක් වූවක් වන අතර, එහි මූලික අවධානය යොමු කර ඇත්තේ නිෂ්පාදකයන් සහ පරිභෝජකයන් එකිනෙකා සමග සම්බන්ධ කිරීම වෙත ය. එමගින්, සාධාරණ වෙළෙඳ කොන්දේසි නියෝජනය කෙරෙන අතර, නිෂ්පාදකයන් විසින් Fairtrade සමාජයීය, පාරිසරික සහ ආර්ථික ප්‍රමිතීන් සපුරා ඇති බව පරිභෝජකයන් වෙත සහතික කෙරෙයි. නිෂ්පාදකයකු වශයෙන්, අවම මිලක් සහ ඉහළ තත්ත්වයක් ඔබේ නිෂ්පාදනයට ලබාගැනීමේ හැකියාව මෙන්ම, නිෂ්පාදක ජාලයන් සහ සංවිධාන වෙත ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව ද ඔබට හිමි වේ.

සහතික කිරීමක් ලබාගන්නේ කෙසේද? මෙම සහතික කිරීමේ කාර්යපටිපාටිය සිදු කෙරෙනුයේ FLOCERT හරහා ය. අයදුම් කිරීමට පෙරාතුව, ඔබ සියලු නිර්ණායකයන් සමග අනුකූල දැයි පිරික්සා බලන්න. පියවරින් පියවර කාර්ය පටිපාටිය මෙතැනින් ලබාගත හැකියි.

## ඉන්ටර්නැෂනල් ෆීචර්ඩ් ස්ටෑන්ඩර්ඩ් - IFS

IFS විසින් සමාලෝචනය කරනු ලබන්නේ, නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලීන් ය. එහිදී, නීතිමය අවශ්‍යතා සහ පාරිභෝගික පිරිවිතරයන්ට අනුව නිෂ්පාදකයා හට සිය නිෂ්පාදන ආරක්ෂිත, අව්‍යාජ සහ ගුණාත්මක භාවයෙන් යුතුව නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී දැයි තක්සේරු කෙරෙයි. එය විශේෂයෙන්ම ප්‍රයෝජනවත් වන්නේ පුද්ගලික ලේබල භාවිත කරන නිෂ්පාදකයන් හටයි. ආහාර නිෂ්පාදකයා විසින් යොදා ගනු ලැබූ පුද්ගලික ලේබල හෝ ප්‍රමිතීන් පාරිභෝගික පිරිවිතරයන්ට අනුකූල බවට IFS සහතිකය පෙන්නුම් කරයි. එය, ගෝලීය ආහාර සුරක්ෂිතතා වැඩපිළිවෙළෙ හි පිළිගැනීමට ලක් වූවකි.

සහතික කිරීමක් ලබාගන්නේ කෙසේද? IFS සහතිකයක් ලබාගැනීමේ මාර්ගය මෙතැනින් ලබාගත හැකියි. IFS ප්‍රමිතීන් සපුරාලීම පිණිස, නිෂ්පාදකයන් හට IFS ඇකඩමිය හි දී පුහුණුව ලබාගත හැකිය. විගණනයක් සිදු කිරීමට සහ සහතික කිරීමක් ලබාගැනීම පිණිස, SGS Sri Lanka වැනි IFS සහතික කිරීමේ ආයතන සමග සම්බන්ධ වන්න.

04

# ඇමුණුම් IV: රේගු කාර්යපටිපාටි සහ ආශ්‍රිත ලේඛන

4 වන පරිච්ඡේදය හි දක්වා ඇති පරිදි, බාධාවකින් තොරව නිෂ්පාදන රේගුව හරහා යන බව සහතික කරගැනීම පිණිස, අපනයනකරුවන් රේගු කාර්යපටිපාටි සහ අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන පිළිබඳව හොඳින් දැන සිටිය යුතු වේ. අවශ්‍ය ලේඛන කිහිපයක් පහතින් පැහැදිලි කර ඇත:

## වාණිජ ඉන්වොයිසිය

වාණිජ ඉන්වොයිසිය යනු, ජාත්‍යන්තර නැව්ගත කිරීමක දී අපනයන සහ ආනයන නිෂ්කාශන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය කරන ලේඛනයකි. එහි පහත තොරතුරු අඩංගු වේ.

- විකුණුම්කරු, ගැනුම්කරු සහ අවසන් ලැබුම්කරුගේ (එය ගැනුම්කරුගෙන් වෙනස් වේ නම්) සම්පූර්ණ නම, ලිපිනය සහ සම්බන්ධ විය හැකි ආකාරයන් පිළිබඳ තොරතුරු;
- වාණිජ ඉන්වොයිසි අංකය සහ නිකුත් කළ දිනය;
- මිලදී ගැනීමේ ඇණවුම (ඡමරජයිෑ දරාැර) හෝ නාමමාත්‍ර ඉන්වොයිසි (චරදදෙරප් සබඩදසජැ) අංකය සහ නිකුත් කළ දිනය (විශේෂයෙන්ම, එකම ගිවිසුම යටතේ බහුවිධ ඇණවුම් එහි තිබේ නම්);
- HS කේතය, නිෂ්පාදනයෙහි විස්තරය, ජාත්‍යන්තර වාණිජ නීතිරීති, භාණ්ඩ වල ප්‍රභවස්ථාන රට;
- ප්‍රවාහන මාර්ගය සහ භාණ්ඩ වල වටිනාකම.

**කඩිනම් ඉඟියක්: විනිමය අනුපාතික උච්චාවචනයන් සැලකිල්ලට ගන්න**

විනිමය අනුපාතිකයන් උච්චාවචනය වීම් වලින් ඔබ ආරක්ෂ වීම සඳහා පහත ඉඟි ගැන සැලකිල්ලට ගන්න:

- ගෙවීම් සිදු කරන දිනට අදාළ විනිමය අනුපාතිකය භාවිත කරන්න, හෝ විදේශ විනිමය ගිණුමක් වෙත විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම ලබාගන්න.
- අමතර ගාස්තුවක් ඇතුළත් කිරීම මගින්, මිල උච්චාවචනයන් සැලකිල්ලට ගැනීමට සහ විය හැකි පාඩු ආවරණය කිරීමට කටයුතු කරන්න.
- ඔබේ බැංකු කළමනාකරු හෝ පළපුරුද්ද සහිත වෘත්තිකයකු සමග කථා කරන්න.

## ඇසුරුම් ලැයිස්තුව

නැව්බඩු තොගයෙහි ඇති එක් එක් පැකේජය පිළිබඳ නිශ්චිත තොරතුරු දැක්වෙන ලේඛනයකි මෙය. අපනයනකරු විසින් සකසනු ලබන, ඇසුරුම් ලැයිස්තුවෙහි නැව්බඩු තොගය සම්බන්ධයෙන් වන පහත දක්වා ඇති තොරතුරු ආදී සවිස්තරාත්මක තොරතුරු අඩංගු වේ:

- නිෂ්පාදන විස්තරය;
- ඒකක සංඛ්‍යාව සහ සමස්ත බර;
- ඇසුරුම්කරණ උපදෙස්;
- භාවිත කළ ඇසිරුම්කරණ වර්ගය, ප්ලාස්ටික් කැබලි අතුරුඳ ඇසිරුවේ ද නැති නම් පෙට්ටි වල ඇසිරුවේද, එහි දිග, පළල යනාදී විස්තර සහ ඇසුරුම් වල ඇති සලකුණු ආදිය;
- විකුණුම්කරු සහ ගැනුම්කරු පිළිබඳ සඳහන් කිරීම්.

**කඩිනම් ඉඟියක්: ව්‍යාකූලතා මගහරවා ගන්න**

ඇසුරුම් ලැයිස්තුව යනු වාණිජ ඉන්වොයිසියට සමාන එකක් නොවේ. ඔබේ නිෂ්පාදන සාර්ථකව අපනයනය කිරීමට මෙම ලේඛන දෙක ම අත්‍යවශ්‍ය වේ.

අනෙකුත් සෑම ලේඛන වල මෙන්ම, ගැනුම්කරු, විකුණුම්කරු සහ ප්‍රවාහනකරු පිළිබඳ සඳහන් කිරීම් එහි අඩංගු විය යුතු වේ. ආනයන/අපනයන භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් (Freight forwarders) හෝ නැව්ගත කරන්නන් (Shippers) විසින් නෞභාර බිල්පත (bill of lading) සැකසීමට, ඇසුරුම් ලැයිස්තුව භාවිත කරයි.

## ප්‍රභවස්ථානය ඔප්පු කිරීම

1 වන පරිච්ඡේදය හි පැහැදිලි කළ පරිදි, DCTS යටතේ වරණීය රේගු ගාස්තු අනුපාතික සඳහා හිමිකම් පෑමට ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් ඔවුන්ගේ භාණ්ඩ වල ප්‍රභවස්ථානය, ශ්‍රී ලංකාව බවට ඔප්පු කළ යුතු වේ. පහත දක්වා ඇති ප්‍රභවස්ථාන ඔප්පු කිරීමේ වර්ග වලින් එකක් අපනයනකරුවන් හට ඉදිරිපත් කළ හැකිය:

- A පෝරමය;
- ප්‍රභවස්ථාන ප්‍රකාශනය

ප්‍රභවස්ථානය ඔප්පු කිරීම, භාණ්ඩ පිළිබඳ තනි නැව් ගත කිරීමක් ආරම්භ කරන විට අදාළ වේ. එය, පහත පරිදි වන එක සමාන භාණ්ඩ නැව්ගත කිරීම් කිහිපයක දී වුවද අදාළ විය හැකියි: (1) එකම විකුණුම් ගිවිසුම යටතේ ආනයනය කළ; (2) එකම භාණ්ඩ කේතය සහිත වූ; (3) එකම අපනයනකරු විසින් එකම ආනයනකරු වෙත විශේෂිතව විකුණන ලද සහ මහා බ්‍රිතාන්‍යයේ එකම රේගු කාර්යාලයේ පිවිසුම් විධික්‍රම වලට විෂය වූ; හෝ (4) නිරන්තර කාර්යරාමුවක් ඇතුළත සහ මාස 12 නොඉක්මවූ සැලකිය යුතු වාණිජ වටිනාකමකින් යුතු අඛණ්ඩ වෙළෙඳ ප්‍රවාහයක් සහිතව ආනයනය කරන ලද. ප්‍රභවස්ථානය ඔප්පු කිරීම පිළිබඳ වැඩි විස්තර දැන ගැනීමට, වරණීය වෙළෙඳ නීතිරීති යටතේ හිමිකම් පෑම් පිළිබඳ ෘකෂී මගපෙන්වුම බලන්න.

### A3 කොටුව: ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති වලට අනුකූල බව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන

බ්‍රිතාන්‍ය අධිකාරීන් වෙත සෘධධ ඔප්පු කිරීම පිණිස අපනයනකරුවන් විසින් පහත ලේඛන පවත්වා ගැනීම සහ සැපයීම කළ යුතු වේ.

- භාණ්ඩ වල නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත ලේඛන
- භාණ්ඩ නිෂ්පාදනයේ දී යොදා ගත් කොටස්/ද්‍රව්‍ය මිලදී ගැනීම ආශ්‍රිත පිරිවැය පිළිබඳ සාක්ෂිමය ලේඛන
- භාණ්ඩ සහ කොටස්/ද්‍රව්‍ය වල උත්පාදිත තත්ත්වය පෙන්නුම් කෙරෙන ලේඛන
- අදාළ තන් හි දී නිෂ්පාදනයේ කලාපීය වටිනාකම් අන්තර්ගතය තීරණය කිරීමෙහි සාක්ෂි

## ප්‍රභවස්ථාන ප්‍රකාශනය

ප්‍රභවස්ථාන ප්‍රකාශනයක්, 'ඉන්වොයිසි ප්‍රකාශනයක්' හෝ 'ප්‍රභවස්ථානය පිළිබඳ ප්‍රකාශනයක්' යනුවෙන් ද හැඳින්වේ. ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් ප්‍රභවස්ථාන ප්‍රකාශනයක් සැපයිය යුතු වේ. එය වාණිජ ඉන්වොයිසියක්, ඇසුරුම් ලැයිස්තුවක් හෝ භාණ්ඩ භාරදීමේ ලේඛනයක් (delivery note) වැනි වාණිජ ලේඛනයක සකසන ලද්දක් විය යුතු වේ. මෙම මගපෙන්වුම හි 2 වන වගන්තියෙහි දක්වා ඇති තොරතුරු එහි අඩංගු වීම අත්‍යවශ්‍ය වන අතර, 5 කොටුවෙහි දී ඇති 'ප්‍රභවස්ථාන ප්‍රකාශන වචන' ඊට ඇතුළත් විය යුතු වේ. ප්‍රභවස්ථාන ප්‍රකාශනය ඉංග්‍රිසි භාෂාවෙන් ලිවිය යුතු වන අතර, එහි අපනයනකරුගේ අත්සන ඇතුළත් විය යුතු වේ. එසේම, එය අපනයනකරු වෙතින් ආනයනකරු වෙත ඉලෙක්ට්‍රොනිකව යැවිය යුතු වේ. එකී ප්‍රභවස්ථාන ප්‍රකාශනය වසර දෙකක කාලයක් සඳහා වලංගු වන අතර, එකී වසර දෙකක කාලය ඇතුළත මහරජුගේ ආදායම් සහ රේගුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. ව්‍යාතිරේක තත්ත්වයන් පවතියි නම්, වසර දෙකකට පසුව වුවද එය පිළිගනු ලැබිය හැකි වේ.

### A5 කොටුව: ප්‍රභවස්ථාන ප්‍රකාශනය සැකසීමේ කොන්දේසි

- වරණීය රේගු ගාස්තු සඳහා සුදුසුකම් ලබන භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හා සැපයීමේ සුදුසු වාණිජ ගිණුම් වාර්තා පවත්වාගෙන යන්න.
- අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන හෝ නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් වෙතින් භාණ්ඩ වල ප්‍රභවස්ථානය දැක්වෙන අවශ්‍ය අනෙකුත් සියලුම ලේඛන හෝ ලිඛිත ප්‍රකාශන ශ්‍රී ලංකා රේගුව වෙත හෝ වෙනත් ඕනෑම අධිකාරියක් වෙත සැපයීමට සූදානමින් සිටින්න.

### A7 කොටුව: ප්‍රභවස්ථාන ප්‍රකාශන වචනි

වාණිජ ඉන්වොයිසියේ හෝ ඇසුරුම් ලැයිස්තුවේ ඇතුළත් කිරීම සඳහා

මෙම ලේඛනය මගින් ආවරණය වන නිෂ්පාදන වල අපනයනකරු (EORI අංකය ඇතුළත් කරන්න) ප්‍රකාශ කර සිටින්නේ, අන්‍යාකාරයකින් පැහැදිලිව දක්වා නොමැති නම් මිස, මෙකී නිෂ්පාදන යනු (භාණ්ඩ වල ප්‍රභවස්ථානය ඇතුළත් කරන්න) එක්සත් රාජධානියේ DCTS හි ප්‍රභවස්ථානය පිළිබඳ නීතිරීති වලට අනුව වරණීය ප්‍රභවස්ථාන වෙතින් සහ, සපුරාලන ලද ප්‍රභවස්ථාන නිර්ණායකයන් වන්නේ {සම්පූර්ණයෙන් ලබාගත් නිෂ්පාදනː 'P' අකුර ඇතුළත් කරන්න; ප්‍රාමාණිකව සැකසූ නිෂ්පාදනː 'W' අකුර ඇතුළත් කරන්න, ඉන් පසු, HS ශීර්ෂය යොදන්න (උදාහරණ 'W' 9618)} බවයි.

.................................... ☐☐ ☐☐ ☐☐☐☐

{ස්ථානය සහ දිනය (ලේඛනයෙහි එය ඇතුළත් කර ඇත්නම්, මෙය සඳහන් කළ යුතු නැත)}

..............................................................................................

(අපනයනකරුගේ නම සහ අත්සන)



## A පෝරමය

ඉහත දක්වා ඇති පරිදි, ප්‍රභවස්ථානය ඔප්පු කර පෙන්වීමට, විකල්පයක් වශයෙන් ශ්‍රී ලාංකික අපයනයකරුවන් හට A පෝරමය සම්පූර්ණ කර ඉදිරිපත් කළ හැකිය. අනුක්‍රමික අංකයක් හෝ වාණිජ ඉන්වොයිසියට යොමුවක් හෝ A පෝරමයෙහි අඩංගු විය යුතු අතර, වඩාත්ම වැදගත් කාරණයක් වන්නේ, එය ශ්‍රී ලාංකික අධිකාරියක් විසින් අත්සන් තැබීම හෝ මුද්‍රා තැබීම හෝ අවශ්‍ය නොවීම ය. A පෝරමය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය රජය විසින් සපයා ඇති මගපෙන්වුම බලන්න.

### ආර්ථික මෙහෙයුම්කරුවන්ගේ ලියාපදිංචිය සහ අනන්‍යතා අංකය

මහා බ්‍රිතාන්‍ය වෙත භාණ්ඩ ආනයනය කිරීම සඳහා සහ බ්‍රිතාන්‍ය දේශසීමාවට භාණ්ඩ පැමිණි විට රේගු ප්‍රකාශනයක් සිදු කිරීම සඳහා EORI අංකයක් අවශ්‍ය වේ. මහා බ්‍රිතාන්‍ය-පදනම් කරගත් ආනයනකරුවන් සාමාන්‍යයෙන් EORI අංකයක් සඳහා අයදුම් කර, එය ලබා ගනියි. ඍජු අපනයන සහ විකුණුම් සම්බන්ධයෙන් වනවිට, වෙළෙන්දන් හට EORI අංකයක් ලබාගැනීම පිණිස සහ රේගු බලධාරීන් හා සම්බන්ධ වීම පිණිස මහා බ්‍රිතාන්‍යයේ සංස්ථාපිත රේගු නියෝජිතයන් හෝ තැරැව්කරුවන් කුලියට ලබාගත හැකි වේ.

### නැව්ගත කිරීමේ සටහන

වරාය වෙත භාණ්ඩ ප්‍රවාහනය කිරීමට පෙරාතුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය අංශය වෙත වරාය ගාස්තු ගෙවීම අපනයනකරු විසින් කළ යුතු වේ. මෙකී ගාස්තු ගෙවීම සඳහා, අපනයනකරු විසින් නැව්බඩු තොගය පිළිබඳ විස්තරය නැව්ගත කිරීමේ සටහන - (EXP 3a) හි පුරවා, එසේ සම්පූර්ණ කරන ලද එම සටහනෙහි පිටපත් තුන මෙම අංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ. ගාස්තු ගෙවීමෙන් අනතුරුව, පෙර කී පිටපත් තුනෙන් එකක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රඳවා ගනු ලබන අතර, වාර්තා තබා ගැනීමේ කාර්යය උදෙසා ඉතිරි පිටපත් දෙක අපනයනකරු වෙත ලබා දේ. එම පිටපත් දෙක හැඳින්වෙන්නේ, ගාස්තු ගෙවන ලද නැව්ගත කිරීමේ සටහන් වල පිටපත් වශයෙනි.

### නැව්බඩු යැවීමේ සටහන

නැව්බඩු යැවීමේ සටහන - (EXP 3b) හි නැව්බඩු තොගය ආශ්‍රිත සියලුම තොරතුරු, එනම්, එහි විස්තරය, ප්‍රමාණය, පැටවීමේ බහලුම, පැටවීමේ වරාය, නිදහස් කිරීමේ වරාය ආදිය අඩංගු වේ. අපනයනකරු විසින් සැකසිය යුතු එම සටහන, නැව්බඩු යැවීමේ අනුමැතිය ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වේ.




05

# ඇමුණුම් V: ප්‍රවාහන සහ සැපයුම්

## නෞභාර බිල්පතක උදාහරණයක්


A8 රූපය: නෞභාර බිල්පතක සාම්පලයක්



Date:
BILL OF LADING
Page 1 of ______
SHIP FROM
Name:
Address:
City/State/Zip:
SID#:
FOB: ☐
Bill of Lading Number: ______
BAR CODE SPACE
SHIP TO
Name:
Location #:
Address:
City/State/Zip:
CID#:
FOB: ☐
CARRIER NAME:
Trailer number:
Seal number(s):
SCAC:
Pro number:
BAR CODE SPACE
THIRD PARTY FREIGHT CHARGES BILL TO:
Name:
Address:
City/State/Zip:
SPECIAL INSTRUCTIONS:
Freight Charge Terms: (freight charges are prepaid unless marked otherwise)
Prepaid ______ Collect ______ 3rd Party ______
☐ Master Bill of Lading: with attached underlying Bills of Lading
CUSTOMER ORDER INFORMATION
CUSTOMER ORDER NUMBER | # PKGS | WEIGHT | PALLET/SLIP | ADDITIONAL SHIPPER INFO
GRAND TOTAL
CARRIER INFORMATION
HANDLING UNIT | PACKAGE | WEIGHT | H.M. (X) | COMMODITY DESCRIPTION | LTL ONLY
QTY | TYPE | QTY | TYPE | | | | NMFC # | CLASS
RECEIVING STAMP SPACE
GRAND TOTAL
COD Amount: $ ______
Fee Terms: Collect: ☐ Prepaid: ☐
Customer check acceptable: ☐
NOTE Liability Limitation for loss or damage in this shipment may be applicable. See 49 U.S.C. - 14706(c)(1)(A) and (B).
Shipper Signature
SHIPPER SIGNATURE / DATE
Trailer Loaded:
☐ By Shipper
☐ By Driver
Freight Counted:
☐ By Shipper
☐ By Driver/pallets said to contain
☐ By Driver/Pieces
CARRIER SIGNATURE / PICKUP DATE

# ගුවන් මාර්ග බිල්පතක උදාහරණයක්

A10 රූපය: ගුවන් මාර්ග බිල්පතක සාම්පලයක්



Shipper's Name and Address
Shipper's Account Number
Not negotiable
**Air Waybill**
(Air Consignment note)
issued by
Copies 1,2 and 3 of this Air Waybill are originals and have the same validity
Consignee's Name and Address
Consignee's Account Number
It is agreed that the goods described herein are accepted in apparent good order and condition (except as noted) for carriage SUBJECT TO THE CONDITIONS OF CONTRACT ON THE REVERSE HEREOF. ALL GOODS MAY BE CARRIED BY ANY OTHER MEANS INCLUDING ROAD OR ANY OTHER CARRIER UNLESS SPECIFIC CONTRARY INSTRUCTIONS ARE GIVEN HEREON BY THE SHIPPER, AND SHIPPER AGREES THAT THE SHIPMENT MAY BE CARRIED VIA INTERMEDIATE STOPPING PLACES WHICH THE CARRIER DEEMS APPROPRIATE. THE SHIPPER'S ATTENTION IS DRAWN TO THE NOTICE CONCERNING CARRIER'S LIMITATION OF LIABILITY. Shipper may increase such limitation of liability by declaring a higher value for carriage and paying a supplemental charge if required.
Issuing Carrier's Agent Name and City
Accouting Information
Agent's IATA Code
Account No.
Airport of Departure (Addr. of First Carrier) and Requested Routing
Reference Number
Optional Shipping Information
To | By First Carrier | Routing and Destination | To | By | To | By
Currency | CHGS Code | WT/VAL | Other | Declared Value for Carriage | Declared Value for Customs
PPD | COLL | PPD | COLL
Airport of Destination | Flight/Date | For Carrier Use Only | Flight/Date | Amount of Insurance
INSURANCE - If Carrier offers insurance, and such insurance is requested in accordance with the conditions thereof, indicate amount to be insured in figures in box marked "Amount of Insurance"
Handling information
(For U.S.A. use only) These commodities, technology or software were exported from the United States in accordance with the Export Administration Regulations. Diversion contrary to USA law prohibited
SCI
No of Pieces RCP | Gross Weight | kg lb | Rate Class / Commodity Item No. | Chargeable Weight | Rate / Charge | Total | Nature and Quantity of Goods (incl. Dimensions or Volume)
Prepaid | Weight Charge | Collect
Other Charges
Valuation Charge
Tax
Total Other Charges Due Agent
Shipper certifies that the particulars on the face hereof are correct and that insofar as any part of the consignment contains dangerous goods, such part is properly described by name and is in proper condition for carriage by according to the applicable Dangerous Goods Regulations.
Total Other Charges Due Carrier
Signature of Shipper or his Agent
Total Prepaid | Total Collect
Currency Convertion Rates | CC Charges in Dest. Currency
Executed on (date) | at (place) | Signature of issuing Carier or its Agent
For Carrier's Use only at Destination | Charges at Destination | Total Collect Charges

# #SheTrades

*Her success. Our future.*

The International Trade Centre's SheTrades Initiative is a global movement to unlock women's full economic potential through trade.

By working with governments, business support organizations, the private sector, and women producers and entrepreneurs, we create the right capacities and conditions for sustainable impact at scale.